ගරු කථානායකතුමනි, උපාධිධාරීන්ගේ ප්‍රශ්නය ගැන ටිකක් කල්පනා කර බලමු. අපි කොයි තරම් අභාග්‍ය සම්පන්න තත්ත්වයකටද පත් වී සිටින්නෙ. ඉගෙන ගන්න මොළවලින් අපි ප්‍රයෝජන නොගන්නෙ ඇයි? 1968 අගෝස්තු මාසයේදී මේ ආණ්ඩුව ගැසට් නිවේදනයක් නිකුත් කළා, ශිෂ්‍ය ගුරු පත්වීම් දෙනවා කියා. ඇයි මේ මොහොත වනතුරු ඒ්වා නුදුන්නේ? ඉංග්‍රීසි ගුරු පත්වීම් දෙන වාය කියා 1969 දී තීරණය කළා. මේ මොහොත වනතුරු නුදුන්නෙ ඇයි? දැන් කියනවා, දාහක් බදවා ගන්නවලු. ඊයේ "උදය" පත්‍රයේ තිබුණා, 2000 ක් ගන්නවා කියා. ඔය ඇත්තෙ බොරුද කරන්නෙ? ගන්නවද, නැද්ද කියා කෙළින්ම කියන්න. 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබුණු අවස්ථාවේ විශ්ව විද්‍යාලවලින් සමත්වුණු සෑම උපාධිධරයෙකුටම අපි රක්ෂා දුන්නා.

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

නැහැ.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

මොකද නැහැ කියන්නෙ අපි ඔවුන්ට රක්ෂා දුන්නා. ඒ බව හැමෝම දන්නවා. විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණොත් උපාධිය ලැබුණත්, නැතත් රු. 112 පඩිය ලැබෙනවාය, උපාධිධරයෙකු වුණාට පසුව රු. 225 පඩිය ලැබෙනවාය කියන විශ්වාසයක් ඒ කාලයේ ගැමියන් අතර පවා තිබුණා. අද තත්ත්වය කොහොමද? පසුගිය අවුරුදු 4 තුළදී මේ ආණ්ඩුව ලොකු ප්‍රචාරයක් ගෙන ගියා, "ඉගෙන ගන්නට එපා කවදාවත් එයින් දියුණුවක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා දැන් තියාම කුඹුරට බැහැපල්ලා" කියා. අධ්‍යාපන ඇමතිතුමාගේ කටින්ම පිට වුණේ කුමක්ද? "ධීවර කාර්මිකයාගේ පුතා ධීවර කාර්මිකයකු විය යුතුයි; ගොවියාගේ පුතා ගොවියකු විය යුතුයි." යන විධියේ ප්‍රකාශයි.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

නැහැ.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

මේ ගරු සභාවේ කිව්ව. කිව්වෙ නැහැ කියා තමුන්නාන්සේ කියනවාද? මම හැන්සාඩ් වාර්තාව පෙන්නුවොත් මොකද වෙන්නෙ? මේ ගරු සභාවෙදිම කිව්ව, "ධීවර කාර්මිකයාගේ පුතා ධීවර කාර්මිකයකු විය යුතුයි."—

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

එහෙම කිව්වෙ නැහැයි කිව්වා.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

පත්‍ර මාගීයෙනුත් යම් යම් තැන්වල එහෙම කිව්ව බව වාර්තා වී තිබුණා. හැම ස්ථානයකදීම වගේ එහෙම කිව්ව. ඒ නිසා මේ තත්ත්වය යටත් විජිත යුගයේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

සිට පැවත එන අධ්‍යාපන ක්‍රමය නිසා ඇති වූ තත්ත්වයක් නොවන බව මත් තල ගරු මන්ත්‍රීතුමාට (ෂෙල්ටන් ජය සිංහ මයා.) මතක් කරන්නට කැමතියි. මේක මේ 1965 දී පටන් ගත් සෙල්ලම නිසා ඇතිවුණු දෙයක්. එය දිගටම පවත් වාගෙන ඇවිත් කිසිම අනාගතයක් නැති තරුණ පරම්පරාවක් අද තමුන්නාන්සේලා වේ රටේ බිහි කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ වගේ අංශ භාගය හැදුණු රාජාසන කථාවක් කවර කවදාවත් මම නම් මේ ගරු සභාවේදී අහල නැහැ. මේ රටේ ආර්ථික තත්ත්වය ට බරවා රෝගය හැදුණු පසු ඒ ලෙඩාට අංශ භාගයත් හැදුණා නම් ඒ මෙන්න මේ රාජාසන කථාවෙනුයි. ගුප්ත වැඩ පිළිවෙල රාශියක් මෙහි ගැබ්වී තිබෙනවා. මේ රට ක්‍රමානුකූලව ධනේශ්වර කඳවුරට හේත්තු වීගෙන ගොස් කවදා හෝ අප නිවට වහල් යටත් විජිත තත්ත්වයකට පරිවර්තනය වන්නට ඉඩ තිබෙනවා කියන සැකය 1965න් පසු අපි මේ ගරු සභාවේදී නොයෙක් වර ප්‍රකාශ කර තිබෙනවා. තමුන්නාන්සේ දන්නවාත් ඇති මේ අවුරුදු හතරහමාර තුළ—මේ රටේ ධනපති පන්තියට පමණක් කියනවා නොවෙයි—විදේශීය ධනපති පිරිස මේ රට ගිල ගැනීමේ වැඩ පිළිවෙළක් සූක්ෂම ලෙස ගෙනගිය බව. එය දැන්වත් තමුන්නාන්සේලාට පෙනෙනවාද කියා අහන්නට කැමතියි. එය පටන් ගත්තේ ක්‍රම සම්පාදක මණ්ඩලයෙන්.

මුලින්ම මේ තත්ත්වය පටන් ගත්තේ පාකිස්තානයේ තිබෙන අර්ථ සංරක්ෂණ ක්‍රමය මේ රටට ගෙනෙන්නට ඕනෑය කියන මූලික හැඟීමක් ඔය ක්‍රම සම්පාදක මණ්ඩලයේ සිටින අයගේ ඔළුවලට වැටී මෙනුයි. පාකිස්තානයේ "fපීක්ස්" ක්‍රමය කියා එකක් තිබුණා. "ක්‍රෙඩිට් ස්ක්වීස්" කියා එකක් තිබුණා. "එක්ස් පෝට් ප්‍රොමෝෂන්" වලට "බෝනස්" දෙනවාය කියන සෙල්ලමක් තිබුණා. අයුබ් ඛාන් යුගයේ පාකිස්තානයේ විශාල ආර්ථික දියුණුවක් එක් වරටම ඇති වුණාය කියන රාවයක් ඒ අවස්ථාවේ පැවතුණා. ඒ අවස්ථාවේ අයුබ් ඛාන් පිට වී නැහැ. ඔය "ක්‍රෙඩිට් ස්ක්වීස්" "පීfක්ස්" ක්‍රම ක්‍රමානුකූලව සකස් කරගෙන ආවාට පසුව අවසානයේ අයුබ් ඛාන්ට සිදුවුණේ කුමක්ද? ඒ රටේ විශාල ධනවත් පිරිසක් ඇති වුණා. මධ්‍යම පන්තිය කියන එක අහෝසි වී ගියා. සමහර මධ්‍යම පාන්තිකයින් ශ්‍රුති සංග්‍රහය නිසා—ආණ්ඩුවත් සමග තිබෙන සම්බන්ධතාවයන් නිසා—විශාල ධන කුවේරයන් බවට පත් වුණා. ඉතිරි මධ්‍යම පාන්තිකයින් සම්පූර්ණයෙන්ම ප්‍රපාතයට වැටී ගිහින්, සුළු නැත්නම් පහත් පන්තියට වැටුණා. අයුබ් ඛාන් සෙනෙවිතුමාගේ වැටී මටත් ප්‍රධාන හේතුව වූයේ එයයි. ලංකාවේ සිදු වුණේ කුමක්ද? ලංකාවත් ක්‍රම සම්පාදක මණ්ඩලයේ මාර්ගයෙන් සූක්ෂම ලෙස එය කරගෙන ගියා. මේ ඉස්සරහ සිටින ඇමතිවරුන් ඉදිරිපත් කරන එකම යෝජනාවක්වත් ක්‍රම සම්පාදක මණ්ඩලයෙන් අහන්නේ නැතිව ක්‍රියාත්මක කරන්නට අමාත්‍යාංශවලට පුළුවන්ද කියා මා අහන්නට කැමතියි.

නිදර්ශනයක් හැටියට සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන කියන්නම්. මගේ කොට්ඨාශයේ සිටින එක්තරා ධනවත් කෙනෙක් කල්පනා කළා රුපියල් 80,000ක් යොදා වාට්ටුවක් හදන්නට. එහෙත් අවසානයේදී කීවේ එවැනි දෙයක් හදන්නට වුවත් ක්‍රම සම්පාදක මණ්ඩලයෙන් අහන්නට ඕනෑය කියන එකයි. ගරු මුදල් ඇමතිතුමා නිවටයෙක් වෙලා. ඒ ගැන මා කණගාටු වෙනවා. දක්ෂ මහත්මයෙක්; හොඳ වැදගත් මහත්මයෙක්; මගේ විශාල ගෞරවයක් ඇති කෙනෙක්. එහෙත් මේ ක්‍රමය යටතේ මුදල් ඇමතිවරයා කියන පුද්ගලයෙක් අද නැහැ. ඔහුට කිසිම තත්ත්වයක් නැහැ. සෑම දෙයක්ම මේ ක්‍රම සම්පාදක මණ්ඩලය කියන විධියටයි. එය ශ්‍රී ලංකා මහ බැංකුවට පමණක් සීමා වී තිබෙනවා. ඒක ඇතුළේ සුද්දන් පිරිසක් සිටිනවා. ඊයේ පෙරේදා මා එහි ගියා. හැම කාමරයක් ගානේම සුද්දෙක් සිටිනවා. හැම දෙපාර්තමේන්තුවකම සුද්දෙක් සිටිනවා. ලෝක බැංකුවේ සුද්දෝ. මෙවර "බජට්" එක හදන්නෙත් ඒ අයද කියා මා අහනවා. ඔය සිත කළු කාමරවලට වී අපේ රටට සැලැස්ම හදනවා මිස රට ගැන කල්පනා කරන්නේ නැහැ; දේශ පාලන වාතාවරණය ගැන කල්පනා කරන්නේ නැහැ. ඔවුන් වෙනම විශාල අධිරාජ්‍යයක් මවාගෙන එහිම කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

කරනවා මිස මේ ඇමතිවරුන් කියන කිසි වක් ගණන් ගන්නේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ? The Sitting is suspended till 2 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப் பட்டு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 P.M. and then resumed.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා ඇද තිබෙන ටයි පටිය එතුමා ලෝක බැංකුවේ සභාපති හැටියට අදින ලද ටයි පටිය බව දැන් කියන්නට යෙදුණා. දිවා භෝජනයට විසිර යාමට ප්‍රථම යෙන්, ලංකාවේ ක්‍රම සම්පාදක මණ්ඩල යත් ඒවාගේම ඒ දෙපාර්තමේන්තුවත්, රජයේ අනිකුත් දෙපාර්තමේන්තුවල වැඩ කටයුතුවලටත්, මේ රටේ අපනයන ද්‍රව්‍ය වෙළඳාමටත් කොයි තරම් ඇඟිලි ගැසන වාද යන්න මා පෙන්වා දුන්නා. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය උඩ අපේ රටේ ද්‍රව්‍ය පිටරට පටවා ආදායම් ලබා ගැනීමට තිබෙන මාර්ග වසා දැමීමේ සූක්ෂම වැඩ පිළිවෙළක් තිබෙන බව මා මතක් කරනවා.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ පළමුවන වෙළඳ ඇමතිතුමා—වෛද්‍ය චායෂී පීරිස් මැතිතුමා—ගැන තමුන්නාන්සේට මතක ඇති. එතුමා සම්බන්ධව මා එකක් කියන්නට සතුටුයි. එතුමාගේ ප්‍රතිපත්තිවලට අප කැමැත්තක් දැක්වූයේ නැතත් මේ රටේ අපනයන ද්‍රව්‍ය වෙළඳාම සම්බන්ධයෙන් එතුමා අළුත් වෙළඳ පොළවල් සොයා ගැනීමටත්, අළුත් වෙළඳ මාර්ග සොයා ගැනීමටත් විශාල පරිශ්‍රමයක් දැරූ බව සඳහන් කළ යුතුයි. එපමණක් නොවෙයි, පසුගිය ආණ්ඩුවේ පිටපු වෙළඳ ඇමතිතුමා වන කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් (පී. බී. ඉලංගරත්න මයා.) සමග විශේෂයෙන්ම ලංකාවේ නැව් සංස්ථාවක් පිහිටුවීමේ කාර්යය සම්බන්ධව සාකච්ඡා පැවැත්වූ බවත් මා මේ අවස්ථාවේදී මතක් කරන්නට සතුටුයි. නමුත් එතුමාට මොකද වුණේ ? එතුමා වැදගත් යෝජනා කිපයක් සකස් කළා. තේ පිළිබඳව ගන්නා පියවර කුමක්ද, පොල් පිළිබඳව ගන්නා පියවර කුමක්ද, රබර් පිළිබඳව ගන්නා පියවර කුමක්ද, නැව් සංස්ථාව පිළිබඳව ගන්නා පියවර කුමක් ද කියා වැඩ පිළිවෙළක් සකස් කළ විගසම එතුමාට පදවිය අත්හැර යන්නට සිද්ධ වුණා.

ඒවාගේම, නොබෝදා වෙළඳ අමාත්‍ය ධුරයට පත් කරන ලද නාත්තන්ඩියේ ගරු මන්ත්‍රීතුමාත් (ගරු හියු ප්‍රනාන්දු) හොඳ යෝජනා ගණනාවක්ම ආණ්ඩුවට ඉදිරිපත් කර තිබෙනවා. නමුත් එතුමාටත් අකුල් හෙළා තිබෙනවා. ලෝකය පුරා තිබෙන යම් යම් විශේෂ නගරවල, තේ පානය පිළිබඳව එතරම් ප්‍රසිද්ධියක් නැති යම් යම් නගරවල තේ මධ්‍යස්ථාන පිහිටුවීමට එතුමා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් එතුමාටත් දැන් අකුල් හෙළනවා.

මා ආණ්ඩුවෙන් එක් ප්‍රශ්නයක් අසන්නට සතුටුයි. පී.එල්. 480 යටතේ ඇමෙරිකානු මාෂල් සැලැස්මෙන් යම් යම් රටවලට ආධාර දෙනවා. මේ අවස්ථාවේදී, අපේ පොල් තෙල් මිල එකවරම පහළ ගිය හේතුව, අපේ තේ මිල එකවරම පහළ ගිය හේතුව, තත්ත්වය හොඳ මදි වුණොත් නුදුරු අනාගතයේදීම රබර් මිල පහළ බසින්නට තිබෙන හේතුව යන මේ ආදී සියළු දෙයක්ම එක්තරා ගුප්ත ක්‍රමයක් අනුව සකස් වී තිබෙන වාද යන්න තමුන්නාන්සේලා විපරම් කර බැලිය යුතුයි. නොබෝදා වන තෙක්ම අපේ රටත් පාකිස්ථානයත් අතර පොල් තෙල් පිළිබඳව හොඳ වෙළඳාමක් තිබුණා. පාකිස්ථානය අප සමග පරම්පරානුගතව ගනුදෙනු කරන රටක්. නමුත් එකවරම ඒ වෙළඳාම නැවතුණා. කලින් පාකිස්ථානයට අපේ රටින් ටොන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ හතරක සෝයා බෝංචි තෙල් දුන්නා. නමුත් එකවරම, දැන් අපට අවශ්‍ය වන තෙල් ප්‍රමාණය තිබෙනවාය, අපට තමුන්නාන්සේලාගේ තෙල් දැන් වුවමනා නැත කියා පාකිස්ථානය කිව්වා. ඇමරිකාව අපට පිටි තෑගි වශයෙන් දෙන්නට ගිය අවස්ථාවේදීත් ඔය ප්‍රශ්නයම මතු වුණා. ලංකාවට එහෙම පිටි දෙන්නට එපා, මක්නිසාද, ලංකාව අපේ "ට්‍රැඩිෂනල් බයර්" කියා ඒ අවස්ථාවේදී ඕස්ට්‍රේලියාව ඇමරිකාවට කිව්වා. එතකොට ඇමරිකාව කළේ මොකක්ද? ඒ අය අපට පිටි දීම නැවැත්තුවා. ලංකාවේ වෙළෙඳ පොළක් හැටියට තිබෙන පාකිස්ථානයට සෝයා බෝංචි තෙල් දෙන්නට එපා යයි මේ ආණ්ඩුව ඇමෙරිකානු ආණ්ඩුවෙන් ඉල්ලීමක් කර තිබෙනවාද? හැබැයි, ඒ විධියට ඉල්ලීමක් කළත් එයින් වැඩක් වන එකක් නැහැ. ඒ ඉල්ලීමට ඉඩ දෙන එකක් නැහැ. 1961 දී කැනඩාවට අපේ තෙල් ටොන් 4,80,000 ක් යැව්වා. එහෙත් 1968 දී යවා තිබෙන්නේ ටොන් 38,000 යි. ලංකාවෙන් ගන්නා තෙල්වලට කැනඩාව ඩොලර්වලින් මුදල් ගෙවනවා. ඒ ඩොලර් එකකට අපේ මුදලින් රුපියල් 13.20 යි. මැලේසියාවෙන් ලැබෙන්නේ රුපියල් 13.50 යි. බ්‍රිතාන්‍යයෙන් ලැබෙන්නේ රුපියල් 15.10 යි. ඉතින් අප මේවා ගැන කල්පනා කරන විට නොයෙක් රටවල වෙළෙඳ පොළවලින් ඇත් වී—ඒකාබද්ධ වැඩ පිළිවෙළක් නැතිව—කටයුතු කරන්නට පුළුවන්ද බැරිදැයි මේ රජය කල්පනා කර නැහැ.

ඉන්දියානු ව්‍යාපාරිකයන් රාශියක් ලංකාව ගිල ගන්නට යන හැටි මේ ඊයේ පෙරේදා අපට දකින්නට ලැබුණා. සමූහයක් වශයෙන් අප ඉන්දියානු ඩී. එම්. කේ. පක්ෂයට භයයි; හොර කල්ලතේනින්ට භයයි; ලංකාව තුළ කෙරෙන ඩී. එම්. කේ. කටයුතුවලට භයයි. ඒ වාගේම උතුරු ඉන්දියානුකාරයන්ගෙන් සිදු වන ආර්ථික පීඩනයටත් අප භයයි. කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) ඊයේ බිර්ලාගේ ව්‍යාපාර ගැන සඳහන් කළා. බිර්ලා වැනි උදවිය මෙහිත් ව්‍යාපාර රාශියක් ඇති කරන්නට යනවා. හෙට අනිද්දා ඔබරෝයි කිය

න කට්ටියත් ලංකාවේ ව්‍යාපාර ඇති කිරීමට බලාපොරොත්තු වෙනවාලු. එතකොට දැන් ඒ අයත් ලංකාවට ඇස් ගහගෙන ඉන්නවා. හිල්ටන් ව්‍යාපාරය අතහැර ඔබරෝයි ව්‍යාපාරය ඇති කරන්නට යනවාලු. මේ දෙකෙන් හොඳ කොයිකදැයි මා දන්නේ නැහැ. ඔබරෝයි කියන්නේ විශාල ධනපති පිරිසකටයි.

තේ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉන්දියානු ආණ්ඩුවත් සමඟ සම්බන්ධ වී කටයුතු කරන්නට මේ ආණ්ඩුව කල්පනා කළා. ඒ අවස්ථාවේදී ඉන්දියාව ඒ සම්බන්ධයෙන් කොතරම් නම් තර්ජනාත්මක වැඩ පිළිවෙළක් ගෙන යනවාද යන්න ඉන්දියාවට ගිය ලංකාවේ ව්‍යාපාරිකයන්ට පෙනී ගියා. වත්තේගම ගරු මන්ත්‍රීතුමා (පී. බී. ඒ. වීරකෝන් මයා.) මේ අවස්ථාවේදී මෙහි සිටීම ගැන මා සතුටු වෙනවා. "සීමාසහිත කැන්ඩි ටෙක්ස්ටයිල් ලිමිටඩ්" නමැති ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා හැටියට වැඩ කරන්නේ ඒ ගරු මන්ත්‍රීතුමායි. මන්ත්‍රීවරුන් එවැනි කටයුතුවලට සම්බන්ධ වී කටයුතු කිරීම ගැන සාකච්ඡා කරන්නට මට දැන් වුවමනාවක් නැහැ. හොඳයි, මේ ව්‍යාපාරයට සම්බන්ධ වී සිටින අය කවුද? Brown Shipley & Company, Midland Bank, Barkley London Provincial Bank යන ආයතන පමණක් නොව ලංකා බැංකුවත් මේකට සම්බන්ධ වී සිටිනවා. ඔය කියන ලද "බ්‍රවුන් ෂිප්ලි ඇන්ඩ් කොම්පැනි" නමැති සමාගමත් සමඟ බිර්ලා සම්බන්ධ වී සිටිනවාදැයි තමුන්නාන්සේලා කල්පනා කර බැලුවාද? බිර්ලා එක පැත්තකින් වෙනම සමාගමක් ආරම්භ කරනවා. අනෙක් පැත්තෙන් වත්තේගම ගරු මන්ත්‍රීතුමාගේ කළමනාකාර අධ්‍යක්ෂත්වය යටතේ පවතින සමාගමටත් අනියම් විධියකින් සම්බන්ධ වී සිටිනවා. ඒ ගැන තමුන්නාන්සේලා දන්නේ නැහැ. තත්ත්වය මෙසේ හෙයින් අපට ලොකු භයක් තිබෙනවා. විදේශීය ධනපතියන් ක්‍රමානුකූලව, නීතිඥ අන්දමින් අපේ අර්ථ ක්‍රමයට සම්බන්ධ වීමට විශාල වශයෙන් ආවොත් මෙහි අපේ තිබෙන ව්‍යාපාරවලට සිදු වන්නේ මොනවාද? එතකොට තුල්හිරියේ පටන් ගන්නට

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

යන අපේ රෙදි කර්මාන්ත ශාලාවලට සිදු වන්නේ මොකක්ද? කුඩා අත් යන්ත්‍ර පේසකර්මකාරයන්ට සිදු වන්නේ මොකක්ද? මීටියාගොඩ තක්ෂිලා පේසකර්මකාරයන්ට සිදු වන්නේ මොකක්ද? ඒ සියල්ලම අතු ගෑවී යනවා. ඒ නිසා අප ටිකක් මේවාසින් ආරක්ෂා වන්නට ඕනෑ. විශාල ධන කුවේරයන් මේ රටට අවුත් ව්‍යාපාර පටන් ගැනීම ගැන අප ප්‍රවේශම් වන්නට ඕනෑ. මුළු ලෝකයේම තියෙන්නේ, බෙදාහැරීමේ ව්‍යාපාරය 20 දෙනකු පමණ පිරිසකගේ අතේයි තිබෙන්නේ. ලෝඩ් ඉන්කේප් නමැති පුද්ගලයාට ලංකාවේ තේ අක්කර 29,000 ක් පමණ තිබෙනවා. ජෝන් මුවර් නමැති පුද්ගලයාට ලංකාවේ තේ අක්කර 15,000ක පමණ අයිතිවාසිකමක් තිබෙනවා. තේවලට රබර්වලට පමණක් නොව තෙල් වලටත් ලබා තිබෙන්නේ මෙම දසාවයි. එපමණකින් නොනැවතී දැන් ක්‍රමානුකූලව අපේ කර්මාන්ත ආයතනවලටත් එම තත්ත්වය ඇවිත් තිබෙනවා. එම තත්ත්වයෙන් අපි පරිස්සම් වන්නට ඕනෑ.

මෙවැනි ධන කුවේරයන්ගේ වැඩ පිළිවෙළ නිසායි පාකිස්තානයේ සිටි අයුබ් ඛාන්ටත් යන්නට සිදු වුණේ. ඒ රටේ විශාල පරතරයක් ඇති සමාජ ක්‍රම දෙකක් බිහි වුණා. විශාල ධන කුවේරයන්ගේ සමාජයත් අන්තිම පීඩිත නිර්ධන පන්තියේ සමාජයත් කියන සමාජ ක්‍රම දෙකයි, ඒ. මධ්‍යම පන්තිය සම්පූර්ණයෙන්ම විනාශ වී ගියා. එම තත්ත්වය නිසායි ඔහුට යන්නට සිදු වුනේ. ඊයේ පෙරේදා ඉන්දියාවේ මොරාජී දේසායි සම්බන්ධයෙන් ඇති වූයේ කුමන තත්ත්වයක්ද? ඒ මුදල් ඇමතිතුමාගේ පුත්‍ර රත්නය ඒ රටේ අභ්‍යන්තර විශාල කොම්පැනි 12 ක විතර අධ්‍යක්ෂ ධුර දැරුවා. අපේ මුදල් ඇමතිතුමා නම් එවැනි අභාග්‍ය සම්පන්න සිද්ධීන්වලට ඇඟිලි ගසා නැහැ. එහෙත් මේ රටෙත් සිටිනවා, ධනකුවේර පිරිසක්. රජයේ උසස් තැන්වල වැජඹෙන අයට සම්බන්ධ ධන කුවේර පිරිසක් මේ රටෙත් සිටිනවා. ඔවුන් ගෙන් ප්‍රවේසම් වන ලෙස අප කියන්නේ එම නිසායි.

1964 දී ආදායම් බදු ගෙවන අය කී දෙනෙක් සිටියාද, ඒ කවුරුන්ද යන වග අපේ ගරු මුදල් ඇමතිතුමා සොයා බැලුවොත් හොඳයි. ඒ වාගේම අද 1968 දී ආදායම් බදු ගෙවන අය කී දෙනෙක් සිටිනවාද, ඒ කවුරුන්ද කියාත් සොයා බැලුවොත් හොඳයි. තමුන්නාන්සේගේ භාණ්ඩාගාරයට යායුතු සල්ලි rebate ක්‍රමයෙන් හුඟ දෙනෙක් නොදී සිටිනවා. අද හුඟ දෙනෙක් ඒ පිළිවෙළට ආදායම් බදු ගෙවීමෙන් වැළකී සිටිනවා. මා ඒ උදවියගේ නම් කියන්නේ නැහැ. එහෙත් මා දන්නවා 1964 න් පසු මේ රටේ ඇතිවුණු ධනේශ්වර පිරිසගෙන් අඩකටත් වඩා සමහර විට සියයට 90 කටත් වඩා ආදායම් බදු නොගෙවා සිටින බව. rebate ක්‍රමය නිසා බේරී සිටිනවා. ඔවුන් අද විශාල කොම්පැනිවලට අයිතිවාසිකම් කියනවා. ඒ වාගේම මේ රටේ අනිකුත් කාර්මිකයන් නැති කර ගෙන, සුළු වෙළඳ ව්‍යාපාරිකයන් විනාශ කරගෙන ඒ අය වැජඹෙනවා.

ගරු කථානායකතුමනි, අප සිටින්නේ කුමන කලාපයකදැයි අප කල්පනා කළ යුතුව තිබෙනවා. යුද්ධයෙන් පසු ඇතිවුණු බටහිර අධිරාජ්‍යවාදී රටවල් තුන දෙස බලමු. පළමුවෙන්ම අමෙරිකාව දෙස බලමු. අමෙරිකාවේ අයවැය ලේඛන 23 කින් 17 ක්ම හිඟ අයවැය ලේඛන හැටියට හඳුන්වන්නට පුළුවනි. අද එම රටේ ණය පිළිබඳ තත්ත්වය කුමක්ද? 1949 යුද්ධය ඇතිවුණු වේලාවේදී තිබුණු තත්ත්වයට වඩා අද තත්ත්වය වෙනස් වී තිබෙනවා. අද ඒ අය ඩොලර් කෝටි 1,080 කට වැඩියෙන් ණය වී සිටිනවා. ඊළඟට බ්‍රිතාන්‍යය ගැන බලමු. යටත් විජිත වාදය පැවති කාලයේදී ඒ අයට විදේශ විනිමය ස්ටර්ලින් කෝටි 100 ක් තිබුණා. අද ඒ අය ස්ටර්ලින් කෝටි 500 ක් ණයයි. ඊයේ පෙරේදා, සීත සෘතු වේදී ඒ අයගේ රන්පවුම්වල අගය සම්පූර්ණයෙන්ම වාගේ කපන්නට සිදුවුණා. ප්‍රංශයේ ඩිගෝල්ට යන්න සිදුවූයේ ඇයි? ඒ රටේ ප්‍රෑන්ක් එකත් දෙදරුම් කෑවා. මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේදී සියයට 40 ක් පමණ එම රටේ සල්ලි පිට කරන්නට කටයුතු කළා.

එවැනි රටවල් සමඟයි අපි බැඳී සිටින්නේ. ඒ රටවල රන්පවුම් හෙල්ලෙන විට අපිත් හෙල්ලෙනවා. එතන ඩොලර් එකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොකවත් වුණොත් අපටත් බයයි. අපේ වෙළඳාම අනිකුත් රටවලට ගෙන යාමේ අභිලාසයක් හෝ අනිකුත් රටවල් සමග වැඩි වැඩියෙන් සම්බන්ධ වීමේ අභිලාසයක් හෝ නැති එකේ වරදයි මේ. මේ ආණ්ඩුවට තරම් වාසි ලැබුණු වෙනත් ආණ්ඩුවක් කොහේවත් ඇත්තේ නැහැ. ලෝක බැංකුව මේ ආණ්ඩුවට සම්පූර්ණයෙන්ම ආධාර දුන්නා. විරුද්ධ පාර්ශ්වයේ සිටින කාලයේ පටන්ම විදේශීය හා ස්වදේශීය ධනපතියන් තමුන්නාන්සේලාට සම්පූර්ණ සහයෝගය දුන්නා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඒ විධියේ කිසිවෙක් නැහැ. උසස් නිලධාරීන් වශයෙන් හැදින්වෙන පුද්ගලයන් තමුන්නාන්සේලාට උදව් කරනවා. ඔවුන් කොයි තරම් ලෙන්ගතු කමකින් තමුන්නාන්සේලාට උදව් කරනවාද යත්, එක්තරා ඇමතිවරයකු බුලත්විට කමින් සිටියදී ඔහුට කෙළ ගැසීමට පඩික්කමක් ඔස වාගෙන යාමට තරම් පහත් තත්ත්වයකට වැටී එක්තරා උසස් නිලධාරියකු ක්‍රියා කළා. මා ඔහුගේ නම කියන්නේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I think that is a reflection on the House. The hon. Member should not say anything without mentioning names.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

I have not said anything against the Minister concerned. What I have said is against a high official, and I have not mentioned his name.

පහත් මට්ටමේ සිටින නිලධාරීන්ට චෝදනා කරන්නට තමුන්නාන්සේලාට පුළුවන්කමක් නැහැ. රජය කඩාකප්පල් කිරීමේ අදහසින් ඔවුන් කිසිම දෙයක් කෙළේ නැහැ. වැඩ වර්ජනයක්වත් ඇති කෙළේ නැහැ. ජනවාරි 8 වන දා පමණයි කිසියම් කලබලයක් ඇති වුණේ. තමුන්නාන්සේලාට අවශ්‍යවූ ආර්ථික පියවරවල් සෑම එකක්ම ගැනීමට ඉඩ ලැබුණා. තමුන්නාන්සේලා හාල් සේරුව කැපුවා; ඕ. ජී. එල්. ක්‍රමය යෙදුවා; පිf්ක්ස් ක්‍රමය ඇති කළා; රුපියලේ මිළ අඩු කළා. මේ සෑම දෙයක්ම කරලත් ප්‍රශ්න නොවිසඳුණේ ඇයිදැයි කල්පනා නොකිරීම මේ ආණ්ඩුවේ ලොකුම වරද හැටියට මා සලකනවා.

විවිධ මට්ටම්වල සිටින අය අතර භේද වැපිරීමේ සූක්ෂම වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලා තුළ තිබුණා. ඒ අනුව තමුන්නාන්සේලා කම්කරුවාත් ගොවියාත් භේද කරන්නට කටයුතු කළා. මා හිතන හැටියට ඒ වැඩ පිළිවෙළ පසුගිය වැඩ වර්ජන සමයේදී ඉතාම නික්ෂණ විධියට ගෙන ගියා. "අපි තමුන්නාන්සේලාගේ පඩි වැඩි කරන්නම්, මුදලින් ආධාර කරන්නම්" කියමින් කම්කරුවන් අතරේ ප්‍රචාරයක් ගෙන යන අතර ගොවි ජනතාව අතර කැත ප්‍රචාරයක් යටින් ගෙන යමින් "පඩි වැඩි කළොත් බඩු මිළ නගිනවා, ඒ නිසා වැඩ වර්ජනවලට උදව් දෙන්න එපා" යි කියනවා.

ඒ වාගේම තමුන්නේසේලා උගතාත් නූගතාත් අතර භේද ඇති කළා. "උගතාය කියා එකෙක් කලිසමක් ඇඳගෙන කිසිම වැඩක් නොකර කිකමකු හැටියට ඉන්න වා" යි තමුන්නාන්සේලා නූගතාට කිව්වා.

ඒ සමගම තමුන්නාන්සේලා ගිහි-පැවිදි භේදයක් ඇති කළා. මේ ළඟදී සංඝ භේදයකුත් ඇතිකළා. එය පංචානන්තර්ය පාප කර්මයට අයිති වන දෙයක්.

භේදවලින් ජීවත් වීමේ වැඩ පිළිවෙළක් අනුගමනය කරන මේ රජය යටත් විජිත කාලයේදී තිබුණු "ඩිවයිඩ් ඇන්ඩ් රූල්" නම් සැලැස්ම අද ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරගෙන යන නිසා අද අපේ ජනතාව බෙදුණු ජාතියක් බවට, වහල් ජාතියක් බවට, සෑම අංශයකින්ම පරිවර්තනය වේ ගන යනවා.

රක්ෂා ලබා ගැනීම සඳහා කී දාහක් තමුන්නාන්සේලා සොයා එනවාදැයි මන්ත්‍රීවරුන් වශයෙන් තමුන්නාන්සේලා දන්නවා ඇති. ලෙන්ගතුකම උඩ රක්ෂා ලබා ගැනීමට කී දාහක් එනවාද? ආත්මගරුත්වයක් අද මේ රටේ ජනතාවට තිබෙනවාද? ඉතාම නික්ෂණ පිළිවෙළට ඒ සියල්ලම තමුන්නාන්සේලා නැති කළා. තමුන්නාන්සේලා විසින් ඇති කරන ලද ගොවි හමුදාව අසාර්ථක වුණේ ඇයි? එය ජනතාවට රැකී රක්ෂා සපයා දෙන සංවිධානයක් වුණේ නැහැ. එයින් කෙරුණේ දවසට රුපියල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

දෙකේ පඩියට කම්කරුවන් බඳවා ගැනීමක් පමණයි. බැළමේහෙවර කිරීම සඳහා තූගත් පිරිසක් බඳවා ගත්තා. ජාතික තරුණ සංවිධානය සඳහා 30,000 ක් දෙනා බඳවා ගන්න බව තමුන්නාන්සේලා කියනවා. එසිනුත් කෙරෙන්නේ කම්කරුවන් වශයෙන් කිසියම් පිරිසක් බඳවා ගැනීමයි. මේ රටේ ජනතාව බැළමෙහෙවර කරන කම්කරුවන් බවට පරිවර්තනය කිරීමද තමුන්නාන්සේලාගෙ බලාපොරොත්තුව? ඒ තික්ෂණ වැඩ පිළිවෙළ ක්‍රමානුකූලව මේ රටේ ගෙන යන බව කණගාටුවෙන් වුණත් කියන්නට සිදු වී තිබෙනවා.

ඊළඟට, ජීවන ප්‍රශ්නය ගැනත් රාජාසන කථාවේ සඳහන් වුණ නිසා ඒ පිළිබඳවත් වචන කීපයක්වත් කථා කළ යුතුව තිබෙනවා. රාජාසන කථාවේ එය සඳහන් වී තිබෙන්නේ මෙහෙමයි :

".....ජනතාවගේ ජීවන තත්ත්වය ක්‍රමයෙන් ඉහළ නැංවීමට සැලසෙන්නාවූත් ප්‍රතිපත්ති මගේ ආණ්ඩුව විසින් ඉදිරි කාලයේද අනුගමනය කරනු ලැබේ."

වර්තමාන රජය පසුගිය අවුරුදු 4 1/2 තුළ කටයුතු කළ ආකාරය ගැන කල්පනා කරන විට නම් ඔවුන් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්නට අදහස් කරන්නේ කොහොමදැයි මට තේරුම් ගන්නට බැහැ. ඒ හැරෙන්නට කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා සිය කථාවේදී කීවා, "අපේ බලාපොරොත්තුව අනුව භාල් සලාකය සම්පූර්ණයෙන්ම කපා දමන්නට අපට සමහර විට පුළුවන්කම ලැබෙයි" කියා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
කවුද කිව්වේ?

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
එය එසේ නොවේ යයි තමුන්නාන්සේ කියනවා නම් එය වෙනම දෙයක්. එහෙත් රජයේ බලාපොරොත්තුව භාල් සලාකය සම්පූර්ණයෙන්ම කපා දැමීම යයි පාර්ලිමේන්තු ලේකම්තුමා කීවා.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(මීගමුව)
(திரு. என். டென்சில் பெர்ணாண்டோ—நீர்கொழும்பு)
(Mr. N. Denzil Fernando—Negombo)
ලංකාවේ ඕනෑ තරම් භාල් තිබෙනවා නම් භාල් සලාකය කැපුවාම මොකෝ?

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
භාල් තිබෙනවා නම් කමක් නැහැ. එහෙත් භාල් නැතිකමයි ප්‍රශ්නය. එම නිසා භාල් සලාකය කොහෙත්ම කපන්න එපා. වී ගොවිතැන් නොකරන අය මේ රටේ කොතෙකුත් ඉන්නවා. මීගමුවේ ගරු මන්ත්‍රීතුමා මීගමුවේ වී ගොවිතැන් කරනවාද? මූදුකරයේ මුන්නක්කරය වී ගොවිතැනට සුදුසු යයි එතුමා කියා තිබෙනවා.

1956 සිට 1965 දක්වා වූ අවුරුදු 9 ක කාලය තුළ ජීවන වියදම ඉහළ නැඟ තිබුණේ අංක 9 කින් පමණයි. එහෙත් වර්තමාන රජයේ පාලන කාලය තුළ පසුගිය අවුරුදු 4 ඇතුළත එය 130 දක්වා අංක 18 කින්ම ඉහළ නැඟ තිබෙනවා. අඩු තරමින් එසේ වැඩි වී තිබෙන්නේ මොන මොන අංශවලින්ද කියාවත් සොයා බැලුවාද?

ආහාර වියදම අංක 18 කින්ම වැඩි වී තිබෙනවා. කොතෙකුත් වවනවාය, නිෂ්පාදනය කරනවාය, රට ස්වයංපෝෂිත වන්නට ඔන්න මෙන්න කියා තිබෙනවාය කියනවා. එහෙත් කෑම වියදම එන්න එන්නම ඉහළ නඟිනවා.

1964 දී ඇදුම් පිළිබඳ වියදම 127.2 යි. ඒ කාලයේදී රෙදි-පිළි බෙදා හැරීම පිළිබඳ ඒකාධිකාරය ස.තො.ස. ට පැවරී තිබුණු නිසා ස.තො.ස. ලබා ගත්තේ සියයට 10 ක ලාභයක් පමණයි. එහෙත් අද රෙදි-පිළි බෙදා හැරීම ලංකා සළු සලට පවරා ඇති අතර, එය සියයට 40 ක සුද්ධ ලාභයක් ගන්නවා. ලංකා සළු සලේ එක් කොටස්කරුවකුට සියයට 40 බැගින් ලාභ බෙදූ බව මා දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பெர்ணாண்டோ)
(Mr. Denzil Fernando)

බෝරකාරයන්ට ගිය ලාභ දැන් සළු සලට ලැබෙනවා.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

හෙට අනිද්දා වන විට ඒවා බිර්ලාට යයි.

ඊළඟට දරවලට යන වියදම බලමු. රජයේ කැලෑ කොතෙකුත් එළි කරනවා. පොළොන්නරුවේ මනම්පිටිය පැත්තේ අක්කර 3,000 ක කැලෑ එළි කොට හරක් සියයක් සඳහා තණ බිමක් හදා තිබෙන වාලු. එය කර තිබෙන්නේ කවුදැයි ඇමති තුමා දන්නවා. ඒ තරම් විශාල කැලෑ එළි කරනත් දර මිල ඉහළ නැඟලා.

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

කෝච්චිවලට දමනවා.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

ජීවන වියදම් අංකය වෙනස් නොවුණේ ගෙවල් කුළි සම්බන්ධයෙන් පමණයි. ඊට හේතුව ගෙවල් කුළි රජය මඟින් පාලනය කිරීමයි; රජය ඊට ඇඟිලි ගැසිමයි. මාත් පෞද්ගලික අංශයේ අවුරුදු 10 ක් පමණ වැඩ කළ නිසා එහි කෙරෙන සෙල්ලම් මා හොඳින් දන්නවා. එම නිසා, පෞද්ගලික අංශය කෙරෙහි නම් වැඩි විශ්වාසයක් නොතබන ලෙස මා ඉල්ලා සිටිනවා. පෞද්ගලික අංශය මේ රටට ඇල්වතුර පවා පිටරටින් ගෙන්නුවා. "ස්කොච් විස්කි" කියන බීම සෑදීම සඳහා බෝතලයකට රු. 1.50 ගණනේ ගෙවා, ස්කොච්ලන්තයෙන් මෙරටට වතුර ගෙන්නුවා. ඊට හේතු වශයෙන් මොකද කිව්වෙ? ලංකාවෙ වතුරත් විස්කිත් හාමු කළාම හොඳ රසයක් එන්නෙ නැතිලු. හොඳ රසයක් එන්නෙ ස්කොට්ලන්තයෙන් ගෙනා වතුරත් සමඟ විස්කි හාමු කළාමලු. වතුර බෝතලයක් වෙනුවෙන් රු. 1.50 ක් වැය කළා. ඒ වගේම මේ ළඟදී සිට පිටරටවලින් බේල් කලිසම් ගෙන්වනවා. හදට යන පුද්ගලයන් ආපසු ආ විට ඒ උදවියත් දවස් 21 ක් යන තුරු "ක්වරන්ටයින්" කරල තබන්න වලු. මා කලින් සඳහන් කළ බේල් කලිසම් ඇන්ද, ඇන්ද එක්කෙනා කසනවා. කසන්නට කසන්නට තවත් ප්‍රීතියෙන් කසනවා. ඇයි දෙයියනේ මේවට ඩී.ඩී.ටී. දුන් ටිකක්වත් අල්ලලා නොගත්තෙ? මේවායින් නොයෙක් අසනීප බෝ වන්නට ඉඩ තිබෙනවා.

අද පේවිඔන්ව් එකට ගිහින් බලන්න. පිටරටින් ගෙන්වූ නොයෙක් භාණ්ඩ කොයි තරම් ගොඩ ගසා තිබෙනවාද කියා. මේ මුදල්වලින් පරිප්පු ටිකක්, කිරිපිටි ටිකක් ගෙනෙන්න බැරිද? ලංකාවේ යම් කිසි භාණ්ඩයක මිළ රජය මඟින් පාලනය කළා නම් අන්න ඒ භාණ්ඩ විතරයි ලාභයට ලබා ගන්නට පුළුවන්කම තිබෙන්නෙ. තමුන්නාන්සේලා රජය මඟින් ගෙන්වන පිටිවල මිළ කලිනුත් ශත 32 යි; අදත් ශත 32 යි. වාසනාවකට මෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින් මේ රටට තෙල් ගෙනෙන නිසා අද තෙල් පෙට්රල්වලට අපට වැඩි මිළක් ගෙවන්නට සිදු වන්නෙ නැහැ. පෞද්ගලික ව්‍යාපාරිකයන් මේ ව්‍යාපාරය කරන ඒඛනය ආදි රටවල් දිහා බලන්න. අනික් රටවල පෙට්රල්වල මිළ සියයට 400 කින් පමණ වැඩි වී තිබෙනවා. වාසනාවකට වගේ මේ ව්‍යාපාරය ලංකාවේ ආණ්ඩුව යටතේ තිබෙන නිසා අපට ලාභයක් ලැබී තිබෙනවා. සීනි ටික ගැන බැලුවත් එහෙමමයි. සීනි ලාභයට ලැබෙන්නෙ රාජ්‍ය අංශයෙන් ගෙන්වන නිසයි. ඒ නිසා පෞද්ගලික අංශය ගැන වැඩි විශ්වාසයක් තබන්නට එපා. මේ රජය සෑම අවස්ථාවකදීම අමාරුවේ දැම්මා නම් ඒ පෞද්ගලික අංශයයි. කවදා හෝ මේ රජය විනාශ කරන්නෙත් පෞද්ගලික අංශයයි. මේ රට සූරාකෑමේ අදහසින් පිට රටවලින් මෙරටට එන විදේශීය ධනපතියන් කෙරෙහි විශ්වාසය තබන්නට එපා. එහෙම විශ්වාසය තැබුවොත් තමුන්නාන්සේලා ඉක්මණින්ම විනාශය කරා ළඟා වන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 2.22

එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා. (මුතූර් පළවමුත්‍ර මන්ත්‍රී)

(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

கௌரவ சபாநாயகரவர்களே, மாட்சிமை தங்கிய மகா தேசாதிபதியின் இந்த வருடச் சிம்மாசனப் பிரசங்கம் இலங்கைச் சரித்திரத்திலே ஒரு உன்னத இடத்தை பெற்றுள்ளது. நான் என் இப்படிச் சொல்லுகிறேனென்றால், ஆறுவது பாராளுமன்றத்தின் ஐந்தாவது கூட்டத்தொடரின் சிம்மாசனப் பிரசங்கம் இதுவாகும் என்பதினாலேயே. தேசிய அரசாங்கம் 1965 ஆம் ஆண்டு ஆட்சிக்கு வந்தவுடன் எதிர்க் கட்சியினர் இந்த அரசாங்கத்துக்கு மூன்று மாதம், ஆறு மாதம் ஒரு வருடம் என்றெல்லாம் ஆட்சிக்காலத் தவணை கொடுத்தார்கள். ஆனால் அவர்களுடைய கூற்று இன்று பொய்யாகிவிட்டது. இந்த நாட்டு மக்கள் திறமையான, ஸ்திரமான, நிதானமான பிரதமரின் கீழ் அரசாங்கத்தை ஐந்து ஆண்டு காலத்துக்குக் கொண்டு செல்ல இடமளித்தது, அவர்கள் இந்த அரசாங்கத்தின் மீது கொண்டுள்ள நம்பிக்கையை, பற்றை எடுத்துக்காட்டுவதாக இருக்கின்றது. இதனாலேதான் நான் இந்தத் தேசிய அரசாங்கம் மக்களுடைய நம்பிக்கையைப் பெற்ற அரசாங்கம் என்று கூறுகிறேன். இதனாலே தான் இந்தத் தேசிய அரசாங்கம் ஐந்து வருட காலத்துக்கும் சீராக நடைபெற்றுக் கொண்டு செல்வதைக் காணக்கூடியவர்களாக இருக்கிறோம்.

தேசிய அரசாங்கத்தின் தலைவர் அன்புக்குரிய பிரதமர் கௌரவ டட்லி சேனநாயக்க பதவி ஆசை கொண்டவர் அல்லர். அவருடைய ஒரே நோக்கம் இந்த நாட்டில் அனைவரும் சமமாக, சாந்தமாக, சந்தோஷமாக வாழ வேண்டும் என்பதுதான். தேசிய ஐக்கியம் பலப்பட வேண்டும்; ஜனநாயகம் இந்த நாட்டில் பாதுகாக்கப்பட வேண்டும்; இந்த நாட்டுக்குத் தேவையான பொருட்களை நாமே உற்பத்தி செய்து கொள்ள வேண்டும் என்ற ஒரே நோக்கத்துடன் தேசிய அரசாங்கம் நாட்டை ஆட்சி புரிந்து கொண்டு வருகிறது.

சபாநாயகரவர்களே, ஒரு நாடு முன்னேற்றமடைய வேண்டுமானால் அந்த நாட்டின் பொருளாதாரம் ஸ்திரம் அடைய வேண்டும். ஒரு நாடு ஸ்திரமாக முன்னேற வேண்டுமானால் அந்நாட்டு மக்கள் தியாக மனப்பான்மை, தேசிய உணர்ச்சி, சகிப்புத்தன்மை இவைகளைக் கையாண்டு நாட்டின் ஐக்கியத்துக்காக, அபிவிருத்திக்காகப் பாடுபட வேண்டும். இந்த அடிப்படையிலே நாம் பாடுபாட்டால்தான் நமது நாடு பொருளாதாரத் துறையிலும் அரசியல் துறையிலும் திட்டவட்டமாக முன்னேற்றம் அடைய முடியும் என்பதை இங்கு கூற ஆசைப்படுகிறேன்.

1965 ஆம் ஆண்டுக்கு முன்னர் நமது நாடு சின்னபின்னமாகி இரத்தக்களரிகளை ஏற்படுத்தியதை நாம் கண்டோம். தேசிய அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் இன்று வரை நாட்டில் ஐக்கியம் பரவி வருவதை, அரசியல் திட்டங்களை பொது மக்கள் உணர்ந்து வருவதை நாம் பார்த்து வருகிறோம். இதனாலேதான் ஐந்து வருட காலமும் தேசிய அரசாங்கம் திருப்தியான முறையில் ஆட்சி புரிந்துள்ளது என்பதை நாம் நேரில் கண்டு கொண்டிருக்கிறோம்.

சிம்மாசனப் பிரசங்கத்திலே, உணவுற்பத்தித் திட்டங்கள் பெருக வேண்டும், சுயதேவைப் பூர்த்தியை ஏற்படுத்த வேண்டும், அரசியல் பொருளாதார சமூகத் துறைகளிலும் பிராந்திய ரீதியிலும் சர்வதேச ரீதியிலும் முன்னேற்றமடைய வேண்டும் என்ற நோக்கத்துடன் இந்த அரசாங்கம் முயற்சி செய்து கொண்டிருக்கிறது என்பதைக் காணும் பொழுது நாம் மகிழ்ச்சியடைய வேண்டியவர்களாக இருக்கிறோம். கடந்த காலச் சரித்திரத்தைப் பேசி நம்முடைய பொன்னான நேரத்தை வீணாக்குவதையிட்டு, நாட்டின் நலன் கருதி அனைவரும் ஒன்றுபட்டு நம் கடமைகளைத் திறம்படச் செய்தால் நமது நாடு விரைவில் முன்னேற்றமடையும் என்ற நம்பிக்கை எனக்குண்டு.

தேசிய அரசாங்கத்தின் சிம்மாசனப் பிரசங்கத்தில் நல்ல பல சிபார்சுகள் செய்யப்பட்டிருப்பதைக் காண்கிறோம். அவற்றுள் ஒன்று, பொலிஸ் ஆணைக்குழுவின் அறிக்கை விரைவில் பொலிஸ் ஆணைக்குழுவின் அறிக்கை விரைவில்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

சிபாரிசுகள் அமுல் நடத்தப்படும் என்றும் கூறப்பட்டிருப்பதாகும். இன்று நமது நாட்டில் பல துறைகளிலும் பொலிசார் பரவலாகப் பணிபுரிகிறார்கள். அவர்களுக்கு பொலிஸ் ஆணைக்குழுவின் சிபார்சுகளை அமுல் நடத்தி, நல்ல சம்பளத் திட்டங்களை வகுத்துக் கொடுக்க வேண்டும் என அரசாங்கத்துக்கு ஞாபகப்படுத்த விரும்புகிறேன்.

சம்பள ஆணைக்குழுவின் இடைக்காலச் சிபார்சுகளை அரசாங்கம் விரைவில் அமுலுக்குக் கொண்டுவரும் என்ற நம்பிக்கை எனக்கு உண்டு. அதைப் பற்றி மகா தேசாதிபதியவர்களும் தமது சிம்மாசனப் பிரசங்கத்தில் குறிப்பிட்டு இருக்கிறார்கள். இது மிகவும் வரவேற்கத் தக்கது. ஸ்திரமான கொள்கையுடைய எங்கள் பிரதமர் சம்பள ஆணைக்குழுவின் இடைக்காலச் சிபார்சுகளை நிச்சயமாக அமுல் நடத்துவார் என்ற நம்பிக்கை எனக்குண்டு. அவ்விதமான ஒரு நம்பிக்கை இன்று நாட்டு மக்களுக்கும் இருக்கின்றது.

கூட்டுறவு இயக்கம் பற்றி அரச ஆணைக் குழுவின் சிபார்சுகள் கவனமாகப் பரிசீலனை செய்யப்படும் என்று சிம்மாசனப் பிரசங்கம் தெரிவிக்கின்றது. இதைக் கவனமாகப் பரிசீலனை செய்து கூட்டுறவுத் துறையை நல்ல நிலைக்குக் கொண்டுவரத் தேசிய அரசாங்கம் முயற்சி செய்ய வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன். வேலை அற்றிருக்கும் பட்டதாரிகளுக்குப் பொதுத் துறை, தனியார் துறை இரண்டிலும் வேலை வாய்ப்பளிப்பதற்கான சந்தர்ப்பங்களை அரசாங்கம் ஏற்படுத்தி வருகின்றது. இன்றைய பத்திரிகைகளில் வைத்திய பட்டதாரிகளுக்குக் கூடுதலான நியமனங்கள் வழங்கவேண்டுமென்று கௌரவ பிரதமர் அவர்கள் கௌரவ சுகாதார அமைச்சர் அவர்களுக்கு உத்தரவு இட்டிருப்பதாகச் செய்திகள் வெளிவந்துள்ளன. இது மிகவும் மகிழ்ச்சிக்குரியது. வேலையில்லாத் திண்டாட்டப் பிரச்சினையைத் தீர்க்கவும் வாழ்க்கைச் செலவுப் பிரச்சினைகளைக் குறைக்கவும் அரசாங்கம் மும்முரமாக நடவடிக்கை எடுத்து வருவதும் மகிழ்ச்சிக்குரியது.

இலங்கையில் அரச கல்வி முறையின் நூற்றாண்டுவிழா நாடளாவிய ரீதியிலும் விரைவில் கொண்டாடப்பட இருக்கின்றது. இதற்கான நடவடிக்கைகளைக் கல்வி இலாகாவும் கல்வி அமைச்சும் எடுத்து வருவதையும் நாம் பாராட்டாமல் இருக்க முடியாது.

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

சபாநாயகர் அவர்களே, மத்திய கிழக்குப் பிரச்சினையையிட்டு எதிர்க் கட்சியினர் தாங்களே சமாதானப் பிரியர்கள், தங்களால்தான் சர்வதேசப் பிரச்சினைகளைத் தீர்க்க முடியும் என்ற விதமாக வீரூப்புப் பேசுகின்றார்கள். அரசாங்கம் மத்திய கிழக்குப் பிரச்சினைகளில் தனது பூரண ஒத்துழைப்பை அறபு நாடுகளுக்கு நல்கிவருவதை உலகம் அறியும். இஸ்ரவேலின் ஆக்கிரமிப்பை கண்டிக்குமுகமாக நேற்று எனது நண்பர் மூதூர் தொகுதியின் இரண்டாவது பிரதிநிதி (ஜனப் ஏ. எல். ஏ. மஜீத்) பேசினார். அவர் பேசும்பொழுது இந்தப் பிரச்சினையில் பிரதமர் அவர்களின் நிலையைப் பாராட்டினார். அரசாங்கக் கட்சியிலுள்ள முஸ்லிம் பிரதிநிதிகளைப் பாராட்டினார். எதிர்க் கட்சித் தலைவியைப் பாராட்டினார். முஸ்லிம் லீக்கைப் பாராட்டினார். இஸ்லாமிய சோசலிச முன்னணியையும் பாராட்டினார். இஸ்ரவேலின் ஏகாதிபத்தியக் கொள்கையை முறியடிக்க தாம் கொண்டுவந்துள்ள திருத்தப் பிரேரணையை எல்லா முஸ்லிம் அங்கத்தவர்களும் ஆதரிக்க வேண்டுமென்று அவர் தமது பேச்சில் கேட்டுக்கொண்டார். அவருக்கு நான் கூறுவது என்ன வென்றால் எங்களுடைய தேசிய அரசாங்கம் மத்திய கிழக்குப் பிரச்சினையில் திட்டவட்டமான கொள்கைகளைக் கடைப்பிடித்து வந்திருக்கின்றது. எங்கள் பிரதமர்கூட சமீபத்தில் ஐக்கிய அறபுக் குடியரசுக்கு நேரில் சென்று ஐக்கிய அறபுக் குடியரசின் ஜனாதிபதி கமால் அப்துல் நஸார் அவர்களை நேரில் சந்தித்துத் தமது பூரண ஒத்துழைப்பைத் தெரிவித்துள்ளார். அதே நேரத்தில் இஸ்ரவேலின் ஆக்கிரமிப்பைக் கண்டித்தும் அறபு மக்கள் தாங்கள் இழந்த புனித பிரதேசங்களை மீட்கத் தமது பூரண ஒத்துழைப்பைத் தெரிவித்தும் பேசியுள்ளார். எனவே இஸ்ரவேலின் விஷயத்தில் எதிர்க் கட்சியினருக்கு எவ்வளவு ஆர்வம் இருக்கின்றதோ அதைப்போன்றளவு ஆர்வம் அரசாங்கத்துக்கும், இந்த நாட்டு முஸ்லிம்கள் அனைவருக்கும் இருக்கின்றது என்பதை நான் மிகவும் ஆணித்தரமாகக் குறிப்பிட விரும்புகிறேன்.

நேற்றைய தினம் எனது நண்பர் பேசுகையில் தாம் மட்டுந்தான் இஸ்ரவேலின் ஆக்கிரமிப்பைக் கண்டிப்பதாக அவர் கருதுவதாக எனக்கு விளங்கியது. அவருக்கு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලී මයා.]

ඥාපකම් இருக்குமோ என்னவோ தெரியாது 1967 ஆம் ஆண்டு கிண்ணியாவில் 18.6.67 இல் ஒரு பெரிய பகிரங்கக் கூட்டத்தில் இஸ்ரவேலின் ஆக்கிரமிப்பை அதே பிரதிநிதியும் நானும் கண்டித்து இருக்கிறோம். அடுத்தது மத்திய கிழக்குப் பிரச்சினை பற்றி அவர் குறிப்பிடுகையில் இஸ்ரவேலுடன் ராஜதந்திரத் தொடர்புகளை இரத்து செய்யவேண்டுமென்ற பிரேரணைக்கு அரசாங்கக் கட்சியிலுள்ள முஸ்லிம் அங்கத்தவர்கள் யாவரும் ஆதரவு தரவேண்டுமென்று கேட்டுக் கொண்டார். இன்று நான் எதிர்க்கட்சியினரைப் பார்த்துக் கேட்க விரும்புவது என்னவென்றால், நமது அண்டை நாடாகிய இந்தியா, இஸ்ரவேலுடன் இராஜதந்திரத் தொடர்புகளைத் துண்டித்து விட்டதா? அடுத்தது, சோவியத் ரஷ்யாதான் பல ஆண்டுகளுக்கு முன்னர் இஸ்ரவேலை ஐக்கிய நாடுகள் சபைக்கு ஒரு பிரதிநிதியாகத் தெரிவு செய்தது. ஆனால், இன்று அரசியல் ஆசை கொண்டே சோவியத் ரஷ்யா, இஸ்ரவேலுக்கு அதன் கண்டனத்தைத் தெரிவித்துக் கொண்டிருக்கின்றதென்பதை எதிர்க்கட்சியினர் அறிவார்களோ என்னவோ தெரியாது.

நேற்று மூதூர் இரண்டாவது அங்கத்தவர் பேசும் பொழுது, இந்தச் சபையிலுள்ள முஸ்லிம் அங்கத்தவர்கள் எல்லோரும் இஸ்ரவேலைக் கண்டிக்கும் பிரேரணையை ஆதரிக்க வேண்டுமென்று குறிப்பிட்டார். அந்தப் பிரேரணையைத் தனிப்பட்ட முறையிலே கொண்டு வந்தால் நிச்சயமாக இங்குள்ள முஸ்லிம் பிரதிநிதிகள் அனைவரும் மட்டுமல்ல, தேசிய அரசாங்கமும் அதற்குப் பூரண ஒத்துழைப்பைக் கொடுக்கும் என்ற நம்பிக்கை எனக்குண்டு. ஆனால், இந்த சிம்மாசனப் பிரசங்கத்துக்கு எதிராக, இந்த அரசாங்கத்தில் நம்பிக்கையில்லையென்ற அடிப்படையிலே, இந்த அரசாங்கத்திற் கெதிராக கொண்டுவரப்பட்டிருக்கும் திருத்தப் பிரேரணைகளுடன் சேர்த்து மேற்படி திருத்தப் பிரேரணையையும் கொண்டுவந்திருக்கிறபடியால் அதனை நாம் எப்படி ஆதரிக்க முடியும்? ஆனால், இஸ்ரவேலுக்கு எதிர்ப்பைத் தெரிவிப்பதில், கண்டிப்பதில் எங்கள் பூரண ஒத்துழைப்பு என்றும் உண்டு என்பதைச் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

நண்பர் மூதூர் இரண்டாவது பிரதிநிதி அவர்கள் ஒரு காலத்தில் அரசாங்கக் கட்சியிலே இருந்தபொழுது, வியட்நாம் சம்பந்தமாக, ஐக்கிய தேசியக் கட்சியும் மற்றும் எதிர்க்கட்சிகளும் சேர்ந்து ஒரு பிரேரணையைக் கொண்டுவந்தன. அதாவது, அமெரிக்க ஆதிக்கம் வியட்நாமிலிருந்து வெளியேற வேண்டும் என்ற பிரேரணை கொண்டுவரப்பட்டது. அந்த நேரத்திலே அரசாங்கக் கட்சியினர் அந்தப் பிரேரணைக்கு விரோதமாக தங்கள் தீர்ப்பைத் தெரிவித்தார்கள். இதனை நண்பர் மறந்துவிட்டாரோ என்னவோ தெரியாது.

முஸ்லிம் சமுதாயம் மட்டுமல்ல, சமாதானத்தை விரும்பும் அத்தனைபேரும், அறபு மக்கள் இழந்த தங்கள் பிரதேசங்களை மீட்கும் வரை இஸ்ரவேலுக்கெதிராகத் தங்கள் கண்டனத்தைத் தெரிவித்துக் கொண்டிருப்பார்கள். ஐக்கிய நாடுகள் சபையிலே கூட, தேசிய அரசாங்கத்தின் பிரதிநிதி இவ்விஷயம் பற்றித் திட்டவட்டமாக எமது நாட்டின் கொள்கையைக் கூறியிருக்கிறார். சமீபத்திலே மதிப்புக்குரிய பிரதமர் அவர்கள், ஐக்கிய அறபுக் குடியரசின் ஜனாதிபதி கமால் அப்துல் நஸார் அவர்களின் அழைப்புக்கிணங்க அங்கு விஜயம் செய்தபோது தெரிவித்த கருத்துக்களை நாம் சுருக்கமாக வாசித்துக்காட்ட விரும்புகிறேன் :

"The Prime Minister of Ceylon expressed his strong support for the cause of the Arab peoples. He reaffirmed his country's position that Israel's forces should withdraw unconditionally from Arab territory to positions they occupied prior to June 5th, 1967.

The President of the United Arab Republic expressed the gratitude and deep appreciation of the people and government of the United Arab Republic for the firm stand taken on these issues by the Prime Minister and people of Ceylon."

மத்திய கிழக்குப் பிரச்சினையில் எமது அரசாங்கத்தின் நிலை எவ்விதம் இருக்கின்றதென்பதை அறிய இந்தக் கூற்று மட்டும் போதும் என்பதை எதிர்க்கட்சியினர் மனதில் வைத்துக் கொள்ள வேண்டும்.

அடுத்ததாக, தேர்தல் நெருங்கிக் கொண்டிருப்பதனால் சிலர் இனத் துவேஷப் பிரச்சினைகளை மக்கள் மத்தியில் கிளப்பப் பார்க்கின்றார்கள். இனத்துவேஷப் பிரச்சினைகளைக் கிளப்பி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மக்களை உணர்ச்சிவசப்படுத்துவது மிகவும் இலகுவான காரியம். ஆனால், அதனைத் தூண்டி விட்டாலோ எரிகிற நெருப்பில் எண்ணெய் வார்ப்பது போன்றுதான் வந்து முடியும் என்பதைக் குறிப்பிட வரும்புகிறேன். இன்னும் சிலர், திராவிட முன்னேற்றக் கழகத்தைத் தடைசெய்யவேண்டுமென்று கூச்சல் போட்டுக்கொண்டிருக்கிறார்கள். காலஞ்சென்ற தமிழ்நாடு முதலமைச்சர் திருவாளர் அண்ணாத்துரை அவர்களும் தற்போதைய முதலமைச்சர் திருவாளர் கருணாநிதி அவர்களும் தமிழ்நாடு திராவிட முன்னேற்றக் கழகத்துக்கும் இலங்கையிலுள்ள திராவிட முன்னேற்றக் கழகத்துக்கும் எதுவித தொடர்பும் இல்லையென்றும் தமிழ்நாடு திராவிட முன்னேற்றக் கழகம் எதுவிதத்திலும் இலங்கையின் உள்நாட்டு விஷயங்களில் தலையிடப் போவதில்லையென்றும் பலமுறை கருத்துத் தெரிவித்திருக்கிறார்கள். இன்று சிலர் விரும்புவது போல நாம் திராவிட முன்னேற்றக் கழகத்தைத் தடைசெய்ய வேண்டுமானால் அவசர காலச் சட்டத்தை அமுல் நடத்த வேண்டும். அந்தச் சட்டத்தில் மூலமாகத்தான் இந்தக் கட்சியைத் தடைசெய்ய முடியும். அப்படியான நிலை ஏற்பட்டால், திராவிட முன்னேற்றக் கழகம் மாத்திரமல்ல, இன்னும் பல சர்வதேசத் தொடர்புள்ள அரசியற் கட்சிகளையும் தடைசெய்ய வேண்டிய நிலை ஏற்படும். இதற்காக எதிர்க் கட்சியினர் அவசர காலச் சட்டத்தை அமுல் நடத்த ஒத்துழைப்பார்களா என்று கேட்க விரும்புகிறேன்.

இன்று எதிர்க் கட்சியில் உள்ளவர்களிற் சிலர் சோசலிசம் பேசிக் கொண்டு வருகிறார்கள். சோசலிசம் பேசுகிறவர்களில் சிலர் திராவிட முன்னேற்றக் கழகக் கூட்டங்களிலும் பங்குபற்றி வருகிறார்கள். இந்தச் சந்தர்ப்பத்திலே ஒன்றை ஞாபகப்படுத்த விரும்புகிறேன். தமிழக முதலமைச்சர் அண்ணாதுரை அவர்கள் காலமானது குறித்து அவருக்கு இந்தப் பாராளுமன்றத்திலே அனுதாபம் தெரிவிக்க எத்தனித்த சிலர் அம் முயற்சியில் தோல்வியடைந்தார்கள். என்னுடைய பகுதியில் நடைபெற்ற அனுதாபக் கூட்டங்களில் எதிர்க் கட்சியைச் சேர்ந்த பிரமுகர்கள் பலர் முக்கிய பேச்சாளர்களாகப் பங்குபற்றி காலஞ்சென்ற முதலமைச்சர் அண்ணாத்துரைக்கு இலங்கைப் பாராளுமன்றத்திலே அனுதாபம் தெரிவிக்காதது கண்டனத்துக்குரியது என்றெல்லாம் விரமுழக்கம் செய்துள்ளார்கள். இவற்றையெல்லாம் பார்க்கும் பொழுது திராவிட முன்னேற்றக் கழகம் சம்பந்தமாக எதிர்க் கட்சியினருடைய நிலை என்ன என்று கேட்க ஆசைப்படுகிறேன்.

சபாநாயகரவர்களே, நான் அதிக நேரம் பேச விரும்பவில்லை. இன்று நாங்கள் நமது நாடு மறுமலர்ச்சியடைய வேண்டும்; நாட்டில் ஜனநாயகம் பாதுகாக்கப்பட வேண்டும்; இந்த நாட்டில் வாழுகிற அனைவரும் பயமின்றி, சந்தோஷமாக வாழ வேண்டும் என்றுதான் விரும்புகிறோம். இந்த அடிப்படையிலே தான் தேசிய அரசாங்கம் சேவை செய்து கொண்டு வருகிறது. ஆளும் கட்சியைப் பயமுறுத்தி தான் விரும்பியபடி ஆட்சி வைக்க வேண்டும் என்று ஓர் இனம் நினைத்தால் அந்த இனத்தினர் நிச்சயமாக ஏமாற்றத்தையே அடைவார்கள் என்பதை இந்தச் சந்தர்ப்பத்திலே சுட்டிக் காட்டி, ஆளும் கட்சியைத் தெரிவு செய்யும் பொறுப்பு முற்றுக நாட்டு மக்கள் அத்தனை பேர்களிலுமே தங்கியிருக்கிறது, ஒரு இனத்தில் மாத்திரம் தங்கியிருக்கவில்லை என்பதையும் எடுத்துக் கூற விரும்புகிறேன்.

நேற்றைய தினம் பேசும் பொழுது சில பிரதிநிதிகள் கௌரவ தொழில் அமைச்சர் அவர்களுடைய பெயரை இழுத்து ஏதேதோ வெல்லாம் கூறினார்கள். கௌரவ தொழில் அமைச்சர் என்னுடைய சமுதாயத்தைச் சேர்ந்தவர். ஒரு முஸ்லிம் பிரமுகர். அவர் இஸ்ரவேல் பிரச்சினையில் தம்முடைய ஆதரவை அளிக்கவில்லை என்றும் ஜஸ்திபதி நாசர் அவர்களை ஒரு சர்வாதிகாரி என்று ஒரு சமயத்திலே இந்தச் சபையிலே எடுத்துக் கூறினர் என்றும், பின்னர் ஐக்கிய அறபுக் குடியரசுக்கு விஜயம் செய்து அவரிடம் மன்னிப்புக் கோரினர் என்றும் ஒரு பிரதிநிதி கூறினர். அது முழுக்க முழுக்கப் பொய் என்பதை நான் இந்தச் சபையிலே எடுத்துக் கூற ஆசைப்படுகிறேன். அப்படிக் கூறிய பிரதிநிதி ஒரு காலத்தில் தமிழ் மொழி மசோதாவை நான் திட்டவட்டமாக ஆதரிப்பேன். தமிழ் மொழி என்னுடைய தாய் மொழி. தமிழ்மொழி மசோதாவை நான் ஆதரிக்கப் போகிறேன் என்று தேசிய அரசாங்கத்தின் அமைச்சர்கள் பலரிடம் சென்று வாக்குறுதி கொடுத்து, தமிழ்மொழி மசோதா மீது வாக்கெடுப்பு நடைபெறும் தினத்தன்று விசேட

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

விமானத்திலே கொழும்பு வந்துவிட்டு, வாக் களிக்கும் நேரத்தில் நடந்து கொண்டதைப் போல அல்ல எங்களுடைய தொழில் அமைச் சர் என்பதை நான் குறிப்பிட்ட பிரதிநிதிக்கு எடுத்துக் கூற ஆசைப்படுகிறேன்.

சபாநாயகரவர்களே, இந்தத் தேசிய அர சாங்கம் திட்டவட்டமாக நாட்டுக்கு நல்ல சேவைகள் பலவற்றைச் செய்து வருகிறது. இந்த அரசாங்கத்தினுடைய நல்ல சேவையை உணர்ந்துதான் மக்கள் அந்த அரசாங்கத்தி னுடைய முழு ஐந்து வருட காலத்திலும் ஆட்சி புரிய அதற்குச் சந்தர்ப்பத்தைக் கொடுத்திருக்கிறார்கள்.

"The whole of Sri Lanka is my home and its people my family" is the motto of our Prime Minister. The aim of our Prime Minister is to protect democracy in a United Ceylon and I am confident that with this motto he will be back to present the next Throne Speech as the Prime Minister of Sri Lanka in the Seventh Parliament.

අ. භා. 2.48

නීල් ද අල්විස් මයා.

(திரு. நீல் டி அல்விஸ்)

(Mr. Neal de Alwis)

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව 1965 අවුරුද්දේදී ජනතාවට පොරොන්දු රාශියක් දුන්නා. ඒ පොරොන්දු පිළිබඳ විස්තරයක් අපට දෙනවාය කියා කර්මාන්ත හා ධීවර ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා වරින් වර කීවා මිස ඒවා ගැන වචනයක්වත් කිව්වේ නම් නැහැ. මේ රාජාසන කථාවේ පමණක් නොවෙයි, මීට පෙර රාජාසන කථාවලත් සඳහන් කරනු ලැබූ දෙයක් තමයි ජනතා වගේ ප්‍රශ්න විසඳීමට ආණ්ඩුව වැඩ පිළිවෙළ සකස් කරන්නේ කොයි ආකාරයටද යන්න පැහැදිලි කරන එක. ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ රාජාසන කථා කීපයකටම අපි ඇහුම්කන් දුන්නා. ඒවායේ කොහොමට සඳහන් වුණත් අද තත්ත්වය ගැන කල්පනා කර බලන විට අපට පැහැදිලි කරුණක් තමයි සාමාන්‍ය දුප්පත් ජනතාවට නම් මේ ආණ්ඩුවෙන් සහනයක් ලැබී නැත කියන එක. ලංකාවේ සිටින ජාවාරම්කාරයින්ට හා ධනපති පන්තියේ ටික දෙනෙකුට නම් මේ ආණ්ඩුවෙන් විශාල ප්‍රයෝජන ලැබුණාය යන්න අපට පැහැදිලි කරුණක්. අවුරුදු 5 කට පසුව අපට පැහැදිලිව පෙනෙන්නේ ඔන්න ඔය තත්ත්වයයි. එයින් මා අදහස් කළේ මේ ආණ්ඩුව තම පොරොන්දු නියම විධියට ඉටුකළේ නැත, නියම ප්‍රතිපත්තිවල ගමන් කළේ නැත කියන එක මේ ගරු සභාවට පෙන්වා දීමටයි. සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුව මගින් මුදල් අතින් ඉතාමත්ම පහත් තත්ත්වයකට මේ රට ගෙනාවාය කියා වර්තමාන අගමැතිතුමා 1965 අවුරුද්දේදී රට පුරාම ප්‍රචාරයක් ගෙන ගියා. එමෙන්ම තමාට බලය ලැබුණොත් ඒ දුර්වල මුදල් තත්ත්වය හරිගස්සා දෙනවාය කියා එතුමා ඒ කාලයේ පොරොන්දු වුණා. එහෙත් මේ ආණ්ඩුව මුදල් තත්ත්වය හරිගැස්සුවේ කොහොමද යන්න මැද කොළඹ තුන් වැනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) ඊයේ මේ ගරු සභාව මාර්ගයෙන් රටට විස්තර කර දුන්නා. කොටින්ම, 1964 දී දුර්වල මුදල් තත්ත්වයක් තිබුණාය, ඊට වඩා සාර්ථක වැඩ පිළිවෙළක් ගෙන ගොස් එය ශක්තිමත් කරනවාය කී මේ ආණ්ඩුව ගෙන ගිය වැඩ පිළිවෙළ අනුව ඇති වූ මුදල් තත්ත්වය ගැන මම කියන්නම්.

1964 අවුරුද්දේ විදේශ ණය හා ජාතික ණය රුපියල් දශ ලක්ෂ 34 යි. එය ඉංග්‍රීසියෙන් කියන්නේ Rs. 34 million කියලයි. ඒ තත්ත්වය හරිගස්සනවාය, ණය ප්‍රමාණය අඩු කරනවාය, කියා පොරොන්දු දුන් මේ ආණ්ඩුව පැවැති 1968 අවුරුද්දේ ණය මුදල රුපියල් දශ ලක්ෂ 65 යි. එයින් පෙනෙන්නේ කුමක්ද? දුර්වල මුදල් තත්ත්වය හරි ගස්සනවාය කියා තමුන්නාන්සේලා පොරොන්දුවක් දුන් නමුත් පසුගිය අවුරුදු හතර හමාර තුළදීම එය හරිගස්සන්නට තමුන්නාන්සේලාට බැරි වුණා. තත්ත්වය එදාටත් වඩා නරකයි. දෙගුණය කින් වැඩි වී තිබෙනවා. ඉතින් අපි මේ ණය ගෙවන්නේ කවදාද? ගරු මුදල් ඇමතිතුමාට අවුරුදු 10 යේ දරුවෙක් සිටිනවා නම් ඒ දරුවාට අවුරුදු 60 පිරුණාට පසුවයි අපට මේවා ගෙවන්නට පුළුවන් වන්නේ කියන එක පැහැදිලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නට කැමතියි. අවුරුදු දෙකක දරුවකු ඉන්නවා නම් ඒ දරුවාගේ වයස අවුරුදු 52 වෙයි, මේ ණය ගෙවන විට. ලක්ෂ 2,300 ක විදේශ විණිමය ණය අරගෙන තිබෙන්නේ පිටි ගෙන්වන්නයි. එහෙත් තමුන්නාන්සේලා නිතරම කියන්නේ වගා ව්‍යාපාරය සාර්ථක වී තිබෙනවාය කියායි. මාසයෙන් මාසයට, අවුරුද්දෙන් අවුරුද්දට වී වගාව සාර්ථක වන බව ගුවන් විදුලියෙන්, ධනපති පත්‍රයෙන් නිතරම කියනවා. එහෙත් ඇමෙරිකන් පිටි ගෙන්වීමට රුපියල් ලක්ෂ 2,300 ක ණය මුදලක් අරගෙන තියෙනවා. ඒ පිටි ගැනත් මා විස්තරයක් කරන්නට ඕනෑ. ඒ පිටිවලින් රොටි හදනවා නම් ඒ රොටි කන්නට බැරි බවයි, අපේ ජනතාව කියන්නේ. ණයට මුදල් අරගෙන තමුන්නාන්සේලා පිටි ගෙන්වනවා නම් ජනතාවට කන්නට පුළුවන් පිටි වගීයක් ගෙන්වන්න ඕනෑ. විශාල පොළියක් ගෙවන්නට විශාල ණය මුදලක් අරගෙන ඒ ණය මුදලින් මේ රටේ ජනතාවට කන්නට බැරි පිටි—වෙන රටවල මහ මුහුදේ දමන පිටි—තමුන්නාන්සේලා ගෙන්වනවා. ඒ පිටි ගෙන්වීම තමුන්නාන්සේලා අද වන තෙක් නවත්වා නැති බව කණගාටුවෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ.

වී වගාව ගැන තමුන්නාන්සේලා කථා කරනවා. වී වගාවට අවශ්‍ය පෝර සඳහා තමුන්නාන්සේලා ලක්ෂ 150 ක ණයක් අරගෙන තියෙනවා. එහෙත් පොහොර සඳහා වියදම් කළ ප්‍රමාණයට අස්වැන්න වැඩි වී නැති බව මම තමුන්නාන්සේට පෙන්නුම් කර දෙන්නම්. වාහන ගෙන්වීමට ලක්ෂ 7 ක් වියදම් කර තිබෙනවා. මිනිමෝක් පමණක් නොවෙයි, වෙනත් වාහන ගෙන්වීමටත් වියදම් කර තිබෙනවා. වාහන 8,000 ක් පමණ ලංකාවට ගෙනැවිත් තිබෙනවා. එහෙත් මන්ත්‍රීවරුන්ට නම් වාහන නැහැ. 1964 අවුරුද්දේදී තමුන්නාන්සේලා මොනවද කිව්වෙ? එදා නිබුණු ආණ්ඩුවේ ඇමතිවරුන්ට කාර් දුන්නාය, නිවාස දුන්නාය, කියා තමුන්නාන්සේලා ප්‍රචාරය කළා. අද ඇමතිවරුන් එක වාහනයක් නොවෙයි, වාහන දෙක තුනක් පාවිච්චි කරනවා. ඇමතිවරුන්ට, උප ඇමතිවරුන්ට

පමණක් නොවෙයි, ආණ්ඩුවේ නිලධාරීන්ටත් වාහන දී තිබෙනවා. ඇමතිවරුන්ගේ ලේකම්වරුන්ටත් නිවාස දී තියෙනවා.

කාර් ගෙන්වන්නට මුදල් නැත්නම් අපි ලැස්තියි පයින් වුනත් ගමන් කරන්නට. රටේ බොරු ප්‍රචාරය කර, ඇමතිවරුන්ට, උප ඇමතිවරුන්ට පමණක් වාහන දෙනවා; ආණ්ඩුවේ නිලධාරීන්ට වාහන දෙනවා; දිසාපතිවරුන්ට වාහන දෙනවා. මන්ත්‍රීවරුන් වන අපට පමණක් වාහනයක් ගන්න බැහැ. අපට තියෙන්නේ පරණ වාහනයි. ඒ වාහනවලින් කඳුකරයේ ගමන් කරන විට, ඒ පරණ වාහනවල හදියට ඕරේක් නැත්නම් අපට අනතුරක් සිදු වන්නට පුළුවන් තත්ත්වයක් තියෙනවා. පාර දිහා බැලුවාම තමුන්නාන්සේලාට පෙනෙනවා. සල්ලිකාරයන්ට, ජාවාරම්කාරයන්ට කාර් ලබා ගන්නට වැඩ පිළිවෙළ ඇති කර තිබෙන බව. එසේ නම් මන්ත්‍රීවරුන්ට කාර් ලබා ගන්නට වැඩ පිළිවෙළක් සකස් කර නැත්තෙ ඇයි? මේක කෑත වැඩ පිළිවෙළක්. තමුන්නාන්සේලාගේ අවුරුදු හතරහමාරක පාලන කාලයෙන් පස්සේ අද නැන ලැබී තිබෙන්නේ ජාවාරම්කාරයන්ටත් පුළුවන් කාරයන්ටත් පමණයි. අද සාමාන්‍ය ජනතාවගේ තත්ත්වය කුමක්ද? තමන්ගේ ආහාර පවා සපයා ගැනීමට අවශ්‍ය මුදල් සොයා ගන්නේ කෙසේද කියන එකයි, ඔවුන්ගේ ලොකුම ප්‍රශ්නය. අපට ඇපල්, මුද්‍රප්පලම් වුවමනා නැහැ. දවසෙන් දවස බඩු මිල නගිනවා නම් තමුන්නාන්සේලා ඒ ගැන සලකන්නෙ නැත්තේ ඇයි කියායි, මා අහන්නෙ. ඒ ගැනත් මම විස්තරයක් දෙන්නම්.

කම්කරු අමාත්‍ය උප ඇමතිතුමා අද උදේ වගාව ගැන විස්තර කළා. 1968 වර්ෂයේදී මුළු වී නිෂ්පාදනය බුසල් ලක්ෂ 645 ක් හැටියට මේ රාජාසන කථාවේ සටහන් වී තිබෙනවා. එහෙත් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ගණන් බලා ප්‍රකාශ කෙළේ වී බුසල් ලක්ෂ 680 ක් ඒ වර්ෂයේදී නිපදවා තිබෙන බවයි. මේවා කරකැවෙන විධිය ගැන කල්පනා කරන විට එවැනි වෙනසකුත් වෙන්නට ඉඩ ඇති. කොයි තරම් වී නිෂ්පාදනය කළාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]

කිව්වත් මිනිසුන්ට කන්න හාල් නැහැ. වී මිල මෙන්ම හාල් මිලත් බැහැලා නැහැ. ඉස්පිරිතාලවල ප්‍රතිකාර ගන්න රෝගීන්ට කන්න බත් ටිකක් ලැබෙන්නෙත් නැහැ. පිටරටවලින් ගෙන්වන පිටි ටිකක් වත් සොයා ගන්නට බැහැ. පිටි ගෙන්වා ගන්නෙත් සුළු පටු ප්‍රමාණවල් නොවෙයි. කෝටි ගණන් මුදල් වැය කර පිටරටින් පිටි ගෙන්වනවා.

අවුරුදු හතරක කාලයක වී නිෂ්පාදනය පිළිබඳ ඉලක්කම් මේ රාජාසන කථාවේ තිබෙනවා. 1965, 1966, 1967 සහ 1968 යන අවුරුදු හතරේ වී අස්වැන්න ප්‍රමාණය රජය ඉදිරිපත් කරනවා. අප කවුරුත් පාහේ දන්නා කාරණයක් තමයි නවීන ක්‍රම අනුව ගොවිතැන් කරන නිසා අද මුළු ලෝකයේම වී අස්වැන්න වැඩි වී තිබෙන බව. එය පිළිගත යුතුව තිබෙනවා. ඒ කාරණය වාර්තාගත වෙලා තියෙනවා. සාකච්ඡාවල සටහන් බලන විටත් අපට ඒ කාරණය ඔප්පු වෙනවා. මුළු ලෝකයේම වී අස්වැන්න වැඩි වී තිබෙන නමුත් මේ ආණ්ඩුව කියන්නේ අපේ අගමැතිතුමා මහා ලොකු සපත්කමක් කළාය කියලයි. ලෝකයේ වී අස්වැන්න ක්‍රමයෙන් වැඩි වේගත ආ අන්දම පෙන්වන ප්‍රස්තාර සටහනක් ඇන්දොත් ලංකාවේ වී නිෂ්පාදනයේ ඒ තරම් වැඩි වීමක් සිදු වී නැති බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති. ධනපති පුවත්පත්වල බොරු ප්‍රචාර කරන නමුත් ඒවා විශ්වාස කරන තරම් මෝඩ මිනිසුන් දැන් ඉන්නවා නම් ඉන්නේ ඉතාමත් ටික දෙනෙක් පමණයි. ඒවා විශ්වාස කරන්නට පුළුවන්කම තියෙන්නේ ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලා වාගේ ටික දෙනකුට පමණයි.

මේ රාජාසන කථාවේ අවුරුදු හතරක වී අස්වැන්න පිළිබඳ ඉලක්කම් දී තිබෙනවා. ඊට පෙර අවුරුදු හතරක් තුළ ලැබුණු වී අස්වැන්න ප්‍රමාණයත් සමග ඒ ඉලක්කම් සන්සන්දනය කර බලමු. මේ ආණ්ඩුව කාලයේ දී ඇති වූ වෙනස කොයි ආකාරයේ එකක්දැයි එවිට අපට තේරුම් ගන්නට පුළුවනි. 1957 අවුරුද්දේ වී අස්වැන්න ප්‍රමාණය බුසල් ලක්ෂ 315 යි. 1958 දී වී බුසල් ලක්ෂ 366 යි. 1959 දී වී බුසල් ලක්ෂ 364 යි. 1960 දී වී බුසල් ලක්ෂ 430 යි. 1957 සිට 1960 දක්වා අවුරුදු හතර තුළ ලැබුණු වී අස්වැන්න ප්‍රමාණය බුසල් ලක්ෂ 1475 ක් බව මේ ගණන් එකතු කළාම පෙනී යනවා ඇති. ඊට පසු ඇති හතර අවුරුද්දේ අස්වැන්නත් සලකා බලමු. 1961 දී වී බුසල් ලක්ෂ 431 ක් ලැබුණා. 1962 දී වී බුසල් ලක්ෂ 480 ක් ලැබුණා. 1963 දී වී බුසල් ලක්ෂ 492 ක් ලැබුණු අතර 1964 දී වී බුසල් ලක්ෂ 505 ක් ලැබුණා. ඒ අවුරුදු හතරෙ අස්වැන්න එකතු කළාම—

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
1965 ?

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
කරුණා කර ඇහුම්කන් දෙන්න. පටල වන්නට එපා. අපි තමුන්නාන්සේලාට මේවා පැහැදිලි කර දෙන්නම්.

ඒ අවුරුදු හතරෙ එකතුව බුසල් ලක්ෂ 1908 යි. ඔන්න තමුන්නාන්සේලාගේ කෙරුවාව. 1965 අවුරුද්ද ගැන පමණක් රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. එමනිසයි මා අවුරුදු හතරෙන් හතර ගත්තෙ. 1965 අවුරුද්දේ නිෂ්පාදනය වූ වී බුසල් ප්‍රමාණය ලක්ෂ 363 යි ; නිෂ්පාදනය බැස්සා. 1966 අවුරුද්දේ නිෂ්පාදනය ලක්ෂ 457 යි. ඒ ප්‍රමාණයත් 1964 වර්ෂයේ ප්‍රමාණයට වඩා අඩුයි. 1967 අවුරුද්දේ බුසල් ලක්ෂ 549යි. ඇත්ත වශයෙන්ම මේ අළුත් සංඛ්‍යා හරිද නැද්ද කියා ලොකු සැකයක් තිබෙනවා. හරියට මේවා ගණන් බැලුවාද නැද්ද කියා අප තුළ ලොකු සැකයක් තිබෙනවා. 1968 අවුරුද්ද සඳහා තමුන්නාන්සේලා දී තිබෙන ගණන බුසල් ලක්ෂ 645යි.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)
කොහොමද වැඩේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி. அல்விஸ்)
(Mr. Neal de Alwis)

1957 සිට 1960 වන තෙක් වී බුසල් ලක්ෂ 1475 ක් නිපදවා තිබෙනවා. ඊළඟට දෙවන අවුරුදු හතර තුළ, එනම් 1961 සිට 1964 දක්වා වී බුසල් ලක්ෂ 1908ක් නිෂ්පාදනය කර තිබෙනවා. එයින් අපට පෙනෙන්නේ මා සඳහන් කළ පළමුවන වර්ෂ හතරට වඩා දෙවන වර්ෂ හතරේදී අපේ රටේ නිෂ්පාදනය වූ වී බුසල් ප්‍රමාණය ලක්ෂ 433කින් වැඩි වී තිබෙන බවයි. නමුත් තමුන්නාන්සේලාගේ පාලන කාලය තුළ, එනම් 1965 සිට 1968 වර්ෂය දක්වා වූ කාලය තුළ තමුන්නාන්සේලා ලබාගෙන තිබෙන්නේ 1961 සිට 1964 දක්වා වූ වර්ෂ හතරේ ලබාගත් අස්වැන්නට වඩා බුසල් ලක්ෂ 106ක් පමණයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
1965 ?

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி. அல்விஸ்)
(Mr. Neal de Alwis)

මුදල් ඇමතිතුමනි, මේක විහිළුවක් නොවෙයි. කරුණා කර ඇහුම්කන් දෙන්න. තමුන්නාන්සේලාගේ රාජාසන කථාවේම 1965 දක්වා ගණන් පෙන්නුම් කර තිබෙනවා. මේවා විහිළුවට ගන්නා දේවල් නොවෙයි. තමුන්නාන්සේලා අවුරුදු හතර හමාරක් ජනතාව රැවටුවා. පත්‍ර මාර්ගයෙන්, ගුවන් විදුලිය මාර්ගයෙන් බොරු කිව්වා. කොයි තරම් බොරු කිව්වාද කියනොත් ඒවා ඇත්ත හැටියට භාර ගත් මෝඩ මිනිසුන් කොටසකුත් දැන් මේ රටේ ඉන්නවා.

ඊළඟට, මේ ලක්ෂ 106 ලබා ගන්නට තමුන්නාන්සේලා තවත් කොපමණ වැඩිපුර මුදලක් වියදම් කර තිබෙනවාද කියා බලමු. තමුන්නාන්සේලාගේ කාලය තුළ පෝර්වලට විශාල මුදලක් වියදම් කර තිබෙනවා. ඒ පිළිබඳවත් මා සංඛ්‍යා ඉදිරිපත් කරන්නට සතුටුයි. 1961 අවුරුද්දේ පාවිච්චි කර තිබෙන්නේ පෝර ටොන් 29,000 යි. 1962 අවුරුද්දේ පාවිච්චි කර තිබෙන්නේ පෝර ටොන් 38,000 යි. 1963 අවුරුද්දේ පෝර ටොන් 47,000 යි. 1964 අවුරුද්දේ පෝර ටොන් 60,000 යි. 1966 අවුරුද්දේ තමුන්නාන්සේලා පෝර ටොන් 70,000 ක් පාවිච්චි කර තිබෙනවා. 1967 අවුරුද්දේ පෝර ටොන් 85,000 ක් පාවිච්චි කර තිබෙනවා. ඊළඟට, 1968 අවුරුද්දේ පෝර ටොන් 1,05,000 ක් පාවිච්චි කර තිබෙනවා. මෙසේ පෝර යොදා තිබෙනවා පමණක් නොවෙයි පාඨශාලා ශිෂ්‍යශිෂ්‍යාවන් ඔය කුඹුරුවලට බස්සා වල් නෙලීම්, පැළ සිටුවීම් යනාදිය කළ බවත් මා තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ. ඒ සමගම, කෘමිනාශක බෙහෙත් වගීවලටත් තවත් විශාල මුදලක් පාවිච්චි කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ වැඩිපුර ලක්ෂ 106 ලබා ගැනීමට ඒ මුදලට අමතරව තවත් විශාල මුදලක්, අපට නොපෙනෙන තවත් විශාල මුදලක් මේ ආණ්ඩුව වියදම් කර තිබෙන බව කාටත් පෙනෙන්නට තිබෙන කාරණයක්. එතකොට මේ ආණ්ඩුවේ අවුරුදු හතරක පාලන කාලයත්, මැතිනියගේ ආණ්ඩුවේ අවුරුදු හතරක කාලයක් ගැන සසඳා බලන විට මේ ආණ්ඩුව වී වගාවෙන් ලබාගෙන තිබෙන වැඩිපුර අස්වනු ප්‍රමාණය බුසල් ලක්ෂ 106 යි. ඒ බව තමුන්නාන්සේලාගේම ගණන් හිලව් අනුව පෙනී යනවා.—[බාධා කිරීමක්] තමුන්නාන්සේලාට ලැබෙන්නේ ඡන්ද නොව ඉළපතයි. සෑම දාම බොරු කරන්නට පුළුවන්කමක් නැහැ.

ගරු කථානායකතුමනි, මාස කීපයකට පමණ පෙර සමන්තුරේ වී ගබඩාවෙන් වී බුසල් ලක්ෂ 10,800 ක් නැති වුණා. ඒ වී ටික යන්නේ වෙනත් වී ගබඩාවකට. එක තැනකින් නැති වූ වී වෙන තැනකට ගියාම අස්වැන්න වැඩි වුණා යයි මේ ආණ්ඩුව කියනවා.

ගරු කථානායකතුමනි, 1965 ට පෙරදී නම් අයවැය ලේඛන ඉදිරිපත් කරන විට අපට වුවමනා ආහාර ද්‍රව්‍ය පිටරටින් ගෙන්වා ගැනීමට අවශ්‍ය විදේශ විනිමය වෙනුවෙන් රුපියල් ලක්ෂ 8,000 ක් වෙන් කළා. එහෙත් මේ ආණ්ඩුව බලයට පැමිණි පසුව ඒ මුදල රුපියල් ලක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නිල් ද අල්විස් මයා.]

6,200 දක්වා අඩු කර තිබෙනවා. මේ අතර රුපියලේ වටිනාකමත් අඩු කළා. ඉතින් කෑම ද්‍රව්‍ය අඩු වීම පුදුමයක්ද? අර රුපියල් ලක්ෂ 8,000 න් ඉතිරි කර ගන්නා ලද රුපියල් ලක්ෂ 1,800 වියදම් කෙළේ කුමන කාරණයක් සඳහාද? දුප්පත් ගැමි ජනතාවට බෙදා දීම සඳහා වෙන් කර තිබුණු ඉඩම් අක්කර 98,000 ධනපති කොම්පැනිකාරයන්ට බෙදා දී, ඊළඟට ඔවුන්ට මිනිමෝක් ආදිය ලබා ගැනීම සඳහා අර රුපියල් ලක්ෂ 1,800 යෙදෙව්වා. මේ අන්දමට අවුරුදු හතර හමාරක් රට පාලනය කළායින් පසුව අද දුප්පත් ජනතාවට ඉසිලිය නොහැකි තරමට ජීවන වියදම ඉහළ ගොස් තිබෙනවා. අවශ්‍ය ආහාර ටික ලබා ගැනීම සඳහා ආදායම සොයා ගන්නට බැරි තත්ත්වයකයි, අද දුප්පතා මුහුණ පා සිටින්නේ.

කර්මාන්ත ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා අද උදේ කථා කළා. ඔව්, කර්මාන්ත අමාත්‍යාංශයෙනුත් ලොකු හපන් කම් වගයක් කර තිබෙනවා. ලංකාවේ ධනපති පංක්තියට ඒ අමාත්‍යාංශයෙනුත් හොඳට බෙදා දී තිබෙනවා. සුළු කර්මාන්ත කාරයන් අද සුනේසුන් වෙලා. හැම අංශය කින්ම තැනක් ලැබී තිබෙන්නේ ලොකු ධනපති කොටස්වලටයි. ඔවුන් නිපදවන භාණ්ඩවලට සියයට දෙසිය බැගින්, තුන්සිය බැගින් ලාභ ගන්නට ඉඩ දී තිබෙනවා. අමු ද්‍රව්‍ය පිටරටින් ගෙන්වනවා නම් ඔවුන් නිපදවන ඒ භාණ්ඩවල මිල සීමා කරන්නට තමුන්නාන්සේලාට පුළුවන් කම තිබෙන්නට ඕනෑ. අද කමිසයකින් සියයට දෙසියක, නැත්නම් තුන්සියක ලාභයක් ලබනවා. දුප්පතුන්ට පහර ගසා ධනපතියන්ට මේ අන්දමට ලාභ ලබා ගන්නට ඉඩ දීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නේද? "Bureau of Standards" එකක් ගැනත් සඳහන් කර තිබෙනවා. මෙහි නිපදවන බඩු නියම තත්ත්වයකට සාදන්නට ඕනෑ යයි නියම කර තිබෙනවා. එහෙත් නියම විධියට බඩු සාදනවා දැයි සොයා බලන්නේ නැහැ.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பெர்ணாண்டோ)
(Mr. Denzil Fernando)

තමුන්නාන්සේලා හදාපු බිලේඩ් එක කොහොමද?

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி. அல்விஸ்)
(Mr. Neal de Alwis)

ඊට වඩා හොඳට තමුන්නාන්සේලා සාදා තිබෙනවාද? තමුන්නාන්සේලා පිට රටවලින් ඕනෑ තරම් බිලේඩ් ගෙන්වන්නට ඉඩ දී තිබෙනවා. තමුන්නාන්සේලා දැන් ජාවාරම්කාරයන්ට ඕනෑ තරම් ඉඩ දී තිබෙනවා වුවමනා අන්දමේ බිලේඩ් පිට රටින් ගෙන්වන්නට. අද ගම්බද සුළු කඩයකට ගිය විට එහි රාක්කවල අසුරා තිබෙන දේවල් දෙස බලන්න. බී.සී.සී. කොම්පැනියේ බඩුත් හෝර්ලික්ස් කොම්පැනියේ බඩුත් විකුණන්නට තිබෙනවා. තමුන්නාන්සේලා ඔය කොම්පැනි තුනට ඕනෑ තරම් හම්බ කර ගන්නට ඉඩකඩ සලසා දී තිබෙනවා. මීට කලකට ඉහත හෝර්ලික්ස්වල මිල කීයද? අද කීයද? ඉස්සර රුපියල් 2කුත් ගණනට ගන්නට පුළුවන් වුණු හෝර්ලික්ස් බෝතලය අද රුපියල් 5කුත් ගණනක් වෙනවා. මේ ධනපති කොම්පැනි තුනේ බඩු ඕනෑ තරම් මිල ගණන්වලට විකුණන්නට තමුන්නාන්සේලා ඉඩකඩ සලසා දී තිබෙනවා. ඒ කර්මාන්තකාරයන්ට සියයට 200, සියයට 300 හම්බ කරන්නට ඉඩකඩ දී තිබෙනවා. ඉතින් රාජාසන කතාවලින් පසුගිය අවුරුදු තුන හතර තුළ කී කරුණු අපි විශ්වාස කරන්නේ කෙසේද? එන්ට එන්ටම බඩු මිල ඉහළ යනවා.

ගරු කථානායකතුමනි, ඩී.ආර්.ඕ. වරුන් සහ ග්‍රාම සේවකයන් වැඩි ගණනක් පත් කරන බව කියා තිබෙනවා. ඒ තනතුරුවලට වැඩි වැඩියෙන් උදවිය පත් කරන එක හොඳයි. අද මේ රටේ සිටිනවා රටට වුවමනා නැති පිරිහිච්ච මුලාදැනීවරුන් පිරිසක්. ඒ පිරිසට රක්ෂා දීගෙන යන එකයි, මේ ආණ්ඩුව කරන්නේ. ඒකයි භයානකකම. ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා ඇමති පට්ටමක් භාර ගන්නට පෙර විරුද්ධ පාර්ශ්වයේ සිටියදී ඔය මුලාදැනීන් ගේ නොයෙකුත් දූෂණ ක්‍රියා ගැන කතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළ බව අප දන්නවා. එහෙත් අද අර ප්‍රතිපත්තියයි එතුමාට තිබෙන්නේ. අද ලංකාවේ රැකිරක්ෂා නැති තරුණයන් බොහෝ සිටිනවා. ඒ අය සිටියදී අර අන් දමේ පිරිහිච්ච, රටට වුවමනා නැති, ගම් මුලාදැනින් නැවත පත් කිරීම ගැන අපි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

ඩී.ආර්.ඕ. වරුන් සම්බන්ධයෙන් ක්‍රියාවේ යෙදවෙන පුදුම සහගත වැඩ පිළිවෙළක් තිබෙනවා. ඩී.ආර්.ඕ. කෙනෙක් වේවා, වෙනත් රජයේ නිලධාරියෙක් වේවා, හොඳට වැඩ කටයුතු කරන යම්කිසි කෙනෙක් සිටිනවා නම් ඔහුට විරුද්ධව රහස් පොලීසියෙන් රපෝර්තු ගෙන්වා ගෙන කටයුතු කරනවා. එවැනි අයට අද තැනක් නැහැ. වැදගත් සේවාවක් රටට කරන්නට පුළුවන් උදවියට අද තැනක් නැහැ. බද්දේගම ආසනයේ ඩී.ආර්.ඕ. කෙනෙක් සිටියා.

එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකිරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

නම මොකක්ද?

නීල් ද අල්විස් මයා.

(திரு. நீல் டி அல்விஸ்)

(Mr. Neal de Alwis)

මා සාමාන්‍යයෙන් නම් එළි කරන්නට කැමති නැහැ. තමුන්නාන්සේ අහන නිසා කියන්නම්. මල්ලවආරච්චි. ජල ගැල්මෙන් පීඩා විඳින ලද දුප්පත් උදවියට වන්දි ගෙවීම සඳහා වෙන් කළ මුදල් නියම අන්දමට නොගෙවා—[බාධා කිරීමක්] ගණන් පරීක්ෂක දෙපාර්තමේන්තුවට පෙනී ගියා ලක්ෂ ගණනක් මුදල් නිසියා කාර ගෙවා නැති බව.

එස්. ද එස්. ජයසිංහ මයා.

(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)

(Mr. S. de S. Jayasingha)

කොයි අවුරුද්දේද?

1963 වගෙ. එහෙත් 1964, 1965 අවුරුදු වල ඒක එළි වුණා. මා ඒ ගැන ආණ්ඩුවට පැමිණිලි කළා. ගණන් පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් සොයා බැලුවා. මා ඇමතිවරුන් කීප දෙනෙකුටත් මේ ගැන ලිව්වා. ගණන් පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ පවත්වාගෙන යද්දී ආණ්ඩුවේ නිවාඩු දවස් දෙකක් ආවා. මෙම කාර්යාලයේ "ස්ට්‍රෝං බොක්ස්" නමින් හැඳින්වෙන යකඩ පෙට්ටියක් තිබුණා. එහි ලිපිගොනු කීපයකුත් මුදල් රු. 300කුත් තිබුණා. පසුව, ගණන් පරීක්ෂක වරුන් පැමිණ බලන විට, ජල ගැලීම් සම්බන්ධ වියදම් පිළිබඳ විස්තර අඩංගු ලිපි ගොනු සියල්ලම නැති වී මුදල් රු. 300 පමණක් ඉතිරි වී තිබුණා. මා මේ ගැන ඇමතිවරුන් තුන් දෙනෙකුටත් මුදල් ඇමතිවරයාටත් රපෝර්තු කළා. මෙකී ඩී.ආර්.ඕ. වැරදි වැඩක් කර තිබුණු බව මුදල් ඇමතිතුමාත් දන්නවා. මා ඊයෙ පෙරෙයිදාත් එතුමාට ලියුමක් එව්වා. දැනට අවුරුදු 4ක් ගතවී ඇතත් මේ සම්බන්ධයෙන් කිසිවක් සිදු වී නැහැ. ආණ්ඩුවේ නීතියේ හැටියට, යම් නිලධාරියකු මෙවැනි වරදක් කළ විට ඔහුගේ වැඩ තහනම් කරනවා පමණක් නොව ඔහුට පඩි ලැබෙන්නෙත් නැහැ. එහෙත් මේ ආණ්ඩුව යටතේ මෙවැනි වැරදි කරන අලි බේරෙනවා. කුඹින් පැගෙනවා. සාමාන්‍ය දුප්පත් මනුෂ්‍යයකු මෙවැනි දෙයක් කළා නම් ඒ මිනිහා සුනේ සුන්. මා ඊයෙ පෙරෙයිදාත් මේ පිළිබඳව මුදල් ඇමතිතුමාට ලියුමක් යවා තිබෙන නිසාත්, ඒ සම්බන්ධව ක්‍රියා කරන බව මුදල් ඇමතිතුමා මට දන්වා තිබෙන නිසාත්, මීට වඩා මේ ගැන විස්තර කියන්නට අදහස් කරන්නේ නැහැ.

මේ ඩී.ආර්.ඕ. මහත්මයා ගියාට පසු වෙනත් හොඳ ඩී.ආර්.ඕ. මහත්මයකු ආවා. ඔහු ජලගැලීම් වැනි අවස්ථාවලදී හොඳ සංවිධානාත්මක වැඩ පිළිවෙළවල් ඇති කොට ඉතාම හොඳින් කටයුතු කරගෙන යද්දී උප ඒජන්ත කෙනකු වශයෙන් ගාල්ලේ කච්චේරියට මාරු කරනු ලැබුවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
ඉතින් හොඳනේ.

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
හොඳ තමයි. කුලප්පු වෙන්න එපා. මා කතන්දරේ කියන තුරු ටිකක් ඉන්න. ඔහු ඉතාම හොඳින් අවුරුදු ගණනක් තිස්සේ වැඩ කරගෙන යන විට පෙත්සමක ප්‍රතිඵලයක් වශයෙන් සී. අයි. ඩී. රිපෝට් එකක් ආවා. මේ නිලධාරියා වෙනත් තැනකට යැවීම ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පවා කණගාටු වුණා. පළාතට මෙය විශාල පාඩුවක් බව ඒ අය දැනගත්තා. අගමැතිතුමා හමු වීමට පවා ඒ අය ගිය නමුත් නිලධාරියාගේ මාරුව කැන්සල් කර ගන්න බැරි වුණා. මාරුව කල් දමා තිබෙනවා.

සී. අයි. ඩී. කාරයන් විසින් පරීක්ෂා කළ යුතු මීට වඩා වැදගත් දේවල් තිබෙනවා. 1962 දී ඇති වුණ කුමන්ත්‍රණයට සම්බන්ධ වූ අයට මේ ආණ්ඩුව විසින් විශාල පඩි ලබන රක්ෂා දී තිබෙන්නේ ඇයි දැයි යන්න එවැනි එක් කරුණක්. ඒ අයට රක්ෂා දිය යුතුයි. එහෙත් ඔවුන්ට විශේෂ පඩි ක්‍රම ඇති කර තිබෙන්නේ මොන හේතුවක් නිසාද? ඒවාට යම් යම් හේතූන් ඇති. රොයිස් ද මැල් මහත්මයා අද රු. 4,000 ක මාසික පඩියක් ලබන බව මේ ගරු සභාවටත් රටටත් මා මතක් කර දෙන්නට ඕනෑ. ඒ කුමන්ත්‍රණ නඩුව ඇසූ විනිශ්චයකාරයන් තුන්දෙනාගෙන් ඉහළම විනිශ්චයකාරයාට පවා ලැබෙන්නේ ඊට වඩා අඩු පඩියක්. මා අද මේ විස්තර පුස්තකාලයේදී බලා ගත්තා. අග්‍ර විනිශ්චයකාරතුමාට අවුරුද්දකට ලැබෙන්නේ රු. 43,000 යි. එහෙත් රොයිස් ද මැල් මහත්මයාට අවුරුද්දකට රු. 48,000 ක් ලැබෙනවා. වී. ඊ. පෙරේරා මහත්මයා එම නඩුවේ තවත් විත්තිකරුවකුව සිටියා. ඔහු පොලිස් සුපිරින්ටෙන්ඩන්ට්වරයකුව සිටියා. මාන් අත් අඩංගුවට ගත්තේ ඒ හාදයායි. මා ඔහු හොඳට දන්නවා. [බාධාකිරීමක්] දක්ෂකම් ගැන මා සමග කථා කරන්න එපා. ඔක්කොම රෝමානු කාරයන් බව මා දන්නවා. [බාධාකිරීම්] ඔහු අයි. ජී. පී. වුණත්, අද ඔහුට ලැබෙන පඩිය ලැබෙන්නෙ නැහැ. මේ අය නීති ප්‍රශ්නයක් උඩ නඩුවෙන් නිදහස් වුණා. ඔවුන්ට රක්ෂා දීමේත් වරදක් නැහැ. එහෙත් මේ විධියේ විශේෂ පඩි දෙන්නෙ ඇයි? ඒ ගැන සොයා බලන්න ඕනෑ. අද අපට මෙය තේරුම් ගන්නට බැරි ප්‍රශ්නයක් වී තිබෙනවා.

වාහන සම්බන්ධයෙන් අපට තිබෙන අමාරුකම් ගැන මා කීවා. අපට හොඳ වාහනයක් නැහැ. ඒ හැරෙන්නට, බස් රථයකින් හෝ දුම්රියකින් යන්නට ගියත් ඒවා කලට වේලාවට යන්නේ නැහැ. මා ප්‍රවාහණ ඇමතිතුමාට කීවා, පසුගිය සතිය තුළ නියමිත වේලාවට ගිය මුළු දුම්රිය ලැයිස්තුවම දුම්රිය සාමාන්‍යාධිකාරීගෙන් ලබා ගන්නය කියා. එහෙත් මාතර හෝ වේවා, යාපනය, මඩකලපුව, නුවර, පුත්තලම යන මාර්ගවල හෝ වේවා එකම දුම්රියක්වත් නියමිත වේලාවට යන්නේ නැහැ. රුපියල් කෝටි ගණනක් වියදම් කර ඊයේ පෙරේදා, ඩීසල් එන්ජින් වගයක් ගෙනාවා. එහෙත් තත්ත්වයේ කිසිම වෙනසක් සිදු වී නැහැ. ලංකාවේ ඉන්නා ජාවාරම්කාරයන්ට වාහන ලබා ගැනීම සඳහා ඕනෑ තරම් බලපත්‍ර දෙනත්, මන්ත්‍රීවරයකුට තමාගේ වාහනය කොපමණ පරණ වුණත් බලපත්‍රයක් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. එහෙත් මෑතදී වාහන 8,000 ක් පමණ ගෙන්වා තිබෙන බව අපට ආරංචියි. ඒ තත්ත්වය ගැනත් මගේ කණගාටුව පළ කරනවා.

කම්කරු උසාවි ගැනත් රාජාසන කථාවේ සඳහන් වෙනවා. කම්කරු උසාවිවල නඩු ඉක්මණින් අවසාන කිරීම සඳහා වැඩ පිළිවෙළක් යොදනවාලු. එහෙත් කම්කරු උසාවිවලට නඩුකාරයන් අළුතින් පත් කිරීමෙන් පමණක් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් කම්කරු උසාවියේ නඩු නීන්දු 2,220 ක් ඇපැල් ගෙන තිබෙන බව කියැවුණා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ නීතිඥයෙක් නිසා කරුණාකර මේවාට ඇහුම්කන් දෙන්න. එහෙත් ඒ ඇපැල් නඩුවලින් දෙකක්වත් මාසයක් තුළ අවසාන වන්නේ නැති බව පත්‍ර මාර්ගයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපට දැනගන්නට ලැබෙනවා. එහෙම නම් අවුරුද්දටම වැඩි වුණොත් නඩු 25 ක් ඇහෙයි. කම්කරු උසාවියේ නඩු ඉක්මන් කිරීම සඳහා කොමිෂන් සභා පත් කළාට මදි. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්තුමාගේ කාර්යාලයේ දූෂිත වැඩ පිළිවෙළක් නඩු විභාගවීම පමා කෙරෙන වැඩ පිළිවෙළක් තිබෙනවා. කම්කරුවකුගේ වයස අවුරුදු 47 නම් සමහර විට කම්කරු උසාවියෙන් කියනවා ඔහුට අවුරුදු 50 වන තුරු වැඩ දෙන්නය කියා. එහෙත් ඒ වතු අයිති කාරයන්, කොම්පැණිකාරයන් ඒ තීන්දුවලට විරුද්ධව ඇපැල් ගත්තාම ඒ ඇපැල විභාග කරන්න අවුරුදු 5 ක් ගත වෙනවා නම් කම්කරු උසාවියේ තීන්දුව ඇපැල් උසාවිය අනුමත කළත් ඒ වන විට අර කම්කරුවාට අවුරුදු 50 පැන ඉවරයි. එයයි, භයානක තත්ත්වය. එම නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් තුමාගේ කාර්යාලයේ සිදුවන දූෂණ ගැන සොයා බලා වාර්තා කිරීමටත්, කොමිෂන් සභාවක් පත් කරන ලෙස ඉතා කරුණාවෙන් මා ඉල්ලා සිටිනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තමුන්නාන්සේගේ කථාවත් ඉක්මණින්ම ඉවර කරන හැටියට ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

අඩු තරමින් එස්. එස්. සී. පන්තිය දක්වාත් ගමේම පාසලේ ඉගෙන ගන්න ගම්බද දුප්පත් දරුවන්ට ඒ කාලයේ පහසුකම් සැලසී තිබුණා. එහෙත් අධ්‍යාපන ඇමතිතුමාගේ පාසල් ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළ යටතේ ගම්බද සමහර පාසල්වල ඉහළ පන්ති අඩු කර තිබෙනවා. එම නිසා තම ගම්වලින් සැතැපුම් පහ හය ඇත පිහිටි මහා විද්‍යාලවලට ගොස් උසස් අධ්‍යාපනය ලබන්නට දැන් ගම්බද දුප්පත් දරුවන්ට සිදුවී තිබෙනවා. එසේ සැතැපුම් හතර පහ ඇත පාසල්වලට යාම සඳහා අඩු තරමින් ගමනාගමන පහසුකම් වත්—බස් රථවත්—සපයා නොදීම ගැන අපේ කණගාටුව පළ කරනවා. පාසල් ප්‍රතිසංවිධානය යටතේ, කලින් එස්.එස්.සී. දක්වා පන්ති තිබුණු ගම්බද සමහර පාසල්වල දැන් ඉහළ පන්ති පැවැත්වෙන්නේ නැති නිසාත් ඇත මහා විද්‍යාලවලට යන්නට ගමනාගමන පහසුකම් නැති නිසාත් ගම්බද දුප්පත් දරුවන්ට එස්.එස්.සී. පන්තිය දක්වාත් ඉගෙන ගන්නට දැන් පුළුවන්කමක් නැහැ.

මේ රජය ප්‍රශ්න විසඳන්නට උත්සාහ දරන බවට ගුවන් විදුලිය හා ධනපති පත්‍ර මාර්ගයෙන් විශාල ප්‍රචාරයක් ගෙන ගියා. එහෙත් ගමේ සාමාන්‍ය දුප්පත් මිනිහාට කෑම ටිකවත් සොයා ගන්නට දැන් පුළුවන්කමක් නැහැ. කෑම වේල සපයා ගැනීම සඳහා මුදල් ටිකක් උපයා ගැනීම ඔහුට දැන් පෙරට වඩා අමාරු වී තිබෙනවා. එහෙත් ධනපති අතලොස්සකට නම් යාන වාහන, කෑම බීම ආදී සෑම දෙයක්ම සපයා දෙන්නට මේ රජය වැඩ කටයුතු සලසා තිබෙනවා. මේ රජය ගෙන යන්නේ එවැනි ප්‍රතිපත්තියක් බව කණගාටුවෙන් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 3.27
සුගතදාස අරඹවල මයා. (අක්මීමන)
(திரு. சுகததாச அரம்பவல—அக்மீமன)
(Mr. Sugathadasa Arambewala—Akmeemana)

කථානායකතුමනි, මගේ ඡන්දදායක කොට්ඨාශයට යාබද කොට්ඨාශය නියෝජනය කරන ඉද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ කථාවට පසුව කථා කරන්නට අවස්ථාව මට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. එතුමා හා මා අතර දේශපාලන අදහස් අතින් වෙනස්කම් තිබුණත් අප දෙදෙනා ආශ්‍රය කරන්නේ මිත්‍රයන් වශයෙනුයි. එතුමාගේ කථාවේදී සඳහන් වුණු කරුණු වලට පිළිතුරු දීමට කලින් මේ රාජාසන කථාව ගැන වචනයක් දෙකක් කියන්න ඕනෑ.

පස්වෙනි රාජාසන කථාවක් අපේ ආණ්ඩුව මගින් ඉදිරිපත් කරන්නට ලැබීම ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අප ඉතාමත් සන්තෝෂ වෙනවා. පසුගිය වකවානුවලදී පස්වෙනි රාජාසන කථාවක් ඉදිරිපත් කරන්නට බැරි වූ නිසා මෙය ඉදිරිපත් කරන්නට හැකි වූ හේතුත් ඒ සමඟම මා මතක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුගතදාස අරඹවල මයා.]

කරන්නට ඕනෑ. පාර්ලිමේන්තුවේදී නොකිව්වත්, අප සමඟ පෞද්ගලිකව සාකච්ඡා කරන අවස්ථාවලදී එතුමාගේ විරුද්ධවාදීන් පවා කියනවා, මේ රටේ නායකත්වය දීමට සිටින එකම සුදුස්සා වර්තමාන අගමැතිතුමා බව. එතුමාගේ දක්ෂකමත්, එතුමා තුළ තිබෙන ජාත්‍යාලයත්, රට පිළිබඳ එතුමා කෙරෙහි තිබෙන හැඟීමත්, ඒ වගේම ජාතීන් අතර සමගිය වර්ධනය කිරීමට එතුමා තුළ තිබෙන දක්ෂතාවත්, තම පක්ෂයේ මන්ත්‍රීගේත්, තම පක්ෂයට උදව් දෙන මන්ත්‍රීන්ගේත් පමණක් නොව අනිකුත් සෑම මන්ත්‍රීවරයෙකුගේත් හිත් දිනා ගැනීමට එතුමා වෙත තිබෙන දක්ෂතාවත් නිසා සම්පූර්ණ කාලයම පාර්ලිමේන්තුව ගෙන යන්නට එතුමාට අවස්ථාව ලැබීම ගැන අපි ප්‍රීති වෙනවා. එමෙන්ම එවැනි නායකයකු යටතේ ක්‍රියා කරන්නට ලැබීම ගැනත් අපි ප්‍රීති වන්නට වටිනවා.

රාජාසන කථාවලින් ඉදිරිපත් කරන කරුණු සියයට 100 ක් ඉෂ්ට කිරීමට කවර කාලයකවත් කොයිම ආණ්ඩුවක්වත් සමත් වෙලා නැහැ. එහෙත් මගේ අත්දැකීම් අනුව මට කියන්නට පුළුවන්, පසුගිය රාජාසන කථා 4 න් ඉදිරිපත් කළ කරුණුවලින් සියයට 90 ක් පමණ ඒ ඒ වැඩි තුළ ක්‍රියාත්මක කර තිබෙන බව. පසුගිය ආණ්ඩුවලට එවැනි ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් ගෙන යන්නට බැරි වුණා.

ඊළඟට මගේ මිත්‍ර බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) සඳහන් කළ කරුණුවලට පිළිතුරු දෙන්නට ඕනෑ. මේ ආණ්ඩුව බලයට පත් වුණු දවසේ පටන් ජාවාරම්කාරයන්ට තමන්ගේ මඩිය තර කර ගන්නට ඉඩ දී තිබෙනවා යයි එතුමාගේ කථාවේදී විශේෂයෙන්ම සඳහන් වුණා. ඒ ජාවාරම්කාරයින්ගේ ජාවාරම් සම්පූර්ණයෙන්ම නැවැත්වීමට මා දන්න කාලයේ පටන් කොයිම ආණ්ඩුවක්වත් සමත් වුණේ නැහැ. එහෙත් මේ කාලය තුළ මේ ආණ්ඩුවේ යහපත් ක්‍රියාමාර්ග වෙනස් කිරීමට මේ ජාවාරම්කාරයන් ඒවාට නොයෙක් අකුල් හෙළූ බව මා කියන්නට ඕනෑ. ඊට හේතුව ඔවුන්ගේ ජාවාරම්වලට ලැබෙන උදව් අඩු වීමයි. පසුගිය කාලයේ පළපුරුද්ද අනුව දැනටත් ජාවාරම් කරගෙන යන ටික දෙනෙකුවත් සිටිනවා නම් ඔවුන්ගේ සහාය ලැබෙන්නේ මේ ආණ්ඩුවට නොව විරුද්ධ පාර්ශ්වයට බව බොහෝවිට අපට පෙනී ගොස් තිබෙනවා.

ඊළඟට බද්දේගම ගරු මන්ත්‍රීතුමා තවත් කරුණක් සඳහන් කළා. එනම්, **ඒ කාලයේදී** තිබුණු ආණ්ඩු පිටරටවලට ණය වුණාට වැඩිය අපේ කාලයේදී පිට රටවලට ණය වී තිබෙනවාලු. මේ ණය මුදල් ලබා ගන්නේ කුමකටද කියා එතුමා අපට විස්තර කර දුන්නේ නැහැ. මේ ණය ලබා ගන්නේ අගමැතිතුමාගෙවත්, කැබිනට් මණ්ඩලයෙවත්, මන්ත්‍රීවරුන්ගෙවත් ප්‍රයෝජනය සඳහා නොව රට සශ්‍රීක කිරීමටයි. නොදියුණු රටක් දියුණුව කරා ගමන් කරවීමට දියුණු රටවල් ආධාර දෙනවා. එවැනි ආධාර ක්‍රම යටතේ ණය ලබා ගැනීම අපේ ආණ්ඩුවට විතරක් අයිති දෙයක් නොවෙයි. ඒක මුළු ලෝකයේම නොදියුණු රටවල් කරන දෙයක්. ඒ කාලයේ ගත් ණයවලින් රටේ දියුණුවට අදාළව ක්‍රියා කර තිබෙන හැටිත් අපේ මේ ආණ්ඩුව අරගෙන තිබෙන ණයවලින් රටේ දියුණුවට කටයුතු කර තිබෙන හැටිත් බද්දේගම ගරු මන්ත්‍රීතුමා සන්සන්දනය කර පෙන්නුවා නම් පැහැදිලි වෙනවා ඇති, අපේ ආණ්ඩුව යම් විදේශ ණයක් ගත්තා නම් එම ණය මුදල් රටේ සෞභාග්‍යයත් සශ්‍රීක භාවයත් දියුණුවත් ඇති කිරීම සඳහා යොදා තිබෙන බව.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා වාහන ප්‍රශ්නය ගැනත් සඳහන් කළා. ඒ ගැන සඳහන් කිරීමේදී මා ගැන කියනවා නම් මට කියන්න පුළුවන් මට ගමන් කිරීමට බර කරත්තයක්වත් නැති බව. එහෙත් බද්දේගම ගරු මන්ත්‍රීතුමාට නම් පරණ මොඩල් එකේ "බොග්වාඩ්" කියන නැවක් තරම් විශාල මෝටර් රථයක් තිබෙනවා. එය පරණ බව නම් අපි පිළිගන්නවා. වාහන බෙදීමේදී අලුත් එකක් ගන්නත් එතුමාට වුවමනාව තිබෙන්න ඇති. එහෙත් ගරු ප්‍රවාහන ඇමතිතුමා වාහන බෙදීමේදී පක්ෂපාතිත්වයක් නැතිව සාධාරණ අන්දමින් එය කර තිබෙනවා. ආණ්ඩු පක්ෂයේත් විරුද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාර්ශ්වයේත් මන්ත්‍රීවරුන් හුඟ දෙනෙක්ම තම තමන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහාත් වගා ව්‍යාපාරයන් සඳහාත් ජීප් රථ අරගෙන තිබෙනවා. අවාසනාවකට මෙන් මට වගා ව්‍යාපාරයක් නැති නිසා මෝටර් රථ ඉල්ලුවෙත් නැහැ. ලැබුනෙත් නැහැ. අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමාටත් (කේ. බී. රත්නායක මයා.) අම්පාරේ ගරු මන්ත්‍රීතුමාටත් (සෝමරත්න සෙනරත් මයා.) ජීප් රථ ලැබී තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේත් ආණ්ඩු පක්ෂයේත් තවත් මන්ත්‍රීවරුන් කීප දෙනෙකුටම මෝටර් රථ ලැබී තිබෙනවා. ඒ නිසා එයින් අපට එක කරුණක් පැහැදිලි වෙනවා. එනම් මේ රථ බෙදාදීමේ දී පක්ෂ භේදයකින් තොරව සාධාරණ අන්දමින් එය කර තිබෙන බවයි.

ගරු කථානායකතුමනි, පෝලිම් නැති කරනවාය කියා අපේ ආණ්ඩුව කීවාය කියා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නිතරම කෑගහනවා. "පෝලිම් දැන් නැහැ, දැන් තිබෙන්නේ පේළි" යයි කියනවා. එදා දවස් හතේ සතියකට පෝලිම් 14 ක් තිබුණු යුගයක් අපට මතකයි. අද ඒ පෝලිම් නැති කර තිබෙනවා. නොමිලේ දෙන හාල් සේරුව ගැනීමට නම් එක පෝලිමක් දැනුත් තිබෙනවා. සමුපකාර කඩයේ හාල් දෙන දිනයට නොමිලේ දෙන හාල් සේරුව ඉක්මණින් ලබා ගැනීමට නම් පෝලිමක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රාජාසන කථාවෙන් කරන්නට බැරි දේවල් ඉදිරිපත් කර නැහැ. මේ අවුරුද්දේ කරන්නට පුළුවන් දේවල් පමණක් ඉතාම කෙටියෙන් ඉදිරිපත් කර තිබීම ගැන අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. පසුගිය අවුරුදු 4½ තුළ ගරු අගමැතිතුමාගේ මාර්ගෝපදේශකත්වය යටතේ අපේ කැබිනට් මණ්ඩලය දිවා රෑ වෙහෙස නොබලා ක්‍රියා කිරීම නිසා අපේ ජාතික නිෂ්පාදනය ක්‍රම ක්‍රමයෙන් වැඩි වේගෙන යනවාය කියන එක මේ රාජාසන කථාවෙන් කැපී පෙනෙන කාරණයක්. එමෙන්ම අපේ ආර්ථික තත්ත්වයත් අවුරුද්දෙන් අවුරුද්දට දියුණු වේගෙන යනවා.

වී නිෂ්පාදනය ගැන බද්දේගම ගරු මන්ත්‍රීතුමා යම් යම් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළ නමුත් ගම්බද හැසිරෙන ගම්බද මන්ත්‍රීවරුන් හැටියට අපි දන්නවා ජනතාවගේ මතය කුමක්ද කියා. මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ඕනෑම මන්ත්‍රීවරයෙකුට මේ සම්බන්ධව ඕනෑම දෙයක් ඕනෑම විධියට මවා පාන්නට පුළුවන්. ඒවායේ නියම තත්ත්වය දන්නේ ගම්බද අයයි. විශේෂයෙන්ම බද්දේගම ආසනය ගොවිතැනින් ජීවත් වන අය වැඩි වශයෙන් සිටින ආසනයක්. එතුමා හෘදය සාක්ෂියට අනුව කථා කරනවා නම් ගොවීන්ගේ මතය කුමක්ද කියන එක දැනගන්නට පුළුවන්. එතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන පැත්තකට දමා කථා කරනවා නම් අද නියම තත්ත්වය කුමක්ද? වී නිෂ්පාදනයත් වගා නොකර අත්හැර දමා තිබුණු බිම්කට්ටිවල මෙන්ම නියරක් නියරක් පාසා කිසිවක් අත් නොහැර, අමතර වගාවනුත් විශාල වශයෙන් අද කරගෙන යන අන්දමට ගම්බද ප්‍රදේශවල ඇවිදින විට අපට පෙනෙනවා. මේ රටේ ගොවිතැන් දියුණුවක් ඇති වී තිබෙනවාය කියා රටේ සාමාන්‍ය ජනතාව පිළිගෙන අවසාන බව එයින් අප පිළිගන්නට ඕනෑ. සුළු කම්මාන්ත කරන අයට සහ සුළු නිපදවීම් කරන අයට පළල් අන්දමින් ණය දීම සඳහා, මධ්‍යම කාලීන සහ දීර්ඝ කාලීන ණය ක්‍රම ප්‍රාණවත් අන්දමින් ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික සංවර්ධන බැංකුවක් පිහිටුවීමට ක්‍රියා කරන බව මේ රාජාසනයේ කථාවේ සඳහන් වී තිබීමගැන අප සතුටු වෙනවා. ඒ ගැන මේ ආණ්ඩුවට ප්‍රශංසා කරන්නට වටිනවා. අපේ ප්‍රදේශවල යම් යම් දේ නිෂ්පාදනය කරන්නට පුළුවන් දක්ෂ කාර්මිකයන් සිටිනවා. ඔවුන්ගේ ඒ නිෂ්පාදන සාර්ථක අන්දමට —රටට ප්‍රයෝජනවත් වන අන්දමට— කිරීමට මූලික ධනයක් නැහැ. මේ බැංකුව මගින් ඔවුන්ට අවශ්‍ය මූලික ධනය සපයනවා නම් ඔවුන්ගේ කටයුතු දැන් කරනවාට වඩා සාර්ථක අන්දමින් කරන්නට පුළුවන් වෙනවාට කිසිම අනුමානයක් නැහැ.

දුම්රිය සේවය ගැන බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නිල් ද අල්විස් මයා.) මතක් කළා. ගල් අඟුරුවලින් දුවන, හිටි ගමන් නවතින පරණ එන්ජින් වෙනුවට ඩීසල් එන්ජින් යෙදීමට අපේ ආණ්ඩුව ක්‍රියා කර තිබෙන අතර ඒ ටැඩ පිළිවෙලේ ප්‍රතිඵල දැන් අපට දකින්නට ලැබෙනවා. දුම්රිය ප්‍රමාදය අද ඊයේ ඇති වූ එකක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

[සුගතදාස අරඹවල මයා.]

එය ආදී කාලයේ සිට තිබුණු දෙයක්. එහෙත් මේ ඇමතිතුමාට දුම්රිය දෙපාර්තමේන්තුවේ පාලනය ලැබුනට පසුව දුම්රිය ගමන්වල ප්‍රමාදයක් දකින්නට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකින්. මට වාහන පහසුකම් නැති නිසා මා, මේ සභා ගර්භයේ සිටින අනෙක් සෑම මන්ත්‍රීවරයකුටම වඩා දුම්රියෙන් ගමන් කරන කෙනෙක්. ඒ නිසා එදා දුම්රිය ගමනාගමනය පිළිබඳ තත්ත්වයත්, අද දුම්රිය ගමනාගමනය පිළිබඳ තත්ත්වයත් මට හොඳට පෙනෙනවා.

ගරු කථානායකතුමනි, අද පළාත් පාලන මණ්ඩලවලට, විශේෂයෙන් ගම්කාර්ය සභාවලට නව ජීවනයක් ලැබී තිබෙනවා, අපේ අළුත් තරුණ ඇමති ප්‍රේමදාස මහතා ඒ අමාත්‍යාංශයට පත්වීම නිසා. එතුමා යම් යම් ප්‍රදේශවල සැරිසරා ගම්සභාපති වරුන් සමග පළාත් ආණ්ඩු සභාවල සභාපතිවරුන් සමඟ, නගරසභාවල සභාපතිවරුන් සමඟ සාකච්ඡා කර ඒ ඒ පළාත්වල අඩුපාඩු හරියාකාර දැනගෙන විධිමත් පාලනයක් ඇතිව ඉතාමත් ඉක්මන් ක්‍රියා මාර්ග ගෙන යාමට විධිවිධාන යෙදීම ගැන අප සන්තෝෂ වන්නට වටිනවා. ප්‍රමාද වී හෝ එවැනි තරුණ, කාර්යක්ෂම කෙනකු කැබිනට් මණ්ඩලයට ඇතුළු කර ගැනීම ගැන අප අගමැතිතුමාට ස්තුති කරනවා.

කම්කරු උසාවිවල නඩු ඇසීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් ඇති බව අකැමැත්තෙන් වුනත් අප පිළිගන්නට ඕනෑ. ඒ ප්‍රමාදය මග හැරවීමටත්, සේවක අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීම පිළිබඳ ප්‍රමාදය මග හැරවීමටත් ක්‍රියා කරන්නට වටිනවා. සේවක අර්ථසාධක අරමුදලට ගෙවන පොළි ප්‍රමාණය වැඩි කරන බවට රාජාසන යේ කථාවෙන් කර තිබෙන ප්‍රකාශය ගැන අප ආණ්ඩුවට ප්‍රශංසා කරනවා. විශේෂයෙන්ම කම්කරු උසාවිවල තිබෙන නඩු පෙරට වඩා ඉක්මනින් විසඳීමට ගරු කම්කරු ඇමතිතුමා දැනට අදහස් කර තිබෙනවා. දැනටමත්, පෙරට වඩා තරමක් ඉක්මනින් ඒ සම්බන්ධ කටයුතු කෙරෙනවා. ඒ කටයුතු තව දුරටත් ඉක්මන් කරන ලෙස අප ඉල්ලා සිටිනවා.

ගිං ගඟ යෝජනා ක්‍රමය මේ අවුරුද්දේ පටන්ගෙන අවසාන කිරීමට කටයුතු පිළියෙල කරන බව රාජාසනයේ කථාවේ

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

සඳහන් වීම ගැන මා ඉතාමත්ම සන්තෝෂ වෙනවා. ගිං ගඟ ජල යෝජනා ක්‍රමය සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කළොත් දකුණු පළාතේ ආසන 15 කට පමණ එයින් ඇති වන යහපත කියා නිම කරන්නට බැහැ. ඒ පළාත්වල—විශේෂයෙන් ගඟ බඩ පත්තුව, හිනිදුම් පත්තුව වැනි ප්‍රදේශවල—වර්ෂා ජලය එකතු වුනාම අවසානයේදී ඒවා එන්නේ පහත්ම ප්‍රදේශය වන මගේ ආසනයටයි.

මා නියෝජනය කරන කොට්ඨාශයේ ගම් රාශියක් තිබෙනවා. ඒ ගම්වලින් බොහොමයක් අවුරුද්දකට අඩු වශයෙන් දෙවතාවක්වත් ගංවතුරට යට වෙනවා. එයින් ඇතිවන හානිය ගැන නොයෙක් වර මේ ගරු සභාවට මා පෙන්නුම් කර දී තිබෙනවා. පසුගිය කාලයේ දී ඇති වූ හානිය මෙපමණකැයි කියා නිම කරන්නට පවා අමාරුයි. නියඟය නිසා වී වපුරන්නට බැරි වීමෙන් ඇති වන හානිය ගැන නොසලකා ඉන්නට විධියක් නැහැ. ඒ වාගේම වපුරන ලද කුඹුරක සුමාන දෙක තුනක් වතුර දිගටම රඳා පැවතුනොත් සිදු වන හානියත් නොසලකා ඉන්නට පුළුවන්කමක් නැහැ. මෙවැනි පාඩු නිසා දුප්පත් ගොවි ජනතාවට ඉවසන්නට බැරි තරම් දුකක් විඳින්නට සිදු වෙනවා. ඒ නිසා ගාලු දිසාපතිතුමාගේ මාර්ගයෙන් සමාජසේවා කටයුතු භාර ගරු ඇමතිතුමා වෙත මේ ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනවා. විනාශයට පත් වූ කුඹුරු හිමියන්ටත්, විනාශයට පත් වූ කොරටු හිමියන්ටත් ඒ ඒ පුද්ගලයන්ට විඳින්නට සිදු වූ හානිය කල්පනාවට ගෙන හැකි තරමකින් වන්දි මුදලක් ගෙවන්නැයි ඉල්ලා තිබෙනවා. ඒ ගැන කරුණු සොයා බලා සුදුසු පරිදි ක්‍රියා කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.

රැකීරක්ෂා නොමැති උපාධිධාරීන් ගැන රාජාසන කථාවේ සඳහන් කර තිබීම අපේ සතුටට කාරණයක් බව මතක් කරන්නට කැමතියි. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේත් රැකියාවන් ලබා දීමට රජය උනන්දු වන බව දැනගන්නට ලැබීම සතුටට කාරණයක්. රාජාසන කථාවේ මෙසේ සඳහන් වෙනවා :

"රැකියාව නොමැති උපාධිධාරීන්ට රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද රැකියාවන් ලබා ගැනීමේ අවස්ථාවන් ඇති කිරීමට සහ බහුල කිරීමටත් වහාම ක්‍රියා මාර්ගයන් යෙදීමට මගේ ආණ්ඩු අදහස් කරයි."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ වාක්‍යය මම ඉතාමත් සැලකිල්ලෙන් කියෙව්වා. රැකියා නොමැති උපාධිධාරීන්ගේ සංඛ්‍යාව දැන් ගම්බද ප්‍රදේශවල ක්‍රම ක්‍රමයෙන් වැඩිවේගත එනවා. මා නියෝජනය කරන කොට්ඨාශය ගැන සඳහන් කරනවා නම් දැනටමත් අවුරුදු පහක පමණ කාලයක සිට රැකියාවන් සොයමින් ළතැවෙන උපාධිධාරීන් සියයකට ආසන්න වූ පිරිසක් එහි සිටින බව මට කියන්නට පුළුවනි. දුප්පත් මව්පියන් අමාරුවෙන් උපයන මුදල් වියදම් කර ඉගෙනීම ලබා දෙමව්පියන්ට උපකාරී වීමට සහනදායක මහක් සොයා යන මේ උදවියට නොපමාව සහනයක් ලබා දෙන්නට පුළුවන් නම් එයත් ඉතා වටිනා දෙයක් බව මතක් කරන්නට කැමතියි. ගම්බද ප්‍රදේශවල ඉන්න උගතුන් තමන්ගේ දුප්පත් දෙමව්පියන්ට සලකන්නට පොරොන්දු වෙලා සිටිනවා. ඒ නිසා ඒ ප්‍රශ්නය ඉතාමත් ඉක්මනින් විසඳීමට පියවර ගැනීම ඉතාමත් ශුභවන්ත ක්‍රියාවක් බව මතක් කරන්නට ඕනෑ. මීට පෙරත් නොයෙක් වතාවල මා සඳහන් කළ මේ කාරණය නැවත නැවතත් ගරු අගමැතිතුමා වෙත ඉතා බැගෑපත් ලෙස මතක් කර සිටිනවා. මේ අවුරුද්ද ගත වන්නට පෙර මේ ප්‍රශ්නය සතුටුදායක ලෙස විසඳන්නට ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් ඇති කරනු ඇතැයි මා විශ්වාස කරනවා.

නිවාස ප්‍රශ්නය විසඳීම ඉතාමත් වැදගත් ප්‍රශ්නවලින් එකක් බව සඳහන් කරන්නට ඕනෑ. බදු නිවාසවල ඉන්න උදවියට ඒ නිවාස අයිති කර දීමේ වැඩ පිළිවෙලක් ඇති කිරීම ඉතාමත් අවශ්‍යයි. ඒ ගැනත් රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. මගේ කොට්ඨාශයේ නිවාස නැති සංඛ්‍යාව අති විශාලයි. වැඩි වශයෙන්ම නගරබද කොට්ඨාශයක් නිසා මගේ කොට්ඨාශය තුළ ඒ ප්‍රශ්නය ඉතාමත් හොඳින් කැපී පෙනෙනවා. ගෙයක් තනා ගැනීමට ඉඩම් කැබැල්ලක් පවා නැති විශාල පිරිසක් ඉන්න නිසා ඒ සම්බන්ධයෙනුත් විධිමත් වැඩපිළිවෙළක් ඇති කළොත් හොඳ බව ඉතා ඕනෑකමින් මතක් කරන්නට කැමතියි.

අධ්‍යාපන ක්‍රමය ගැන කථා කරන විට මීට පෙර පැවති අධ්‍යාපන ක්‍රමයේ වැරදි සහිත බව නිසා අපේ සමාජ ප්‍රශ්න බැරෑරුම් තත්ත්වයකට පැමිණ තිබෙන බව කියන්නට සිදු වෙනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රම ගැන දැන් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව දැන් ක්‍රියා කරගෙන යනවා. විශේෂයෙන්ම වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීම නිසා තව අවුරුදු පහක් පමණ ගත වන විට රැකී රක්ෂා ප්‍රශ්නය මේ තරම් උග්‍ර ප්‍රශ්නයක් වන්නෙ නැහැ. පක්ෂයේ මන්ත්‍රිවරුනුත් මේ යෝජනා ක්‍රමයට කැමැත්ත දී සහයෝගයෙන් ක්‍රියා කළොත් මේ යෝජනා ක්‍රමය පමණක් නොවෙයි අනිකුත් ප්‍රශ්නත් විසඳෙනවාට කිසිම අනුමානයක් නැහැ. මේ රාජාසන කථාවට ගෙනා ස්තුති යෝජනාව ස්ථිර කරමින් කථා කළ බණ්ඩාරගම ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් කොතලාවල මයා.) විරුද්ධ පක්ෂයෙන් කළ ඉල්ලීමක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. මේ අවසාන වර්ෂයේදීවත් රටේ දියුණුවට, රටේ යහපතට ආණ්ඩුව විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවලට විරුද්ධත්වය නොදක්වා රටේ උන්නතිය සඳහා ඒවාට සහයෝගය දෙමින් ක්‍රියා කරන මෙන් එතුමා විරුද්ධ පක්ෂයෙන් ඉල්ලීමක් කළා. මමත් ඒ යෝජනාව අනුමත කරනවා. මමත් ඒ ඉල්ලීම කරනවා. අප දෙපක්ෂයම ඔහජන මතය ලබා ගෙන මෙතැනට පැමිණ සිටින්නේ රටේ දියුණුවට, මහජනතාවගේ දියුණුවට ක්‍රියා කරනවාය යන එකම පොරොන්දුව දීමෙනුයි. එම නිසා අපේ ප්‍රතිපත්තිවල යම් යම් සුළු වෙනස්කම් තිබුණත් රටේ ජනතාවට අප ණයගැති නිසා, අනාගත පරම්පරාව මේ රටේ හොඳ පුරවැසියන් කිරීමේ වගකීම අප දෙපක්ෂයටම පැවරී තිබෙනවා යන පුළුල් හැඟීමෙන් යුක්තව අපට සහයෝගය දෙන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

අ. භා. 3.50

ලීලාරත්න විජේසිංහ මයා. (පොළොන්නරුව)

(திரு. லீலரத்ன விஜேசிங்க—பொலன்னறுவ)

(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ගරු කථානායකතුමනි, මෙම රජයේ පස් වන රාජාසන කථා විවාදයටත් සම්බන්ධ වන්නට මට අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා. රාජාසන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මහතා.]

කථාව සම්බන්ධයෙන් කථා කරන්නට කලින් එක් විශේෂ කාරණයක් පිළිබඳව මා මගේ අදහසක් පළ කරන්නට සතුටුයි. බොහොම උත්සවශ්‍රීයෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ පැමිණ මේ රාජාසන කථාව පවත්වනවා. නමුත් මේ කථාව පිළියෙළ කරන්නේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ නොවෙයි; වෙනත් උදවියයි. මේ ක්‍රමය වෙනස් කළයුතු බව මගේ හැඟීමයි. ඒ මක්නිසාද? ගරුතර අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ රාජාසන කථාව පැවැත්වීමෙන් මේ රටේ නූගත් ජනතාවත්, සාමාන්‍ය ජනතාවත් සිතන්නේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේම මේ කථාව පිළියෙළ කර කියවන බවයි. එසේ සිතන ජනතාව රාජාසන කථාවේ තිබෙන අඩුපාඩුකම්වලට අහිංසක අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේට දොස් කියනවා; දෙහි කපනවා. එම නිසා ගරු අගමැතිතුමාම මේ රාජාසන කථාව ඉදිරිපත් කරනවා නම් වඩා කාලෝචිත බව මා මුලින්ම ප්‍රකාශ කරනවා. එසේ කළොත් කාගේවත් පව් කාගේවත් පිටින් යන්නේ නැහැ, තමන්ගේ පිටින්ම යනවා මිසක්.

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාට නම් තවත් ඉතිහාසයක් එකතු වුණා. පස් වන රාජාසන කථාවත් ඉදිරිපත් කරන්නට එතුමාට අවස්ථාව ලැබුණා. ලංකාවට නිදහස ලැබුණාට පසුව පස් වන වරටත් රාජාසන කථාවක් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබුණේ මේ අගමැතිතුමාට පමණයි. අනික් සියලුම ආණ්ඩු රාජාසන කථා තුනෙන් හතරෙන් අවසාන වුණා. එම නිසා පෞද්ගලික වශයෙන් ගරු අගමැතිතුමාට නම් තවත් ඉතිහාසයක් එකතු වුණා. නමුත් මේ පස් වන රාජාසන කථා වෙනුත් මහජනතාවට එතරම් සහනයක් සැලසී තිබෙනවාය කියා මට පෙනෙන්නේ නැහැ.

ගරු අගමැතිතුමාගේ වගා ව්‍යාපාරයට අප සෑම අතකින්ම සහයෝගය දී තිබෙනවා. නමුත් මේ වගා ව්‍යාපාරයෙන්වත් රටේ ජනතාවට හරියාකාර සහනයක් අත් වී නැහැ. ආහාරයෙන්වත් සහනයක් අත් වී නැහැ. භෝග වර්ග නිෂ්පාදනය වැඩි වී තිබෙනවාය කියා මේ රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. භෝග වර්ග නිෂ්පාදනය වැඩි වුණා නම් මිල අඩු වන්නට ඕනෑ. ඒවා පහසුවෙන් ලබා ගන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. නමුත් අද එලවලු වර්ගවල මිල අඩු නැහැ. මස් මාලුවල මිල අඩු නැහැ. ඊයේ මා තිඹිරිගස්යායේ වෙළඳපොළට ගියා. බෝංචි රාත්තලක් ශත 80 යි. තක්කාලි රාත්තලක් ශත 60 යි. මුරුංගා රාත්තලක් ශත 35 යි, 40 යි. භෝග වර්ග නිෂ්පාදනය ක්‍රමයෙන් වැඩි වුණා නම් මේ තරම් මිල ඉහළ ගොස් තිබෙන්නේ මක්නිසාද කියා මා ප්‍රශ්න කරනවා.

වගා ව්‍යාපාරය වෙනුවෙන් අක්කර 97,000 ක් පමණ දී තිබෙනවා. ඔය දුන් අක්කර 97,000 න්, අක්කර 200 කවත් හරියාකාර වගාවක් කෙරී තිබෙනවාද කියා මා ඉඩම් උප ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරනවා. වගාවටය කියා දුන් ඒ ඉඩම්වල තිබුණු අවුරුදු සිය ගණනක් තිස්සේ නැදුණු වැඩුණු වටිනා දැව දඩු සියල්ලම කපා කොළඹට ගෙනැවිත් විකුණා ගත්තා. මුදල් තිබෙන උදවිය එසේ දැව දඩු විකුණා තව තවත් මුදල් හම්බ කර ගත්තා මිසක් වගාවටය කියා තඹයකවත් උදව්වක් කළේ නැහැ. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ අක්කර 17,000 ක් පමණ වගාවට දී තිබෙනවා. නමුත් අද ඒ අක්කර 17,000 හෙම ගන්නට දෙයක් නැහැ. ඒ ඉඩම්වල තිබුණු හල්මිල්ල වැනි වටිනා දැව සියල්ලක්ම කපා කොළඹට ගෙනවුත් විකුණා ගත්තා. මේ ඉඩම් ලබා ගත් උදවිය හරියට අම්මගෙ තාත්තගෙ බූදලය වගේ මේ ඉඩම්වල තිබෙන සියලුම වටිනා දැව ටික කපා විකුණා ගන්නවා. ලොරියට පටවා ගත හැකි තරම් ලී පටවා ගන්නට කියනවා. ලී ලොරියක් රුපියල් 45 යි. එතැනදී ඒ වේලා වේදිම බලපත්‍රය දෙනවා. ලොරිකාරයන් අවුත් කැලේ තිබෙන ගස් ටික ලොරිවලට පටවා ගන්නවා. එක ලී ලොරියක් රුපියල් 45 යි. කිසිම වගාවක් නැහැ. මේ වාගේ අදූරදර්ශී වැඩ පිළිවෙළක් අනුවයි, ඔය කියන වගාව කරගෙන ගොස් තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම වගා කරන්නන්ට අඩු මුදලට පෝර ටික ලබා ගන්නට පුළුවන්කමක් තිබෙන්නට ඕනෑ. ඒ වාගේම නිෂ්පාදනය කරන ආහාර ද්‍රව්‍යවලට සෑහෙන මිලක් ලබා ගන්නට පුළුවන්කමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නට ඕනෑ. වී බුසලකට රුපියල් 14ක් ගෙවීම ප්‍රමාණවත් නැහැ. අද රටේ පවතින ජීවන තත්ත්වය අනුව මේ මුදල කිසි සේත්ම ප්‍රමාණවත් නැහැ. වී බුසල් දෙතුන් සියයක් විකුණන ගොවියකුට වුණත් මාසයක් හමාරක් යන කොට නැවත මුදල් අමාරුකම් ඇති වෙනවා. ලබා ගන්නා මුදලෙන් කොටසක් ආපසු දෙන ණය මුදල් වෙනුවෙන් වෙන් කරන්නට ඕනෑ. ඒ වාගේම ඒ ණය සඳහා ගෙවිය යුතු පොළිය සඳහාත් කොටසක් වෙන් කරන්නට ඕනෑ. අද පෝර මිළ එකට එකක් වැඩියි. ඔය එක එක දේට මුදල් වෙන් කළාම ගොවියාගේ අතේ ඉතුරු වන දෙයක් නැහැ. රේඩියෝ ගේනවා යයිද, බර කරත්ත ගේනවා යයිද, සමහරුන් කියනවා. එහෙත් ඇත්ත වශයෙන් වී විකුණා මාසයක් දෙකක් යන විට ඊළඟ කන්නයේ අස්වැන්න නියම මිලෙන් දෙකෙන් පංගුවකට හෝ උකස් කර තමන්ගේ හදිසි ව්‍යසන සඳහා මුදල් ටිකක් ලබා ගන්නට ගොවියාට සිදු වෙනවා. ගොවීන් අතර අද පවතින මේ තත්ත්වය වසං කරන්නට වුව මනාවක් අපට ඇත්තේ නැහැ.

ගරු අගමැතිතුමාගේ වගා ව්‍යාපාරයට ඇත්ත වශයෙන්ම මාත් සහාය දෙනවා. මටත් කුඹුරු ඉඩම් අක්කර පහක් තිබෙනවා. ආණ්ඩුවෙන් බිත්තර වී ලබාගෙන මා ඒ කුඹුරු අක්කර පහේ බිත්තර වී ගොවිපළක් ඇති කළා. බිත්තර වී සෑම් පලය ගබඩාවට යවා දැන් මාස තුනක් වෙනවා. එහෙත් තවමත් එය අනුමත කර එව්වේ නැහැ. බිත්තර වී සෑම්පල් ගොඩ ගසාගෙන තිබෙන නිසා ඒ ගබඩා අයිතිකරුවන්ට වෙළඳ බැංකුවලින් ලබාගෙන තිබෙන ණය මුදල් ගෙවා ගන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඔවුන්ගේ සල්ලි හිර වී තිබෙනවා. මේ අතර මගේ වී පාර්සලය පමණක් නැති වී ඇති හෙයින් නැවත වෙනත් වී පාර්සලයක් එවන ලෙස දන්වා තිබෙනවා. අනික් අයගේ වී පාර්සල් ඔක්කොම තිබෙනවා. මගේ පාර්සලය පමණක් නැති වෙලා. මගේ බිත්තර වී ගොවිපළ හොඳින් කරගෙන ගිය නිසා තැග්ගක් වශයෙන් මට උදලු තලයක් ද ලැබී තිබෙනවා.

ගොවීන්ට ධෛර්‍ය දෙනවා වෙනුවට ඔවුන් අධෛර්‍ය වන වැඩ තමයි, මේ ආණ්ඩුවෙන් මෙතෙක් කෙරී තිබෙන්නේ. ගොවීන්ට ණය ලබා ගැනීමේ පහසුකම් ඇති කරන බව රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. ගම්බද ගොවියකුට කම්කරුවකුට, රජයේ සේවයේ යෙදී සිටින පහළ ශ්‍රේණිවල සේවකයන්ට මහජන බැංකුවෙන් රුපියල් පන්සියය, හයසියය, හත් සියය ආදී වශයෙන් ණය ලබා ගැනීමට පසුගිය ආණ්ඩුව ඉඩකඩ සලසා තිබුණා. බණ්ඩාරනායක ආණ්ඩුව මහජන බැංකුව ඇති කෙළේ දුප්පත් පංක්තියේ උදවියට ගිනි පොළිකාරයන් ළඟට යන එක නවත්වන්නටයි. ඔවුන්ට පහසුවෙන් ණය මුදල් ලබා ගන්නටයි. එහෙත් මේ ආණ්ඩුව ජූලි මාසය දක්වා බැංකු ණය දීම නවත්වා තිබුණා. දැන් නැවත එය දෙසැම්බර් මාසය දක්වා දීර්ඝ කර තිබෙනවා. අද මහජන බැංකුව වෙන් වී තිබෙන්නේ "මහා ජනයන්" අතළොස්සකගේ ප්‍රයෝජනය සඳහායි. ඒ මිස මහජනයාට එයින් ප්‍රයෝජනයක් නැහැ. එය අතළොස්සක් ධනපතියන්ට එසේ නැත්නම් "මහා ජනයන්ට" සෙත සලසන්නක් මිස සාමාන්‍ය මිනිසාට සෙත සලසන්නක් නොවෙයි. අද සාමාන්‍ය කෙනකුට මහජන බැංකුවෙන් රුපියල් 500ක ණයක් ලබා ගන්නට බැහැ. එහෙත් ලොකු මිනිසුන්ට රුපියල් ලක්ෂ ගණන් ණයට ගන්නට පුළුවනි. ලොක්කන් ලක්ෂ ගණන් ණය ගෙන ලොකු බිල්ඩිං ගහනවා. එහෙත් සාමාන්‍ය මිනිසාට ඔසත සලසා දීමේ පරමාර්ථය ඇතිව බණ්ඩාරනායක ආණ්ඩුව විසින් පිහිටුවන ලද මහජන බැංකුවෙන් අද සාමාන්‍ය මිනිසාට සුළු ණයක්වත් ලබා ගන්නට බැහැ. මහජන බැංකුවෙන් සාමාන්‍ය මිනිසාට ලබා ගන්නට පුළුවන්කම තිබුණු සහනය නැති කර දමා තිබෙන්නෙ මේ ජාතික ආණ්ඩුවයි.

අද පෝලිං නැති බව අක්මීමන ගරු මන්ත්‍රීතුමා (සුගතදාස අරඹවල මයා.) ප්‍රකාශ කළා. ඔව්, පෝලිං නැති බව ඇත්තයි. අද තිබෙන්නේ පිං හාල් සේරුව සඳහා ඇති වෙස්සන්තර පෝලිම පමණයි. හැබැයි, සලාක ක්‍රමයට දෙනු ලබන බඩු ටිකවත් ලබා ගන්නට නම් ක්‍රමයක් නැහැ. අද රතු ලූනු ටික නැහැ; බොම්බයි ලූනු ටික නැහැ; පරිප්පු ටික නැහැ. කිරි පිටි ටිකක් ගන්නට නැහැ. කෙරසින් බෝල්ට් පින් එකක් ගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

[ලීලාරත්න වීජේසිංහ මයා.]

කඩවල් 10 කට විතර යන්නට ඕනෑ. පසුගිය කාලයේ රුපියල් 2.65ට තිබුණු නෙස්ටෝමෝල්ට් ටින් එක අද 4.75 යි.

ජීවන වියදම අඩු කිරීම ගැන හැම විටම කථා කරනවා. එහෙත් ජීවන වියදම අඩු කිරීම සඳහා ගෙන තිබෙන පියවරවල් මොනවාද? පසුගිය ආණ්ඩුව සෑහෙන තරමින් කර්මාන්ත දියුණු කළා. අලුත් කර්මාන්ත ජනපද ඇති කරන බව ගරු අග්‍රාණ්ඩුකාරතුමා මේ වර රාජාසන කථා වෙහි සඳහන් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම කර්මාන්ත දියුණු කළ යුතුයි. වගාව දියුණු කළාට මදි. වැඩි වන ජනගහනයට රක්ෂා සපයන්නට නම්, කර්මාන්ත දියුණු කරන්නට ඕනෑ. එහෙත් අද මේ රටේ ඇති කර තිබෙන කර්මාන්තවලින් ජනතාව සූරා කෑමයි කෙරෙන්නේ. කොතෙක් නිෂ්පාදන තිබුණත් ඒවායින් ජනතාව සූරා කන බවයි පෙනෙන්නේ. කිසිම බඩුවක් පහසු මිලකට ලබා ගන්නට බැහැ. මෙහි නිපදවන බ්ලේඩ් තිබෙනවා; මන්නයකින් රැවුල කපන එක ඒවායින් කපනවාට වඩා හොඳයි. ඒකෙන් රැවුල කැපුවාම මුහුණ බොහොම දනවා. ඒ වුණත් ඒක විකුණන්නේ ශත 10 බැගිනුයි. එම බ්ලේඩ් එකක් හදන්නට යන වියදම ශත 04 බව කියනවා. ශත 04 කට වියදම් සීමා වන බ්ලේඩ් එකක් අඩු වශයෙන් ශත 07කට වත් විකුණන්නට කල්පනා කළොත් ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවන්නට ඒකත් එක්තරා උපකාරයක් වෙනවා ඇති. මේ රටේ කර්මාන්ත දියුණු වීම ගැන අපි බොහොම ආඩම්බර වෙනවා. එහෙත් රටින් එන නෝනා මාක් කිරි ටින් එකක මිල ශත 95 ක් වන අතර මේ රටේ සාදන කිරි ටින් එකක් විකුණන්නේ රුපියල් 1.25 ටයි. මේ කිරි ටින් එකක් සාදන්නට ශත 55කට 60කට වඩා නොයන බවයි කියන්නේ. ඒකත් 1.25 කට විකුණනවා. උදළු තලයත් ඒ ආකාරයි. ඇළුමිනියම් භාණ්ඩත් ඒ ආකාරයි. පිඟන් සංස්ථාවේ පිඟන් බඩුත් ඒ ආකාරයි. වීදුරුවේ තත්ත්වයත් ඒ ආකාරයි. අද වීදුරුවෙන් මිල නැගලා. අපේ ආණ්ඩුව පැවති කාලයේ රුපියලට වීදුරු තුනක් දුන් බව මට මතකයි. අද එකක් රුපියල් 1.25යි නැත්නම් රුපියල් 1.30යි. මෙම භාණ්ඩවලට නියම මිල පාලනයක් කළ යුතුයි.

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

එසේ නොකර වෙළෙන්දන්ට මේ රටේ ජනතාව ගසා කන්නට ඉඩ දී තිබීම වැරදියි. මේ ආණ්ඩුවෙන් ලබෙන විනිමය උපයෝගි කරගෙන සුළු කර්මාන්ත අරඹා ඉක්මණින්ම කෝටිපතියන් වන්නට උත්සාහ ගන්නා අය සිටිනවා. යම් භාණ්ඩයක් ලංකාවේ සෑදුවත් වෙන රටක හැදුවත් ලාබයට එය ලබා ගන්නටයි ජනතාව උත්සාහ දරන්නේ. ලාබයටත් හොඳටත් වැඩි වැඩියෙනුත් බඩු අවශ්‍යයි. මේ අතින් කල්පනා කරන විට අද මේ රටේ කර්මාන්ත අංශය ජනතාව සූරා කන අංශයක් බවට පත් වී තිබෙනවා. මෙම වැඩ කටයුතු ගැන තමුන්නාන්සේලා හුඟක් මහත්සි වෙනවා ඇති. එහෙත් මේ රටේ නිපදවන භාණ්ඩ පහසුවෙන් මහජනතාවට ලබාගත හැකි වන පරිදි සෑහෙන අන්දමක වැඩ පිළිවෙළක් නොයෙදුවොත් මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවන්නට බැහැ.

අ. භා. 4.00

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Order, please! I wish to inform hon. Members that when time is allotted and the Whip sends me the names of speakers, hon. Members should not send in notes asking for alterations. I have arranged the speeches according to the times given by the Whip and it upsets all my arrangements when suddenly a Member walks in and sends a note saying he wants to be the next speaker. As a matter of fact, I can do away with this procedure and say that only those who catch the Speaker's eye can speak and then some hon. Members would not get an opportunity of speaking.

I request hon. Members to co-operate with me, and the Whip too must send in the names of Members after ascertaining who will be present and who will speak. I try to give every Member a chance, but unfortunately some hon. Members suddenly walk in and say they want to speak and send in their names.

I hope this would not occur again.

The Hon. Deputy Chairman of Committees will now take the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினர்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *took the Chair.*

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)

මා කතා කරගෙන ආවේ රාජාසන කතාවේ ඇතුළත් කරුණු පිළිබඳවයි. වාෂ්ප වර්ගයේ දුම්රිය යන්ත්‍ර නැති කොට ඩීසල් වර්ගයේ දුම්රිය යන්ත්‍ර යොදවන බව මෙහි සඳහන් වී තිබෙනවා. එය සතුටට හේතුවක්. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (අරඹවෙල මයා.) කිව්වා අපේ රටේ දුම්රිය පමාව සිදුවන්නේ ඉතා කලාතුරකින් බව. එය නම් අමූලික බොරුවක්. එතුමා නිතරම මෝටර් වාහනයකින් යන්නේ නැතිලු, තමන්ට මෝටර් වාහනයක් නැති නිසා. අපිත් මෝටර් වාහන හිමි අය නොවෙයි. අපිත් නිතරම පොළොන්නරුවේ සිට එන්නේ දුම්රියෙනුයි. මට මතක හැටියට කිසිම දිනෙක පොළොන්නරුවේ සිට නියම වෙලාවට දුම්රියක් පිටත් වී ඇවිත් නැහැ. විශෙෂයෙන් රාත්‍රී 10.30 තැපැල් දුම්රිය හැමදාම එන්නේ 11.30, 12.30 පසුවෙලයි. පෙරේදා මා ආ දුම්රිය පොළොන්නරුවෙන් පිටත්ව ආවේ රාත්‍රී 12.30 ටයි. තත්ත්වය එසේව තිබිය දී අර අන්දමේ අමූලික අසත්‍යය ප්‍රකාශ මෙම වැදගත් සභාව ඉදිරියෙහි කරන එක කණගාටුවට කරුණක්. දුම්රිය ප්‍රමාදය පිළිබඳව විමසන්නට ගිය විට නිතරම එන්ජින් දෝෂයක් ගැන හෝ අතරමග වතුර ගැලීමක් වැනි කරදරයක් ගැන හෝ කියනවා. මේ අන්දමට කටයුතු කෙරෙද්දී පසුගිය අවුරුදු කිපය හොඳින් කටයුතු කෙරුණු බවක් කියනවා. එහෙත් දුම්රිය අංශයේ කිසිත් දියුණුවක් ඇතිවෙලා නැහැ. ආහාර නිෂ්පාදන අංශය සංවර්ධනය වෙලත් නැහැ. තැපැල් අංශය සංවර්ධනය වෙලත් නැහැ. මංමාවත් අංශය සංවර්ධනය වෙලත් නැහැ.

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

ආහාර අංශය සංවර්ධනය වෙලාත් නැහැ; මංමාවත් අංශය සංවර්ධනය වෙලාත් නැහැ; අද මේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම මේ රටේ සංවර්ධනය කාබාසිනියා කර දමා තිබෙනවා. දුම්රිය අංශය ඉතාමත්ම කණගාටු දායක ලෙස පිරිහීගෙන යමින් නැවතත් එය බරකරත්න යුගයට ආපසු ගමන් කරනවා. ඩීසල් එන්ජින් 500 ක් ගෙනෙන බව මේ ආණ්ඩුව කියනවා. එය ගේන්නට ලැබේදැයි මා දන්නේ නැහැ. තවත් බස් 500 කුත් ගේන බව රාජාසන කථාවෙහි සඳහන් වී තිබෙනවා. බස් 500 ක් ගෙනෙන විට මෙහි තිබෙන බස් දාහක් දෙදාහක් නැත්නම් අඩු ගණනේ 500 ක් 600 ක්වත් කඩා අයින්කර හමාරයි. දැනට මත් බස් විශාල ගණනක් පතෝල මැහිමෙන් කඩා දමා තිබෙනවා. එසේ සිදු වී තිබෙන්නේ අදක්ෂ සේවකයන් යෙදීම නිසායි. තම හිතවතුන්ට තනතුරු දීම සඳහාත්, හිතවතුන් සැනසීම සඳහාත්, ඡන්ද බ්‍රෝකර්ලා සැනසීම සඳහාත් තුන්ඩු කෑලි අනුව නානාප්‍රකාර අදක්ෂ සේවකයන්ට ලංගමයේ රක්ෂා දී තිබෙනවා. කිසිම වැඩක් නොදන්නා එම සේවකයන් බස් රථවල තෙල් දැමිය යුතු තැනට වතුරත්, වතුර දැමිය යුතු තැනට තෙලුත් දමනවා. එවැනි දෙයක්වත් කර ගන්නට බැරි අහුටුම්ප්ටනුත් බස්වල වැඩ කරනවා. කන්නු කොරුන් බස්වල වැඩවලට යොදවා සිටිනවා. මේ විධියට අදක්ෂයන් යොදා, මේ රටේ පළමුවන ජනසතු ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම විනාශ වන තැනට දැන් කටයුතු යොදා තිබෙනවා. තව බස් 500 ක් ගෙනාවත් සිදු වන්නෙ එයමයි. ටික දවසක් යන විට ඒවාත් අයිනකට දමන්නට සිදු වෙයි. බස් පමණක් නොවෙයි අයින් කරන්නට තිබෙන්නේ. ජාතික ආණ්ඩුව යයි කියා ගන්නා හත් හවුලත් අයින් කරන්නයි මහජනතාව දැන් සූදානම් වන්නේ. ඇත්ත වශයෙන් ම සංවර්ධන විය යුත්තේ, වගා විය යුත්තේ කන බොන දේ පමණක් නොවෙයි. තවත් අංශ රාශියක්ම සංවර්ධනය විය යුතුව තිබෙනවා.

බස්නාහිර පළාතටත් දකුණු පළාතටත් තැපැල් පහසුකම් ලබා දීමට යන බව මේ රාජාසන කථාවෙහි සඳහන් වෙනවා. එම පළාත්වලට ඒ පහසුකම් දීම ගැන මගේ විරුද්ධත්වයක් නැහැ. එහෙත්, මහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

වනාන්තර වශයෙන් තිබී මීට අවුරුදු 25කට හෝ 30 කට කලින් ජනාවාස වූ පෙදෙස් ගැනත් රජය විශේෂයෙන් කල්පනා කළ යුතුයි. ඒ ප්‍රදේශවලට අද ලියුමක් කලට වේලාවට ලැබෙන්නේ නැහැ. විදුලි පණිවුඩ යක් නියම වේලාවට ලැබෙන්නේ නැහැ. හැතැප්ම 25, 30 පයින් ගමන් කරන්නට මිනිසුන්ට සිදු වී තිබෙනවා. පිට පළාතක සිටින කෙනකු හදිසි මරණයක් දන්වා විදුලි පුවතක් එවුවොත් එය මේ පෙදෙස් වලට ලැබෙන්නේ දවස් ගණනක් ගත වුණාට පසුවයි. එවිට අවමංගල්‍යය වෙනුවට මේ මිනිසුන්ට යන්නට පුළුවන් වන්නේ මතක බණ කියන දවසටයි. පොළොන්නරුව, අනුරාධපුරය, රාජාංගනය, අම්පාරේ ආදී සෑම පළාතකම තැපැල් සේවය නම් තුට්ටුවක් වටින්නේ නැහැ. ඒ පෙදෙස් වල මිනිසුන් සිටිනවාද නැද්ද යන වගක් වත් මේ ආණ්ඩුව දන්නවාදැයි මා දන්නේ නැහැ. එහෙත් ඒ පෙදෙස්වලින් වගාව නම් ලොකුවට බලාපොරොත්තු වෙනවා. ගොයම් කපන්නටත්, කලින්, අනුරාධපුර යෙන් ලක්ෂ 200ක් ලැබුණාය, පොළොන්නරුවෙන් ලක්ෂ මෙපමණ ගණනක් ලැබුණාය ආදී වශයෙන් ගණන් හදනවා. ඒවා ලොකුවට රටට පෙන්නනවා. එහෙත්, ඒ පළාත්වල මිනිසුන් ගමන් බිමන් කරන්නේ කොහොමද, ඔවුන්ට තැපැල් පහසුකම් තිබෙනවාද, සෞඛ්‍ය පහසුකම් තිබෙනවාද, මනුෂ්‍ය ජීවිතයට අවශ්‍ය වෙනත් පහසුකම් ඔවුන්ට ලැබී තිබෙනවාද, පුරවැසියන් වශයෙන් ජීවත් වීමේ ඉඩකඩ ඔවුන්ට ලැබී තිබෙනවාද යන බව සොයා බැලීමේ සිරිතක් මේ ආණ්ඩුවට නම් ඇත්තේ නැහැ. පහසුකම් තිබෙන කොළඹ වැනි පෙදෙස්වලටමයි තවත් පහසුකම් ලබා දීමට ආණ්ඩුව උත්සාහ කරන්නේ.

අපේ පළාත්වල පාරක බරකරත්තයක් වත් යන්න බැරිව තිබුණත් ජාත්‍යන්තර ගුවන් ගමන් නම් දියුණු කර තිබෙන බව රාජාසන කථාවෙහි සඳහන් වී තිබෙනවා. හොංකොං, බැංකොක්, සිංගප්පූරුව ආදී ස්ථානවලට යාමට ගුවන් ගමන් දියුණු කර තිබෙන බව කියනවා. හෙට අනිද්දා වන විට හවායි දූපත්වලටත් යාමට සූදානම් වෙයි. එහෙත් වගාව ගැන ලොකුවට කථා කරන මේ කාලයේ, වගාව විශාල වශයෙන් කෙරෙන ප්‍රදේශවල පාරක බර කරත්තයක්වත් යන්න බැහැ. මා මීට දවස් දෙක තුනකට උඩදී පොළොන්නරුවේ යක්කුරේ නමැති ගමට ගියා. ඒ ගමට යාමට තිබෙන පාරේ බරකරත්තයක් වත් යන්න බෑ. එහි මිනිසුන් දෙතුන් සියයක් ජීවත් වෙනවා. ඔවුන් වැද්දන් වශයෙන් අයින්කර දමා සිටිනවා. එය ශිෂ්ට සමාජයට ඔබින්නේ නැති දෙයක්. අද රට බොහෝම දියුණුය සරුසාරය කියන මේ කාලයේ දී මේ රටේම මිනිසුන් කොටසක් වැද්දන් වශයෙන්, නොදියුණු මිනිසුන් කොටසක් වශයෙන් පැත්තකට අයින්කර දමා සිටිනවා. ඒ මිසුනින් ජීවත් වන්නේ කොහොමද, ඒ මිනිසුන්ට බේත් හේත් ලැබෙන්නේ කොහොමද, ඔවුන්ගේ ළමයින් ඉස්කෝලේ යනවාද නැද්ද, ඔවුන් කන්නේ මොනවාද, ආදී කිසිවක් සොයා බලන රජයක් මේ රටේ නැහැ. පාලකයන් විසින් මේ රටේ සිංහල මිනිසුනුත් දෙමළ මිනිසුනුත් රවටා තිබෙනවා. ජාතික ආණ්ඩුව නමින් ප්‍රෝඩාවක් ඇති කර මේ රටේ සිටින සිංහල දෙමළ දෙවර්ගයේම දුප්පත් ජනතාව අමාරුවේ දමා තිබෙනවා. එහෙත්, කථා කරන්නේ ජාත්‍යන්තර ගුවන් ගමන් ගැනයි. දැන් මේ රටේ මැණික් හූඟක් ලැබෙන නිසා හෙට අනිද්දා වන විට දිගටම හොංකොං වලට මැණික් ගෙන යන්නත් ගුවන් ගමන් ඇති වෙයි. දැනටමත් සමහර මුදලාලිලා තර වී සිටින බව අපට ආරංචියි.

ඉඩම් නැති අයට ආණ්ඩුව විසින් බලපත්‍ර යටතේ දෙන ලද ඉඩම් සින්නක්කර ඔප්පු පිට ඒ අයට පවරා දීම සම්බන්ධව පසුගිය දවස්වල මෙම ගරු සභාවෙහිදී විවාදයක් ඇති වුණා. එය 1952 සිටම ඉඩම් ඇමතිතුමා ජප කරන මන්ත්‍රයක්. ඒ මන්ත්‍රය මතක් වන්නේත් ඡන්ද කාලයට පමණයි. ඒ පනත් කෙටුම්පත දෙවන වර කියවූවාදැයි මට මතක නැහැ. ඒ කොහොම වුණත් මෙවර කථාවටත් එය ඇතුළත් කර තිබෙනවා. "බලපත්‍ර ස්ථිර ප්‍රදානයක් බවට හැරවීමට" කටයුතු කරන වාලු. මට නම් ඔය බර වචන තේරෙන්නේ නැහැ. මේ ප්‍රදානය කිරීම කවදා කොතැනින් අවසන් වේදැයි කියන්නට පුළුවන්කමක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙත් එකක් කියන්නට ඕනෑ. එවැනි වැඩ පිළිවෙලක් ගෙන යන්නට අදහසක් තිබෙනවා නම් ගොවීන්ගෙන් අය කරන බදු අද සිට නතර කරනවා යයි රාජාසන කථාවේ සඳහන් කරන්නට පුළුවන්කම තිබුණා. ඉඩම් බදු ගෙවන්නය, වතුර බදු ගෙවන්නය යනාදී වශයෙන් නොයෙකුත් බදු ගෙවන්න යයි ඉල්ලමින් දිසාපති වරුන්ගෙන් ගොවීන්ට නිතරම ලියුම් ලැබෙනවා. ඒවා නොගෙවිවොත් ලබන මාසයේදී ඉඩමෙන් අස් කරනවාය, එහෙම නැත්නම් ඊළඟ මාසයේදී අස් කරනවාය කියමින් තර්ජනාත්මක ලියුම් ගොවීන්ට ලැබෙනවා. සින්නක්කර ඔප්පු පිට ගොවීන්ට ඒ ඉඩම් පවරා දෙන්නට යන නිසා ඒ ඉඩම් සඳහා ගොවීන්ගෙන් බදු අය කිරීම අද සිට නවත්වනවා යයි කියන්නේ නැත්තේ ඇයි? ගොවීන්ට එවැනි සහනයක් ලැබෙන්නේ නැහැ. හැමදෙනත් පොඩි මිනිහා අමාරුවේ.

ගොවීන්ට ඉඩම්වල අයිතිය දෙනවායයි මේ ආණ්ඩුව පළමුවැනි රාජාසන කථාවෙන් කියා සිටියා. ඒ තරමී දුරට තමන් සමාජ වාදීන් හැටියට ලොවට අඟවන්නට මේ ආණ්ඩුව එදා උත්සාහ කළා. කුඹුරේ වැඩ කරන ගොවියාට කුඹුරුවල අයිතිය තිබිය යුතුය යන්නයි සමාජවාදී ප්‍රතිපත්තිය. මේ ආණ්ඩුව ඒ ප්‍රතිපත්තිය පිළිගන්න පිරිසකගෙන් සැදුණු එකකුයි එදා කියා පෑවා. එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවේ පළමුවැනි රාජාසන කථාවෙන් ඉදිරිපත් කළ යෝජනාවක් තමයි, ඒ. ඒ කොයි හැටි වෙතත් තවමත් මේ රටේ ගොවීන්ට කුඹුරුවල අයිතිය නම් ලැබී නැහැ. අවුරුදු පහේ කාල සීමාවත් ඉවර වන්නට ඇවිත් තිබෙනවා. දැන් පස්වැනි රාජාසන කථාවත් පවත්වලා ඉවරයි. එහෙත් පළමුවැනි රාජාසන කථාවෙන් දුන් පොරොන්දුවත් ඉෂ්ට කරන්නට තව මත් බැරි වුණා. එපමණක් නොවෙයි, පසු ගිය ආණ්ඩුව අඳ ගොවියා ආරක්ෂා කරන්නට ගෙනා පනත ක්‍රියාත්මක කිරීමේදී පෙනී ගිය අඩුපාඩු ටිකවත් නැති කරන්නට පුළුවන් වුණේ නැහැ, මේ ආණ්ඩුවට. අවශ්‍ය සංශෝධන ඇති කරනවායයි හැම අවුරුද්දේම කිව්වා. එහෙත් තවමත් කෙළේ නම් නැහැ. එය පුදුමයට කාරණයක් නොවෙයි. මේ ආණ්ඩුව ගොවීන්ගේ ආණ්ඩුවක් නොවෙයි. ඇත්තෙන්ම මෙය ප්‍රවේණීකාරයින්ගේ ආණ්ඩුවක්. ඒ නිසා තමයි කුඹුරු පනතට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන්නට අන්තිම මොහොත ළඟා වන තුරුත් බැරි තත්ත්වයකට පැමිණ තිබෙන්නේ.

කුඹුරු පනත ගෙනා අවස්ථාවේ දී ඊට ඡන්දය දුන් පක්ෂ මොනවාදැයි මහ ජනයා දන්නවා. එදා ඊට විරුද්ධව ඡන්දය දුන්නේ ප්‍රතිගාමී රදල අදහස් ඇති එක්සත් ජාතික පක්ෂයත්, පෙඩරල් පක්ෂයත් බව අපි හොඳාකාර දන්නවා. ඒ අය එදා කුඹුරු පනතට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා. සිංහල, දෙමළ පාරම්පරික ගොවි ජනතාවට තමන්ගේ කොඳු ඇටය කෙලින් තබාගෙන පාරේ යන්නටත්, තමන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගන්නටත්, අනාගත පරම්පරාව වන දූ දරුවන්ගේ යහපත ඇති කරන්නටත් කර දිය යුතු වූ මූලික දේවල් ගැන මේ ආණ්ඩුවේ මූලික පක්ෂ එදා විරුද්ධ වුණා. ගොවියාගේ නැති වූ නිදහස ලබා දුන්නේ කුඹුරු පනතින් බව කවුරුනුත් පිළිගන්නවා ඇති. ඒ කුඹුරු පනතටත් විරුද්ධව ඡන්දය දුන් පක්ෂ යක් තමයි එක්සත් ජාතික පක්ෂය. එය එසේ නොවේ යයි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීන් කියනවාද? එසේ නොවේයයි මේ ආණ්ඩුව කියනවාද? ගොවියා රජ කළායය කියනවා. කොහොමද එය කෙළේ? ගොවි ජනතාවට තමන් වැඩ කරන කුඹුරට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ කුඹුරු පනතට විරුද්ධව ක්‍රියා කළ උදවිය ගොවියා රජ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළාය කියනවා නම් එය විශ්වාස කරන්නට පුළුවන්ද? මේ රටේ අද ගොවීන් ගොවීන් දහස් ගණනක් ඉන්නවා. පළමුවැනි රාජාසන කථාවෙන් දුන් පොරොන්දුව දැන් දැන් ඉටු කර දෙනු ඇතැයි ඒ ගොවි ජනතාව කට ඇර ගෙන බලා ඉන්නවා. එහෙත් තවමත් එය කෙළේ නැහැ. ගොවියා රජ කළොත් ඇති තමුන්නාන්සේලාට. ගොවියාගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමයි මූලික යුතුකම. ගොවියාගේ නිදහස තහවුරු කර දිය යුතුයි. ගොවියාගේ පාරම්පරික ගොවි තැන ආරක්ෂා කර දිය යුතුයි. ඒවා කරන්නට මේ ආණ්ඩුවට වුවමනාවක් තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. වුවමනාවක් තිබෙනවා නම් එය කරන්නට ඒ තරම් වේලාවක් යනවාද? සංශෝධනයක් ඉදිරිපත් කරන්නට අවුරුදු පහක් වුවමනා කරනවාද? නො කෙරෙන වෙද කමට කෝදුරු තෙල් හත් කළයකුත් තවත් ටිකක් වුවමනායයි කථාවක් තිබෙනවා. කරන්නට වුවමනාවක් නැති නිසා තමයි මේ උදවියත් වරින් වර අතපසු කරමින් සිටින්නේ.

නින්දගම් පනත කොයි තරම් දුරට ක්‍රියාත්මක කර තිබෙනවාද? මේ ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් දක්වන උනන්දුව මොකක්ද? ඒ සම්බන්ධයෙන් දැන් තිබෙන තත්ත්වය මොකක්ද? කී දෙනකුට ඒ අනුව දැන් ඉඩම් ලැබී තිබෙනවාද? නින්දගම් පනත ඇති කෙළේ රදලයින්ගේ ඉඩම් අරගෙන ජනතාවට බෙදා දීමටයි. එය කොපමණ දුරට ක්‍රියාත්මක වෙලා තිබෙනවාද? මේවා ක්‍රියාත්මක කරන්නට මේ ආණ්ඩුව ලෑස්ති නැහැ. එහෙත්, "අපි තමයි මහජනතාවගේ නියම ගැළවුම්කාරයෝ" කියලා පෙන්වන්නට මේ උදවිය උත්සාහ කරනවා. මහජන ගැලවුම්කාරයන් හැටියට පෙන්වීම සඳහා යම් යම් නීති රීති සකස් කළත්, ඒවා ක්‍රියාත්මක නොකර හමස් පෙට්ටියේ දමා තිබෙනවා. දැන් ගොවි ජනතාවට සමෘද්ධිමත් කාලයක් උදා වී ඇතැයි ගරු අගමැතිතුමා කියනවා. දැන් ගොවියන්ට කිරි පැණී උතුරන යුගයක් උදා වෙලාලු. කොතරම් සරුබරු යුගයක් උදා වී තිබෙනවාද කිවහොත් අද සමහර ගොවියන් රුපියල් 40,000 ක් තරම් වූ ආදායමක් ලබනවලු. ඇත්තෙන්ම මෙතරම් ආදායමක් ලබන්නේ මොන ගොවියාද? සමහර විට ජැපර්ජී සහ මුසාජී වැනි ගොවියන් ඒ විධියේ ආදායම් ලබනවා වන්නට පුළුවනි. එසේ නැතිව අපේ ගම්බද දුප්පත් ගොවියන්ට නම් සහනයක් නැහැ. දුප්පත් ගොවියන්ට ඔය කියන ආදායම් මාර්ගවලින් දහයෙන් එකක්වත් නෑ. ගොවියන්ට හොඳ ජීවන තත්ත්වයක් ලැබී තිබෙනවා නම් පසුගිය ගම්කාර්ය සභා මැතිවරණවලදී එක්සත් ජාතික පක්ෂය පරාජයකට පත් වූයේ ඇයි? ගම්කාර්ය සභා මැතිවරණ ගැන සඳහන් විට එක්සත් ජාතික පක්ෂය ඒ විධියට අන්ත පරාජයකට පත් වූ යුගයක් තවත් නැතැයි කියන්නට පුළුවනි. ගම්කාර්ය සභා මැතිවරණවලදී ගම්බද ගොවි ජනතාව එක්සත් ජාතික පක්ෂයට විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. ගම්කාර්ය සභා මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කරන්නට එන වැඩි දෙනා ගොවියන් බව ආණ්ඩු පක්ෂයේ උදවිය දන්නවා ඇති.

මේ ආණ්ඩුව දුප්පත් ගොවියන්ට ඉඩ දෙනවා වෙනුවට විශේෂ බදු ක්‍රමය යටතේ විශාල කොම්පැණිකාරයන්ට සහ ධනපතියන්ට ඉඩම් අක්කර 90,864 ක් දී තිබෙන බවත් එහෙත් ඒවායින් වගා කර තිබෙන්නේ අක්කර 14,590 ක් බවත් මෙම ගරු සභාවේදී කියැවී තිබෙනවා. එහෙම නම් දෙන ලද ඉඩම්වලින් සියයට 15 ක් වත් වගා වී නැහැ. එහෙත් රුපියල් ලක්ෂ 90 ක විදේශ විනිමය පාවිච්චි කරන්නට ඒ අයට ඉඩ දී තිබෙනවා.—පුද්ගලයන් සමාගම්ද ඇතුළුව—103 කට ලොරි වෑන් ජීප්, හා මිනිමොක් ආදිය ලබා ගැනීමට ඒ තරම් විදේශ විනිමය ප්‍රමාණයක් පාවිච්චි කරන්නට ඉඩ දී තිබෙනවා. විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් දීම හා විදේශ විනිමය නාස්ති කිරීම සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වය මෙම ගරු සභාවේදී විශාල විවේචනයක් කළා. රථ වාහන බෙදා දීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නැයි විරුද්ධ පාර්ශ්වය ඉල්ලා සිටියා. උත්තර මන්ත්‍රණ සභාවේදී හම්බ් සෙනෙවි මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් සෙනෙට් සභානායකතුමා කියා තිබෙන්නේ, වැරදි විධියට පාවිච්චි කිරීමේ හේතුවෙන් වගාව සඳහා දෙන ලද වාහනවලින් එකක් ආපසු ලබාගෙන ඇති බවයි. මේක රැවටීමක්. මේ පිළිතුර දී තිබෙන්නේ මහජනයා රැවටීමටයි. මේ පිළිතුර අපට පිළිගන්නට පුළුවන්කමක් නැහැ. මේ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

තේ වතු සහ රබර් වතු සාදාගෙන ඇති ආකාරයට වී වගාවත් ධනපති ක්‍රමය තුළ රිංගවන්නට මේ ආණ්ඩුව මේ රටේ ගොවි තැන දියුණු කිරීමේ මුවාවෙන් සූදානම් වී තිබෙනවා. විශාල කොම්පැණිවලට වී වගා කිරීමට ඉඩම් දීමෙන් මේ ආණ්ඩුව කරන්නට බලාපොරොත්තු වී තිබෙන්නේ අන්න ඒකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් වචන කීපයක් කථා කරන්නට මා අදහස් කරනවා. නිදහස් අධ්‍යාපනය පිළිබඳව මේ ආණ්ඩුව නිතර නිතර කියනවා. මේ රටේ රැකි රක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා කාර්මික අධ්‍යාපනයක් ලබාදීම පිණිස සැහෙන සැලැස්මක් ඇති කර කටයුතු කරගෙන යන බව හැමවිටම කියනවා. එහෙත් මට පෙනෙන හැටියට නම් මේ ආණ්ඩුව නිදහස් අධ්‍යාපනය විනාශ කර දැමීම පිණිසයි කටයුතු කර තිබෙන්නේ. එදා මුදල් ගෙවා ඉගෙන ගන්නා ලද කාලයේදී ගෙවන්නට සිදුවුණු පමණටම අදත් මුදල් ගෙවන්නට සිදු වන පිළිවෙළට වැඩ යෙදී තිබෙනවා. උපකරණ ගාස්තු සහ වෙනත් ගාස්තු යනාදී වශයෙන් අද මුදල් අය කරන බව පෙනෙනවා. මේ නිසා දුප්පත් දෙමව්පියන්ගේ දරුවන්ට පවා විශාල වශයෙන් මුදල් වැය කරන්නට සිදු වී තිබෙනවා. ඇත්ත වශයෙන්ම නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම උපකරණ ගාස්තු සහ වෙනත් සේවා ගාස්තු පිළිබඳ ප්‍රශ්නය නිසා ගම්බද දෙමව්පියන්ගේ දරුවන්ට ආත්ම ගරුත්වය ඇතුව ඉගෙනීම කරන්නට පවා බැරි තත්ත්වයක් පැනනැගී තිබෙනවා. ගුරුවරුන්ගේ බල කිරීම් නිසා පාසල් ළමුන් ගෙදර ඇවිත් නොයෙකුත් ආකාරයෙන් ආධාර මුදල් ඉල්ලා දෙමව්පියන්ට කන්නලව් කරනවා. උපකරණ ගාස්තු සහ වෙනත් සේවා ගාස්තු වශයෙන් ගෙවිය යුතු ගාස්තු නොගෙවන සමහර විදහල්වල ළමුන් ඔවුන්ගේ ආත්ම ගෞරවයට හානි සිදු වන පරිද්දෙන් පන්ති කාමරවලින් පිට එළියේ සිටුවා තබනවා. මේ රටේ තිබෙන්නේ නිදහස් අධ්‍යාපනයකැයි කියන ගමන්ම එම නිදහස් අධ්‍යාපනයටත් නින්දා වන පරිදි මුදල් අය කිරීමේ වැඩ පිළිවෙළක් මෙම රජය ක්‍රියාත්මක කර ගෙන යනවා.

මිගමුව අතුරු මැතිවරණ කාලයේදී ඇති වුණු සිද්ධීන් ගැන විශේෂයෙන් මිගමුවේ ගරු මන්ත්‍රීතුමා (ඩෙප්සිල් ප්‍රනාන්දු මයා.) දන්නවා ඇති. 1968 ජූලි 8 වන දින "ඩේලිමිරර්" පත්‍රයේ පළවී තිබුණා ගරු ජේ. ආර්. ජයවර්ධන, රාජ්‍ය ඇමතිතුමා විසින් කරන ලද ප්‍රකාශයක්. කාඩිනල් කුරේ තුමාට එතුමා විසින් යවනු ලැබූ ලිපියක් හැටියට එය හඳුන්වන්නට පුළුවනි. එය එදින "ඩේලිමිරර්" පත්‍රයේ පළ වී තිබුණේ මේ පිළිවෙළටයි :

"I have been requested by the Hon. Prime Minister and the Hon. Minister of Education to inform you that in the new National Education Bill it is proposed to enact regulations to control and levy fees. It is proposed under these regulations to permit private schools to levy fees, at the same time protecting the interests of pupils who have entered school since the previous Government took over by way of scholarships etc."

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
රහස් හිවිසුමක්ද ?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අගමැතිතුමාගේ අනුදැනුම ඇතුව සහ අධ්‍යාපන ඇමතිතුමාගේ අනුදැනුම ඇතුව මේ දැනුම්දීම කරන බවයි කියන්නේ. ගරු අගමැතිතුමාවත් ගරු අධ්‍යාපන ඇමතිතුමාවත් තවම ප්‍රකාශ කර නැහැ, එවැනි ප්‍රතිපත්තියක් ඒ අයට නොමැති බවක්. ඇටකෙහෙල් කාපු උගුඩුවන් වාගේ තවමත් නිශ්ශබ්දව සිටිනවා. ඇට කෙහෙල් කාපු උගුඩුවාට වෙච්ච දේ තමුන්නාන්සේලා දන්නවා ඇති. "ඇට කෙහෙල් කාපු උගුඩුවා වාගෙයි" කියා අපේ රටේ කතාවක් තිබෙනවා. බොහොම අමාරු තත්ත්වයකට—

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
ඇටකෙහෙල් යන්න වැරදියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
එහෙනම් කොහොමද හරි?

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
ඇටිකෙහෙල්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අපේ පළාතේ කියන්නේ එහෙමයි.

ගරු ආචාර්‍ය ඩබ්ලිව්. දහනායක (සවදේශ කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)
(The Hon. W. Dahanayake—Minister of Home Affairs)
ඒක තමයි දකුණු පළාතේ යොදන වචනය.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
දකුණු පළාතේ එහෙමයි යොදන්නේ. ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා බොහොම හරි. සමහරවිට තමුන්නාන්සේලාට එම යෙදීම ඇද වන්නට පුළුවනි. ඒ කෙසේ වෙතත් මේ ආණ්ඩුවේ රාජ්‍ය ඇමතිතුමා බොරුවක් කිව්වාද, අගමැතිතුමා බොරුවක් කිව්වාද නැතිනම් අධ්‍යාපන ඇමතිතුමා බොරුවක් කිව්වාද කියන එකයි අපට දැනගන්නට වුවමනා කරන්නේ. මීගමුවේ අතුරු මැතිවරණයේදී රාජ්‍ය ඇමතිතුමා කාඩිනල් කුරේතුමාට පොරොන්දුවක් දී තිබෙනවා, නැවතත් පාසල්වල ගාස්තු අය කරන්නට ඉඩ ප්‍රස්ථාව සලසා දෙන බවට. තවම රජයෙන් පිළිතුරක් නැති නිසා, රජය තවම නිශ්ශබ්ද නිසා, අපට පිළිගන්නට සිදු වී තිබෙනවා මේ රටේ නිදහස් අධ්‍යාපන ක්‍රමය නැති කරන්නට, ලෝක බැංකුවේ නියමය උඩ සීමා කරන්නට, වෙනත් මාර්ගවලින් මුදල් අය කිරීම සඳහා මේ ආණ්ඩුව ක්‍රියා කරන බව. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කථා කරන විට මීට පිළිතුරක් දෙනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉඩම් කාර්යාලයක් විවෘත කරමින් ගරු කෘෂිකර්ම ඇමතිතුමා කළ ප්‍රකාශයක් "දිනමිණ" පත්තරෙහි පළ වී තිබෙනවා. තේ, රබර්, පොල් ආදී වෙළෙඳ ද්‍රව්‍ය විකිණීමේදී, ඉස්සර නම් රබර් රාත්තලක් විකුණා හාල් සේරු සියයක් ගන්නට පුළුවන්කම තිබුණ නමුත් අද රබර් රාත්තලක් විකුණා හාල් සේරුවක් ගන්නට බැරි බව එතුමා එහිදී කියා තිබෙනවා. ඔන්න රට සංවර්ධනය කර තිබෙන හැටි. අපේ රටට ජාතික ධනය ලබා දෙන, විදේශ විනිමය ලබා දෙන, මේ වැවිලි තුන ප්‍රපාතයට ඇද වැටෙනතුරු මේ ආණ්ඩුව මොන වාද කෙළේ? පළාත් පාලන ඇමතිතුමනි මෙය හිනාවීමට දෙයක් නොවෙයි. හිනා වීමෙන් ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන්නේ නැහැ. අපේ ජාතික ආදායම මෙය නම්, අපේ ප්‍රධාන වැවිලි තුන මේවා නම් මේවා ආරක්ෂා කරන්නට ආණ්ඩුව යෙදූ පියවර මොනවාද?

කේ. බී. රත්නායක මයා. (අනුරාධපුර)
(திரு. கே. பி. ரத்நாயக்க—அனுராதபுரம்)
(Mr. K. B. Ratnayake—Anuradhapura)
තුනම කෑවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මෙවැනි දෙයක් සිදු වී තිබෙන්නේ මේ ආණ්ඩුව ගෙන යන වෙළෙඳ ප්‍රතිපත්තියේ වරද නිසායි. වෙළෙඳ ඇමති තුමා අස් වන්නට යන බවක් දැන් අපට ආරංචි වී තිබෙනවා. ලබන වර එතුමා මැතිවරණය සඳහා තරඟ කරන්නේත් නැතිලු. හිටපු වෙළෙඳ ඇමති තුමාට මුහුණ පාන්නට සිදු වුණු ප්‍රශ්නවලටම මුහුණ දෙන්නට මෙතුමාටත් සිදු වී තිබෙනවා. යම් යම් අයගේ අසිතිවාසිකම්වලට පහර වදින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩුවේ මහා.]

විට යම් වැඩ පිළිවෙලක් භාරියාකාරව ක්‍රියාත්මක කරන්නට නොලැබෙන විට මෙවැනි ප්‍රශ්න පැන නගිනවා.

අපේ රටේ තේ, පොල්, රබර් යන වැවිලි තුන සඳහා වෙන වෙනම පර්යේෂණ ආයතන තිබෙනවා. ඒවායේ විශේෂඥයන් සිටිනවා. මෙම වැවිලි තුන ආරක්ෂා කිරීම සඳහා ඒ විශේෂඥයන්ගෙන් ලබා ගත් උපදෙස් මොනවාද? ඔවුන් රජයට ඉදිරිපත් කර තිබෙන උපදෙස් මොනවාද? මෙම වැවිලි තුන මඟින් අපේ රටට විදේශ විනිමය ලබා ගැනීම සඳහා එම විශේෂඥයන් දී තිබෙන උපදෙස් මොනවාද?

නියෝජ්‍ය සභාපතිතුමනි, කියන්නට හුඟක් කරුණු ඇතත් තමුන්නාන්සේගේ නියමය වෙනස් කරන්නට මා කැමැති නැහැ. එහෙත් තව එක් කරුණක් කිව යුතුයි. අද විවිහිස ක්‍රමය නිසා පොත් පත් ගෙන්වා ගන්නට බැහැ. බේත්හේත් ගෙන්වා ගන්නට බැහැ. සුළු කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ගෙන්වා ගන්නට බැහැ. ඒවාට ගෙවිය යුතු විවිහිස ගාස්තු අනුව රුපියලකට රු. 1.55 ක් ගෙවන්නට සිදු වී තිබෙනවා. එහෙත්, මේ ආණ්ඩුව විදේශීය කොම්පැනි කාරයන්ට නම් කිසිම අඩු කිරීමක් හෝ බලපෑමක් හෝ නැතිව ඕනෑ තරම් මුදල් ලංකාවෙන් පිට ගෙන යන්නට ඉඩ දී තිබෙනවා.

කර්මාන්ත ඇති කිරීමේදී මේ රජය අනුගමනය කරන පිළිවෙළ ඉතාමත් අසාධාරණ බව කියන්නට ඕනෑ. ලංකාවේ දිස්ත්‍රික්ක අතුරෙන්, ජනගහනයේ ඝනත්වය අනුව 4 වන තැනට වැටෙන්නේ මාතර දිස්ත්‍රික්කයයි. 1 කොළඹ දිස්ත්‍රික්කය, 2 කළුතර දිස්ත්‍රික්කය, 3 මහනුවර දිස්ත්‍රික්කය, 4 මාතර දිස්ත්‍රික්කය. එවැනි විශාල ජනගහනයක් ඇති මාතර දිස්ත්‍රික්කයට එක කර්මාන්තශාලාවක්වත් දෙන්නට මේ රජයට බැරි වුණා. එම නිසා රක්ෂා නැති හමුදාවක් ඇති වී තිබෙනවා. උගත් තරුණ තරුණියන්ට පවා රක්ෂා නැහැ. තමුන්නාන්සේලා විසින්ම නිර්මාණය කළ, සංවිධානය කළ ඒ රැකීරක්ෂා විරහිත සමූදාව වැඩි කල් යන්නට මත්තෙන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පෙරළා දමන බව නම් සහතික බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 5.38

එම්. තෙන්නකෝන් මයා. (නිකවැරටිය)

(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)

(Mr. M. Tennakoon—Nikaweratiya)

නියෝජ්‍ය සභාපතිතුමනි, අප අද විවාදයට භාජන කරන්නේ ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයට අවුරුදු 21 ක් පිරීමෙන් පසුව පැවැත්වූ රාජාසන කථාව පිළිබඳ ස්තුති යෝජනාවයි. පළමු වැනි රාජාසන කථාව කියැවුවේ 1947 නොවැම්බර් 25 වැනි දායි. මන්ක් මේසන් මුවර් ආණ්ඩුකාරතුමාගේ ශ්‍රී මුඛයෙන් එදා කියැවුණු පළමු වැනි රාජාසන කථාවෙන් ආරම්භ වුණු අපේ පාර්ලිමේන්තු ක්‍රමයට අවුරුදු 21 ක් ගත වී ඇතත්, තවමත් හැදුණු මිනිහෙක් වශයෙන් නිසි විධියට ගමන් කරන්නට බැරි අනාථ, අසාධ්‍ය ත්වයකටයි වැටී තිබෙන්නේ. 1947 නොවැම්බර් 25 වැනි දා මන්ක් මේසන් මුවර් ආණ්ඩුකාරතුමා කළ පළමු වැනි රාජාසන කථාවෙ මෙසේ සඳහන් වෙනවා :

"Ceylon will enjoy in full measure all the rights, privileges and freedoms of any other Dominion and will take its place as a free and independent self-governing Member of the British Commonwealth of Nations."—[OFFICIAL REPORT, 25th November 1947 ; Vol. 1, c. 30]

පළමු වැනි රාජාසන කථාවේ සඳහන් වුණු වචන බොහොම මිහිරියි. ලංකාවට බ්‍රිතාන්‍ය රාජධානියේ කොටස්කාරයකු හැටියට සම්පූර්ණ නිදහස ලබාගෙන කට යුතු කිරීමේ අවස්ථාව ලැබේය යන විශ්වාසයක් පළමු වැනි රාජාසන කථාවෙන් පළ වෙනවා. ඊළඟට, ඒ රාජාසන කථාවට ස්තුති යෝජනාව ඉදිරිපත් කළ වර්තමාන රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා මෙසේ කියා තිබෙනවා :

"There will be the transfer of a Colonial economy to a National economy, a matter that will be very carefully handled by our Cabinet.

Then, Sir, with regard to industrialization and the expansion of present industries, they are all problems to which

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

we have to pay very careful attention. We know that the country has to be industrialized; we know that there is going to be agricultural self-sufficiency." [OFFICIAL REPORT, 25th November 1947; Vol. 1, c. 38.]

දැනට අවුරුදු 21 කට පෙර රාජාසන කථාවට ඉදිරිපත් කළ ස්තුති යෝජනාවෙන් එහෙම බලාපොරොත්තු වුණා. ඒ ස්තුති යෝජනාව ස්ථිර කිරීමේදී වර්තමාන ගොවිකම් ඇමති ගරු එම්. ඩී. බණ්ඩා මැතිතුමා කිව්වෙ කුමක්ද? ගොවිතැනින්, කර්මාන්ත අතින්, වෙළෙඳාමෙන් යන මේ සෑම අංශයකින්ම නිදහසක් බලාපොරොත්තු වන බවයි. නිදහස නැමැති මේ ළදරුවා බිහි කළ වෙලාවේදී ඔහු නළවන්නට ලැහැස්ති වුණු ඇත්තෙ ඒ ළදරුවාට වයස අවුරුදු 21 පිරෙන විට මෙහෙම තත්ත්වයක් ඇති වෙයි කියා සිතාගෙනද එදා මේ විධියට කිව්වෙ? කිව්වෙ මෙහෙමයි :

"There must be a proper assessment of our national resources, a planned development of these resources, so as to enable the people of this country to attain a reasonable standard of living, a greater degree of comfort and happiness than they now enjoy."—[OFFICIAL REPORT, 25th November 1947; Vol. 1, c. 44.]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමාන ගොවිකම් ඇමති ගරු එම්. ඩී. බණ්ඩා මැතිතුමා එදා මේ රටේ මන්ත්‍රීවරයකු හැටියට බලාපොරොත්තු වුණේ මොකක්ද? එදා ලැබුණු ස්වාධීනත්වයෙන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ රටේ ජනතාවගේ විමුක්තියත්—කොටසකගේ විමුක්තිය නොවෙයි; පොදු මහජනතාවගේ විමුක්තියයි—වඩා හොඳ ජීවන තත්ත්වය කුත් බව එතුමා මෙතැන ප්‍රකාශ කළා. ගොවිතැනින්, කර්මාන්තවලින් හා වෙළඳාමෙන් ලබාගන්නා වූ ප්‍රතිඵල අනුව පොදු මහජනතාවට මේ රටේ සැනසිලිදායක ජීවිතයක් ගත කිරීමට අවස්ථාව සැලසීමයි දැනට අවුරුදු 21 කට පෙර පළමුවෙනි රාජාසන කථාව පැවැත්වූ අවස්ථාවේ බලාපොරොත්තු වුණේ. අද අවුරුදු 21 කට පසු අපට වාර්තා පෙරළන්නටයි සිදු වී තිබෙන්නේ. මේ රටේ පොදු මහජනතාව ඒ සහනයන් අද කොයිතරම් දුරට බුක්ති විඳිනවාද කියන එක පරීක්ෂා කළයුතු අවස්ථාවක් නොවේද මෙය? අවුරුදු 21 කට පෙර ලැබූ ස්වාධීනත්වය අනුව අපේ කටයුතු අපිම කරගෙන යමින් මේ රටේ පොදු ජන ජීවිතයට සැලසූ සහනයන් හා මේ රටේ පොදු ජාතික දියුණුවට කළ කටයුතු ගැන සලකා බලා ඒ බලාපොරොත්තු කොතරම් දුරට සඵල වී තිබෙනවාදැයි හිතට එකඟව් පරීක්ෂා කළ යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු 21 ක් ගතවන විට තමයි, කෙනෙකුගේ හොඳම හොඳ කාලය වන තරුණ කාලය එළඹෙන්නෙ. යමක් කමක් කරන්නට කියන්නට පුළුවන් අවස්ථාව ඒ කයි. [බාධාකිරීමක්] සෞඛ්‍ය ඇමතිතුමා කියනවා ඊට ඉස්සරවෙලත් පුළුවන් කියා. අවුරුදු 21 කට කලින් බිහි කළ දරුවාට යමක් කමක් කර කියා ගන්නට පුළුවන් කාලය පිරෙන අදත් අප සිටින්නේ අනාථ තත්ත්වයකයි. තවත් කාගේ හෝ උපකාරයකින් ඉදිරියට යන්න ලැහැස්තිව සිටින්නටයි සිදු වී තිබෙන්නේ. අසාධ්‍ය තත්ත්වය කොයිතරම්දැයි කිව්වොත් බෙහෙත් ක්‍රමය වෙනස් කළේ නැත්නම් ලෙඩාගේ ජීවත්වීමත් විශ්වාස නැති තරමයි. අපේ ස්වාධීනත්වය තව කොතරම් දුරට ඉදිරියට තිබෙනවාද කියන එක සැක සහිත නිසයි අපට එහෙම කථා කරන්නට සිදු වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික අතින් හෝ අධ්‍යාත්මික අතින් මේ කාල පරිච්ඡේදය තුළ මේ රට කොතරම් දියුණුවක් ලබා තිබෙනවාද කියා අපි සොයා බැලිය යුතුව තිබෙනවා. පක්ෂ දේශ පාලන ආණ්ඩු ක්‍රමයකින් අවුරුදු 21 ක් මේ රට පාලනය කළාට පසුව ජනතාවගේ එදිනෙදා ජීවන තත්ත්වයන් පරීක්ෂා කර බැලීමේදී යම් පොදු දියුණුවක් හෝ පොදු සහනයක් සැලසී තිබෙනවා යයි අපට හිතට එකඟව හිතන්නට පුළුවන්ද? එවැනි සහනයක් නැත්නම් මේ පාලන ක්‍රමයේ කුමක් හෝ වරදක් තිබෙනවා. අවුරුදු 21 ක් තිස්සේ ගෙනගිය මේ පාලන ක්‍රමයේ ප්‍රතිඵලය වී තිබෙන්නේ දනගහ ගෙන නැත්නම් බඩගාගෙන හිඟින් ලෝක බැංකුවෙන් ණය ඉල්ලා ගෙන ජීවත් වීමයි. තත්ත්වය ඒක නම් මේ ක්‍රමය ගැන අපි සොයා බැලිය යුතුද නැද්ද කියන එකයි ඊළඟ ප්‍රශ්නය. 1947 දී ස්වාධීනත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ලැබුණාට පසුව මේ පාලන ක්‍රමයේ කිසිම වෙනසක් ඇති වී නැහැ. පළමුවැනි රාජාසන කථාවේදී ඒ ස්වාධීන භාවය ගැන සඳහන් කළා. එහෙත් ඒ අනුව කටයුතු කිරීමේදී යම් වෙනසක් කර මේ රටේ පොදු මහජනතාවගේ අවශ්‍යතාවන් ලබා දීමට අපට පුළුවන් වී නැහැ. ඒ නිසා දැන් අපට වුවමනා වී තිබෙන්නේ මේ ක්‍රමය වෙනස් කරන්නටයි.

මෙම පාලන ක්‍රමය වෙනස් කිරීම ගැන සඳහන් කිරීමේදී තවත් කරුණක් සඳහන් කිරීමට අපට සිදු වෙනවා. විදේශිකයින් විසින් මේ රට පාලනය කළ කාලයේදී එක්තරා යුතුකමක් යම් යම් අවස්ථාවලදී සිදු වුණා. වරින් වර රටේ තත්ත්වය සොයා බලා ඒ අනුව පාලන ක්‍රමයේ වෙනසක් කළ යුතුද නැද්ද යන්න තීරණය කර, අවස්ථා කීපයකදීම ඒ අනුව කටයුතු කර තිබෙනවා. ඩොනෝමෝර් කොමිසම ආවා; වාර්තාවත් ක්‍රියාත්මක වුණා. සෝල්බරි කොමිසම ආවා; වාර්තාවත් ක්‍රියාත්මක වුණා. ඒ අන්දමට වරින් වර වෙනස් කම් ඇති කර තිබෙනවා. එහෙත් නිදහස ලැබුණාට පසුව අවුරුදු 21 ක් පාලනය කරලත් එහි ප්‍රතිඵල දැකලත් මේ ක්‍රමයෙන් රටේ පොදු ජනතාවට සහනයක් සලසන්නට අවස්ථාව සැලසිය හැකිද නැද්ද කියා සොයා බැලීමට පරීක්ෂණයක් කිරීමටවත් අපේ ස්වදේශික පාලකයින්ට නොසිතීම ජාතිය මේ තත්ත්වයට පත්වීමට ප්‍රධාන හේතුවක් වී තිබෙනවා. ඒ නිසා අවංකවම මේ රටටත් පොදු මහජනතාවටත් සහනයක් සැලසීමට හිතක් තිබෙනවා නම් මේ ආණ්ඩු ක්‍රමය, මේ ව්‍යවස්ථාව—පක්ෂ දේශපාලනය යනාදී කරුණු සියල්ලක්ම කල්පනාවට භාජනය කර මේ ආණ්ඩු ක්‍රමයෙන් සෙතක් සැලසී තිබෙන බව කියා කල්පනා කර බලා, එවැනි යම් සෙතෆ් ඇති වී නැත්නම්—වෙනස් කිරීමට කටයුතු කළ යුතුව තිබෙනවා.

දැනට පවතින පක්ෂ දේශපාලන ක්‍රමය මේ රට දවසින් දවස ආර්ථික වශයෙනුත් අධ්‍යාත්මික වශයෙනුත් පිරිහීමට හේතු වී තිබෙන බව ඕනෑම කෙනෙකුට පෙනී යනවා. මේ ආණ්ඩු ක්‍රමය සංශෝධනය කර ප්‍රජාතන්ත්‍රවාදීව, පොදු මහජනයාගේ කැමැත්ත අනුව ක්‍රියාත්මක වන, ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්, රටට ගැළපෙන යම්කිසි ආණ්ඩු ක්‍රමයක් සකස් කිරීම ගැන මෙවැනි අවස්ථාවක අපේ සිත් යොමු විය යුතු නේද, යන්නයි, මගේ ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1956 දී ගරු බණ්ඩාරනායක අගමැතිතුමා, සිංහල භාෂාව මේ රටේ රාජ්‍ය භාෂාව කරන විට එතුමාගේ සිතේ බලපෑවැත්වූ තවත් වැදගත් අදහස් කීපයක් තිබුණා. එහෙත් ඒ අදහස් සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කිරීමට එතුමාට අවස්ථාවක් ලැබුණේ නැහැ. එතුමාගේ එක අදහසක් නම් ජාතික සමගිය ඇති කිරීමයි. අනෙක් අදහස නම් ආණ්ඩු ක්‍රම සංශෝධනයක් මගින් රට සඳහා ක්‍රමයක් ඇති කර, අද පාලන ක්‍රමයේ තිබෙන අවහිරකම් නැති කර, පොදු මහජන කටයුතු වඩාත් වේගයෙන් කෙරෙන විධියට පාලන ක්‍රමය සකස් කර ගැනීමයි. ඔය අදහස් සියල්ලක්ම එකිනෙකට සම්බන්ධව දිවංගත ගරු අගමැතිතුමාගේ සිතේ ගැබ් වී තිබුණා. ඉංග්‍රීසි ඛජය සහ ඉංග්‍රීසි භාෂාව යටතේ සිංහල, දෙමළ සමගිය යම් තරමකට පැවතුනා නම් සිංහල භාෂාව නමැති බැම්මෙන් බැඳ, සිංහල භාෂාව යටතේත් එම සමගිය ඇති කර ගැනීමයි, එතුමාගේ අදහස වුනේ. ජාතික සමගිය ඇති කර ගන්නවාත් සමගම රටේ පාලන කටයුතු වඩාත් වේගයෙන් සිදු වන විධියට, පරණ ක්‍රමය අයින් කර, ප්‍රාදේශික වශයෙන් වැඩි බලතල ලැබෙන විධියට, වේගවත් අළුත් ක්‍රමයක් සකස් කර ගැනීම එතුමාගේ අදහස වී තිබුණා. අද ඒ සියල්ලක්ම අහෝසි වී තිබෙනවා. ඒ නිසා අද ජාතික සමගියක් නැති බව අපට පැහැදිලිව පෙනී යනවා. පාලන ක්‍රමයේ සංශෝධනයක් නැහැ. වැඩ කෙරෙන්නෙ නැහැ. ඒ නිසා අප බලාපොරොත්තු වන සංවර්ධනය ඇති වී නැහැ; සංවර්ධන කටයුතු සාර්ථක වී නැහැ. ඒ නිසා ආදායම අඩුයි, වියදම වැඩියි. වියදමට වුවමනා තරම් මුදල් ඇත්තෙ නැහැ. ඒ නිසා අපට සෑම විටම එදිනෙදා වියදම සඳහාත් විදේශීය බැංකුවලින්, ලෝක බැංකුවෙන් ණය ගන්නටයි, සිදු වී තිබෙන්නේ. ඒ නිසා දැනට තිබෙන පාලන ක්‍රමය වෙනස් කර ගැනීමට අපට වුවමනා කරනවා. මෙය සෑම දේශ පාලන පක්ෂයකම සිටින අයගේ සිත්වලට තරයේම යොමු විය යුතු දෙයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු 21 ක කාලයක් තිස්සේ රාජාසන කථා 25ක් මේ රටේ ඉදිරිපත් කර තිබෙනවා. මෙතෙක් මේ රටේ පවත්වන ලද රාජාසන කථාවල් 25කින් 15ක්ම ඉදිරිපත් කර තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයෙනුයි. රාජාසන කථාවල් 15ක්ම ඉදිරිපත් කළ එක්සත් ජාතික පක්ෂයට මේ රටේ පොදු මහජනයා ගෙන යන එදිනෙදා ජීවිතය දෙස බලන විට මේ රටේ පොදු මහජනයා වෙත සැලකිය යුතු යහපතක්, සහනයක් නැත්නම් සැනසීමක් ලැබී තිබෙනවාය යනුවෙන් තමන්ගේ හිතට එකඟව නම් කියන්නට පුළුවන්කමක් ඇතැයි මා නම් කියන්නේ නැහැ.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා ඉක්මනින් කථාව අවසන් කරනවා නම් හොඳයි.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

මම තවත් මිනිත්තු දහයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමාට ලැබී තිබෙන මුළු කාලය විනාඩි විස්සයි. ඒ කාලය දැන් අවසන් වෙලා තියෙනවා. ඊළඟට මඩකලපුවේ දෙවැනි මන්ත්‍රීතුමා කථාව පටන් ගන්නට බලාපොරොත්තු වෙනවා. රැස්වීම කල් තැබීමට පෙර එතුමා කථාව පටන් ගන්නවා ඇති.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

මට පැය භාගයක් කල් දුන්නාය කියලා මම හිතනවා.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

විනාඩි 20යි දීලා තියෙන්නේ. ඔට එය වෙනස් කරන්නට බැහැ.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ පොදු මහජනයාගේ යහපත ඇති කිරීම පිණිස සුදුසු ආණ්ඩු ක්‍රමයක් ඇති කර ගැනීමේ මූලික අදහස ක්‍රියාත්මක කර ගැනීමට අවස්ථාවක් අපට මේ 25 වැනි රාජාසන කථාවෙන්වත් ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා. එවැන්නක් ගැන මේ රාජාසන කථාවේ නම් කොහොමටවත් සඳහන් වෙලා නැහැ. රාජාසන කථාවේ සඳහන් වෙලා තිබෙන යම් යම් කාරණාවල් ගැන අප ඉදිරියේ දැන් සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. එහෙත් ඒ සංශෝධන ගැනවත් යමක් කියන්නට තරම් කාලයක් අපට ලැබී නැහැ. මේ රාජාසන කථාවට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

ඒ. ලතීෆ් සින්නලෙබ්බේ මයා. (මඩකලපුව දෙවන මන්ත්‍රී)
(ஜனாப் ஏ. லதீப் சின்னலெப்பை—மட்டக்களப்பு இரண்டாம் அங்கத்தவர்)
(Mr. A. Latiff Sinnalebbe—Second Batticaloa)

I thank you for having afforded me this opportunity. I have been listening very carefully to the speeches made by hon. Members of the Opposition, whether it be from the S. L. F. P. or the Federal Party, or by the Independent Member aligned with the S. L. F. P., and I say that they have been repeating the same old story; the task they have to perform, being in the Opposition Benches, is to oppose anything and everything whether it be right or wrong. That is what I felt they have been doing.

එකල්හි වේලාව අ. භා. 6 වූයෙන් කවයුත්තේ අන්සිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1969 ජූලි 23 වන බදාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 6 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது. 1969, ஜூலை 23, புதன்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

It being 6 P.M., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Wednesday, 23rd July 1969.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 6 පසු කර තුබූයෙන් කෝරක සහ නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 6.1 ට අද දින සභාසම්මතිය අනුව, 1969 ජූලි 23 වන බදාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

කල් තැබීම

நேரம் 6 மணிக்குப் பிந்திவிட்டமையால் குளுக்களின் உப அக்கிராசனர் அவர்கள் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்கள்.

இதன்படி பி. ப. 6.1 மணிக்கு சபை அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 1969, ஜூலை 23, புதன்கிழமை மு. ப. 10 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6 P.M., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House without Question put.*

Adjourned accordingly at 6.1 P.M. until 10 A.M. on Wednesday, 23rd July 1969, pursuant to the Resolution of the House this Day.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

விஞாக்களுக்கு எழுத்துமூல விடைகள்

WRITTEN ANSWERS TO QUESTIONS

මතුරට රෝහලෙන් අතුරුදන් වී මිය ගිය වී. මුත්තුකරුප්පි

மதுரட்ட மருத்துவமனை: வீ. முத்துக்கருப்பி காணாமற் போதலும் மரணமும்

MATURATA HOSPITAL: DISAPPEARANCE AND DEATH OF V. MUTTUKARUPPI

26/69

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)

(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)

(Mr. T. B. M. Herath—Walapane)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1969 ජනවාරි 30 දින මතුරට රජයේ රෝහලට ඇතුලත් කරන ලද වී. මුත්තුකරුප්පි නමැති රෝගී කාන්තාව එදිනම රාත්‍රී අතුරුදන් වූ බව එතුමා දන්නවාද? (ආ) මෙම කාන්තාවගේ මළ සිරුර 1969 මාර්තු 2 දින පදියපැලැල්ල ඔයක තිබී හමුවී ඇති බව එතුමා දන්නේද? (ඉ) මෙම රෝගී කාන්තාව අතුරුදන්වීම සහ ඇයගේ මරණය පිළිබඳව එතුමාට එළිදරව් කළ හැකි කරුණු මොනවාද? (ඊ) මෙතෙක් මේ සිද්ධිය සම්බන්ධව කුමක් කර තිබේද? නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1969 ஜனவரி 30 ஆம் தேதி மதுரட்ட அரசாங்க மருத்துவமனையில் அனுமதிக்கப்பட்ட வீ. முத்துக்கருப்பி என்ற பெண் நோயாளி அன்றிரவே காணாமற் போய்விட்டதை அவர் அறிவாரா? (ஆ) இப்பெண்ணின் சடலம் 1969 மார்ச் 2 ஆம் தேதி பதியபெலல்லே ஆறு ஒன்றினிருந்து கண்டெடுக்கப்பட்டதை அவர் அறிவாரா? (இ) இப் பெண் நோயாளியின் மறைவு சம்பந்தமாகவும் மரணம் சம்பந்தமாகவும் அவர் வெளியிடக் கூடிய தகவல்கள் என்ன? (ஈ) இதுவரை இச்சம்பவம் சம்பந்தமாக என்ன நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது? அன்றேல் ஏன்?

asked the Minister of Health: (a) Is he aware that V. Muttukaruppi, who was admitted to the Maturata Government Hospital on 30.1.1969, was found to be missing that very night? (b) Is he aware that her corpse was discovered in a stream at Padiyapelella on 2.3.1969? (c) What facts pertaining to her disappearance from the hospital and her subsequent death could he state to this House? (d) What steps have so far been taken in regard to this matter? If no steps have been taken, will he state why?

ගරු ඊ. එල්. සේනානායක (සෞඛ්‍ය ඇමති)

(கௌரவ ஈ. எல். சேனநாயக்க—சுகாதார அமைச்சர்)

(The Hon. E. L. Senanayake—Minister of Health)

(අ) ඔව්. (ආ) 1969.3.1 වැනිදා පස්වරු 5 ට පමණ පදියපැලැල්ලේ බෙලිහුල් ඔයේ මළ සිරුරක් දක්නා ලදී. එය මුතු කරුපසි නමැති ලෙඩ කතගේ බවට ඇයගේ සැමියා විසින් පසුව හැඳින ගන්නා ලදී. (ඉ) දරුවකු වැදීමෙන් පසු, ඇති වූ සිහි මද ගතියකින් පෙළෙද්දී මේ ලෙඩ කත ඇයගේ අත දරුවා සමඟ මතුරට රෝහලට බාර දෙනු ලැබූයෙන් ඔවුන්ගේ රැකවරණයට නෑ කතකට ඔවුන් සමඟ නැවතී සිටීමට ඉඩ දෙන ලදී. රෝහලට බාරගත් රෑයේදී, වාට්ටුවේ උපස්ථායිකාව වෙනත් වාට්ටුවක වැඩක යෙදී සිටියදී ලෙඩා තමා සමඟ වාට්ටුවේ නැවතී සිටි නෑයාටවත් නොදැනෙන සේ වාට්ටුවෙන් පිට ගොස් ඇත. මේ පුවත එදා රෑම මතුරට පොලීසියට දන්වන ලදී. 1969.3.1 වැනිදා බෙලිහුල් ඔයේ මළ කඳක් දක්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊ. එල්. සේනානායක]

ලැබී එය මේ ලෙඩාගේම බවට ඇයගෙ සැමියා විසින් හැඳින ගන්නා ලදී. මතු පිටින්වත් ඇතුළෙන්වත් කිසි හානියක් තුවාලයක් නොවූ බව මරණ පරීක්ෂණයේදී දක්නට ලැබිණී. සැහැසිකමකට ගොදුරු වූ බවට කිසි ළකුණක් නොතිබිණී. මරණයට හේතුව විය හැකිව තිබුණේ දියේ ගිලීමෙන් හුස්ම හිරවීමයි. (උ) පැන නොනඟී.

(ஆ) ஆம். (ஆ) 1.3.69 இல் பதியபெலல்லெ, பெலிகுல் ஓயாவில் சடலமொன்று மாலை 5 மணி அளவில் கண்டெடுக்கப்பட்டது. அது, முத்துக்கறுப்பாயினுடைய சடலமென்று அவரது கணவரினால் பின்னர் அடையாளம் கண்டுபிடிக்கப்பட்டது. (இ) பிரசவத்திற்குப் பின்னர் ஏற்பட்ட உளநோய் காரணமாக இந் நோயாளி அவரது சிசுவுடன் மதுரட்ட வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டார். அவர்களது பாதுகாவலுக்காக உறவுப்பெண் ஒருவரும் அவர்களுடன் தங்கியிருக்க அனுமதி அளிக்கப்பட்டார். நோயாளி அனுமதிக்கப்பட்ட அன்றைய இரவு அச்சிகிச்சைச்சாலையில் பணியாற்றும் பெண் உழைஞர் பிறிதொரு சிகிச்சைச்சாலையில் வேலையில் ஈட்பட்டிருந்த பொழுது இந்நோயாளி அவருடன் தங்கி இருக்க அனுமதிக்கப்பட்ட உறவுப் பெண்ணிற்குத் தெரியாமல் சிகிச்சைச்சாலையை விட்டு வெளியேறிவிட்டார். சம்பவம் நடந்த அவ்விரவே இவ்விடயம்பற்றி மதுரட்ட பொலிசுக்கு அறிவிக்கப்பட்டது. 1.3.69 இல் சடலம் கண்டு பிடிக்கப்பட்டு அது இந்நோயாளியினுடைய சடலமென அவரது கணவரினால் அடையாளம் கண்டுபிடிக்கப்பட்டது. மரணவிசாரணை அறிக்கையின் பிரகாரம் புறக்காயங்களோ, உட்காயங்களோ, இருக்கவில்லையென்றும், எத்தகைய தாக்குதலினாலும் காயம் ஏற்பட்டிருக்கலாம் என்பதற்கு சான்றெதுவுமில்லையென்றும், நீரில் மூழ்கியதனால் மூச்சுத்திணறி மரணம் சம்பவித்திருக்கலாமென்றும் அறியமுடிகின்றது. (ஈ) எழுமாட்டாது.

(*a*) Yes. (*b*) A body was found in Belihul-oya, Padiyapelella, on 1.3.69 at about 5.00 P.M. and later identified by the husband as that of Muthukuruppai. (*c*) This patient was admitted with a history of mental imbalance after confinement and was warded at Maturata Hospital along with her infant and for their safety a woman relative was given permission to stay with them. On the night of admission when the female attendant of the ward was attending to some work in another ward, the patient had left the ward without the knowledge of the relative who was allowed to stay with her in the ward. The matter was reported to the Maturata Police that same night. A body was found on 1.3.69 and was identified by the husband as that of this patient and according to the post-mortem report there were no external or internal injuries and no evidence of any form of violence and death could have been due to asphyxia from drowning. (*d*) Does not arise.

කම්කරු විනිශ්චය සභාව, හැටන්

தொழில் முறைமன்றம், ஹற்டன்

LABOUR TRIBUNAL, HATTON

30/69

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)

(Dr. N. M. Perera—Yatiyantota)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) හැටන් ප්‍රදේශයේ කම්කරු විනිශ්චය සභාවට විසඳීමට ඇති නඩු ලැයිස්තුවේ නඩු 1,400 ක් ඇති බව එතුමා දන්නේද? (ආ) මෙය මෙම ප්‍රදේශයේ සියළු කම්කරුවන්ගේ බලවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොසතුටට හේතු වී ඇති බව එතුමා දන්නේ ද? (ඉ) හැටන්හි කම්කරු විනිශ්චය සභාව මේ අන්දමට ක්‍රියාකාරී නොවීමට හේතුව කුමක් ද? (ඊ) මෙම තත්ත්වයට පිළියම් වශයෙන් කවර පියවර ගෙන තිබේද?

தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) ஹட்டன் பகுதியிலுள்ள தொழில் முறைமன்றம் அதன் பட்டியலில் 1,400 வழக்குக்களைக் கொண்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) இது, அந்தப்பகுதியிலுள்ள சகல தொழிலாளர் மத்தியிலும் பெரும் அதிருப்தியை உண்டு பண்ணியிருப்பதை அவர் அறிவாரா? (இ) ஹட்டன் தொழில் முறைமன்றம் செயலாற்றத் தவறியமைக்கான காரணம் யாது? (ஈ) இந்நிலையைத் திருத்த என்ன நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளன?

asked the Minister of Labour and Employment: (*a*) Is he aware that the labour tribunal in Hatton area has on its list 1,400 cases? (*b*) Is he aware that this has created a great deal of dissatisfaction among all workers in the area? (*c*) What is the reason for this failure of the Hatton labour tribunal to function? (*d*) What steps have been taken to remedy the situation?

ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු, රැකී රක්ෂා හා නිවාස ඇමති)

(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில்வசதி அமைச்சர்)

(The Hon. M. H. Mohamed—Minister of Labour and Employment)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) 1969 පෙබරවාරි මස 1 වන දින සිට එම විනිශ්චය සභාවට පත් කරන ලද සභාපතිවරයා අසනීපවීම කරණකොට ගෙන දිගටම රාජකාරියට නොපැමිණ සිටීම මීට හේතුවයි. (ඊ) පූර්ණ කාලීන පදනමක් මත සභාපතිවරයකු පත් කිරීම බලාපොරොත්තුවෙන්, හැටන් කම්කරු විනිශ්චය සභාවේ වැඩ කටයුතු 69.6.1 වන දින සිට තම රාජකාරිවලට අමතරව කිරීම පිණිස නුවරඑළියේ කම්කරු විනිශ්චය සභාවේ සභාපතිවරයාට විධිවිධාන සලසා තිබේ.

(*a*) Yes. (*b*) Yes. (*c*) Due to the continued absence from work, on grounds of illness, of the president who was posted to that tribunal with effect from 1st February 1969. (*d*) Pending the posting of a president on a full-time basis, arrangements have been made from 1.6.69 for the president of the tribunal at Nuwara Eliya to attend to the work of the Hatton tribunal, in addition to his own duties.

ගාලු මහ නගර සභාව: වෛද්‍යාචාර්ය අමාත් සහ ඉස්මයිල් මහතාගේ වැඩ තහනම

காலி மாநகரசபை: டொக்டர் அமாத், ஜனாப் இஸ்மாயில் ஆகியோரின் வேலை இடைநீக்கம்

GALLE MUNICIPAL COUNCIL: INTERDICTION OF DR. AMATH AND MR. ISMAIL

31/69

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

පළාත් පාලන ඇමති හා ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගාලු මහ නගර සභාව, වෛද්‍ය නිළධාරී වෛද්‍යාචාර්ය අමාත් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක ඉස්මයිල් යන මහතුන්ගේ වැඩ තහනම් කර ඇති බව එතුමා දන්නේ ද? (ආ) මෙසේ වැඩ තහනම් කිරීමට හේතු කවරේද? (ඉ) ස්වදේශ කටයුතු ඇමතිතුමා මෙම වැඩ තහනම් කිරීම් නීති විරෝධ බව ප්‍රකාශ කර ඇති බවත්, ගාලු මහ නගර සභාව විසුරුවා හැරිය යුතුයයි ඉල්ලා ඇති බවත් එතුමා දන්නේ ද? (ඊ) මේ සම්බන්ධයෙන් එතුමා කවර පියවරක් ගැනීමට අදහස් කරන්නේ ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

உள்ளூராட்சி அமைச்சரையும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசியுமானவரை கேட்ட வினா: (அ) வைத்திய அதிகாரி டொக்டர் அமாத் பிரசித்த சுகாதார பரிசோதகர் ஜூலுப் இஸ்மாயில் ஆகியோரை காலி மாநகரசபை வேலையிலிருந்து இடை நிறுத்தஞ் செய்துள்ள தென்பதை அறிவாரா? (ஆ) இவ்வித இடைநிறுத்தத்துக்கான காரணமென்ன? (இ) உள்நாட்டு அமைச்சர் இவ்வித இடை நிறுத்தல் சட்ட விரோதமானதெனக் கூறி காலி மாநகரசபையைக் கலைக்கும்படி வேண்டியுள்ளாரென்பதையும் அறிவாரா? (ஈ) இது சம்பந்தமாக எவ்வித நடவடிக்கையை எடுக்க ஆலோசித்துள்ளார்?

asked the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that the Galle Municipal Council has interdicted the Medical Officer, Dr. Amath, and the Public Health Inspector, Mr. Ismail? (*b*) What are the reasons for such interdiction? (*c*) Is he aware that the Minister of Home Affairs has declared such interdictions as illegal and has demanded the dissolution of the Municipal Council of Galle? (*d*) What action does he propose to take in this connection?

ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

(අ) ඔව්. කෙසේ වුවද, පළාත් පාලන සේවා රෙගුලාසිවල, අංක 51 දරණ රෙගුලාසිය මගින් පළාත් පාලන සේවා

கොමිෂන් සභාවට පැවරී ඇති බලතල යටතේ, කොමිෂන් සභාව වැඩ තහනම් කිරීම අනුමත නොකළාය. (ආ) බල මංඩලයේ අතුරු ව්‍යවස්ථා යටතේ නඩු පැවරීම සම්බන්ධයෙන් පණවා ඇති ක්‍රියා මාර්ගයට අනුකූලවීමට අපොහොසත් වී යයි කීම. (ඉ) නොදනිමි. (ඊ) ඉහත සඳහන් (අ) අනුව මෙය පැන නොනගී.

(அ) ஆம். எனினும் உள்ளூராட்சிச் சேவைப் பிரமாணங்களின் 51 ஆம் பிரமாணத்தின்கீழ் உள்ளூராட்சிச்சேவை ஆணைக் குழுவிற்கு வழங்கப்பட்ட தத்துவங்களால் இடைநிறுத்தம் அங்கீகரிக்கப்படவில்லை. (ஆ) சபையின் துணைவிதிகளின்கீழ் வழக்குத் தொடர்வதற்கு இடப்பட்ட நடைமுறைக்கு அமைய ஒழுகத்தவறியமை. (இ) நான் அறியேன். (ஈ) மேலே (அ) இன் கருத்துப்படி இக்கேள்வி எழாது.

(*a*) Yes. However, the interdiction was not approved by the Local Government Service Commission under the powers conferred on it by Regulation 51 of the Local Government Service Regulations. (*b*) Alleged failure to conform to procedure laid down for prosecutions under the council's by-laws. (*c*) I am not aware. (*d*) In view of (*a*) above, this does not arise.

ගණකාධිකාරීන්: සිංහල ප්‍රවීණතාවය

கணக்காளர்: சிங்களத் தேர்ச்சி

ACCOUNTANTS: PROFICIENCY IN SINHALA

23/69

ආර්. ජී. සේනානායක මයා. (දඹදෙණිය)

(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)

(Mr. R. G. Senanayake—Dambadeniya)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) සිංහල ප්‍රවීණතාවයක් නොමැති ගණකාධිකාරීන් 80% ක් පමණ සිටින බවත්; (ii) 1968 වර්ෂයේදී ගණකාධි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාරීන් බඳවා ගැනීම සඳහා පවත්වන ලද විභාගයේදී 31 දෙනෙකු සේවයට බඳවා ගත් බවත්, ඉන් 24 දෙනෙකු පමණ දුවිඩ නිළධාරීන් බවත්; (iii) 1969 මුල් භාගයේදී ගණකාධිකාරීන් බඳවා ගැනීමට විභාගයක් පැවැත්වීමට නියමිතව තිබිය දීත් 1968 පැවති විභාගයේ ප්‍රතිඵල අනුව දුවිඩ නායකයින්ගේ ඉල්ලීම පරිදි භාණ්ඩාගාරය විසින් තවත් 11 දෙනෙකු බඳවා ගැනීමට යත්න දරන බවත්; (iv) සිංහලය රාජ්‍ය භාෂාව වී තිබියදීත් ගණකාධිකාරීන් බඳවා ගැනීමේදී සිංහල ප්‍රවීණතාවය ගැන කිසිදු තැකීමක් නොකර ඉහත කී ගණකාධිකාරීන් බඳවා ගෙන ඇති බවත්; එතුමා දන්නවාද? (ආ) ගණකාධිකාරී සේවයේ 80% කට වඩා සිංහල ප්‍රවීණතාවය නොමැති නිළධාරීන් සිටින නිසා කාර්යාල කටයුතු රාජ්‍යභාෂා ප්‍රතිපත්තියට පටහැනිව කිරීමට සිදුවන බවත්, එම නිසාම භාෂා පරිවර්තකයින් ආදීන් අමතරව සේවයට යෙදීමට සිදුවන බවත් සලකා මෙම තත්ත්වය මග හැර වීමට එතුමා ක්‍රියා මාර්ගයක් ගන්නේද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) சிங்களத் சேர்ச்சி இல்லாமல் 80% அளவு கணக்காளர் இருக்கிறார்களென்பதையும், (ii) 1968 ஆம் ஆண்டில் கணக்காளர்களைச் சேர்த்துக் கொள்வதற்காக நடத்தப்பெற்ற பரீட்சையில் 31 பேர் சேவையில் சேர்க்கப்பட்டதையும், இவர்களுள் 24 பேர் தமிழ் உத்தியோகத்தரென்பதையும், (iii) 1969 முற்பகுதியில் கணக்காளரைச் சேர்த்துக் கொள்வதற்குப் பரீட்சையை நடத்தவிருந்தும் 1968 இல் நடைபெற்ற பரீட்சைப் பெறுபேறின்படி தமிழ்த் தலைவர்களின் கோரிக்கைக்கமையத் திறைசேரி மேலும் 11 பேரைச் சேர்த்துக் கொள்ள முயல்வதையும், (iv) சிங்களம் அரச கருமமொழியாக இருந்தபோதிலும் கணக்காளர்களைச் சேர்க்கும்போது சிங்கள அறிவு பற்றி எவ்விதமும் கவனியாது மேற்கூறிய கணக்காளர்களைச் சேர்த்ததையும் அவர் அறிவாரா? (ஆ) கணக்காளர் சேவையில் 80 வீதத்திற்கு அதிகமான சிங்களத் தேர்ச்சியற்ற உத்தியோகத்தர் இருப்பதனால் அலுவலகக் கருமங்களை அரசகருமமொழிக் கொள்கைக்கு முரணாகச் செய்ய வேண்டி இருப்பதையும், எனவே மொழி பெயர்ப்பாளர் போன்றவர்களை மேலதிகமாகச் சேவையிலீடுபடுத்த நேரிடுவதையும் கவனித்து இந்நிலைமையைச் சீர்ப்படுத்துவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance: (*a*) Is he aware that (i) about 80 per cent of the accountants are not proficient in Sinhala; (ii) 31 persons were employed on the basis of the examination conducted in 1968 for the recruitment of accountants, and that 24 of them are Tamil officers; (iii) although an examination for the recruitment of accountants is due to be held in early 1969, an attempt is being made by the Treasury, at the request of Tamil leaders, to recruit 11 more accountants on the results of the examination of 1968; (iv) although Sinhala is the official language, the accountants referred to have been appointed without any consideration of their proficiency in Sinhala? (*b*) Considering the fact that, as more than 80 per cent of the accountants are not proficient in Sinhala, official business will have to be conducted in a manner that contravenes the official language policy and that additional translators, etc., will have to be employed, will he take steps to remedy this situation? (*c*) If not, why?

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

(අ) (1) මෙය සාවද්‍යය ය. සියයට 54 වැනි සංඛ්‍යාවකට සිංහල ප්‍රවීණත්වය තිබේ. (ii) මෙසේ පත් කරන ලද 31

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු යූ. බී. වන්නිනායක]

දෙනාගෙන් 23 දෙනෙක් ද්‍රවිඩ නිලධාරීහු වෙති. මෙම ද්‍රවිඩ නිලධාරීන් අතුරෙන් 5 දෙනෙකුට සිංහල ප්‍රවීණත්වය තිබේ. (iii) එවැනි පත්වීම් දීමට අදහස් කර නැත. (iv) සඳහන් කර ඇති ගණකාධිකාරීවරු ආදි ප්‍රවේශක නිලධාරීන් වෙති. එබැවින් ගණකාධිකාරී සේවයට පත්වීමේ පූර්ව අවශ්‍යතාවක් වශයෙන් සිංහල ප්‍රවීණත්වයක් තිබීම ඔවුන්ට අවශ්‍ය නොවේ. (ආ) පැන නොනඟී. (ඉ) පැන නොනඟී.

(அ) (i) இது தவறு. 54 சத வீதற்குமதிக மானோர் சிங்களத்தில் தேர்ச்சியுடையவராவர். (ii) அவ்வாறு நியமிக்கப்பட்ட 31 பேரில் 23 பேர் தமிழ் உத்தியோகத்தர்கள். அவர்களில் 5 பேர் சிங்களத்தில் தேர்ச்சியுடையவராவர். (iii) அவ்வாறு நியமனஞ் செய்வதற்கு எண்ணப்படவில்லை. (iv) குறிப்பிடப்பட்டுள்ள கணக்காளர்கள் முன்னர் சேர்ந்த உத்தியோகத்தர்களாவர். ஆதலின் கணக்காளர் சேவைக்கு நியமிக்கப்படுவதற்கு வேண்டிய ஒரு முதற்றேவையாக அவர்களுக்குச் சிங்களத் தேர்ச்சி தேவையில்லை. (ஆ) இதற்கிடமில்லை. (இ) இதற்கிடமில்லை.

(*a*) (i) This is not correct. Over 54 per cent are proficient in Sinhala; (ii) of the 31 persons so appointed, 23 are Tamil officers, of whom 5 are proficient in Sinhala; (iii) no such appointments are contemplated; (iv) the accountants referred to are old-entrant officers. They are, therefore, not required to have proficiency in Sinhala as a prerequisite for appointment to the Accountants' Service. (*b*) Does not arise. (*c*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org